# බස්නාහිර පළාතේ පළාත් සභාව

மேல் மாகாண மாகாண சபை

**WESTERN PROVINCE PROVINCIAL COUNCIL**

**2017 මාර්තු 21 වන අඟහරුවාදා**

2017 பங்குனி 21 செவ்வாய்க் கிழமை

Tuesday 21st March 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல 204 .இல ,மாவத்தை கொப்பேகடுவ டென்சில் ,ஜயவர்த்தனபுர ஸ்ரீ ,இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.31 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.31 க்கு சபை கூடியது

*The Provincial Council met at 09.31 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන

ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහා 2017.03.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු ලයනල් ජයසිංහ මන්ත්‍රීතුමා වෙනුවට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාවත්,*

*සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහා 2007.03.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු ජගත් අංගගේ මන්ත්‍රීමා වෙනුවට ලයනල් ජයසිංහ ගරු මන්ත්‍රීතුමාවත් මවිසින් නම් කරනු ලැබූ බව දැනුම් දෙනවා.*

*ii*

*බස්නාහිර පළාත් සභාවේ මුල් පළාත් සභාවේ සිට මන්ත්‍රීවරයෙකු වශයෙන් සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයෙකු වශයෙන් කටයුතු කරපු ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ එඩ්වඩ් සිල්වා හිටපු ගරු මන්ත්‍රීතුමා පෙරේදා රාත්‍රියේ අභාවප්‍රාප්ත වුණා. එතුමාගේ ආදාහන උත්සවය බදාදා සවස 3.30 ට රාගම කතෝලික දේවස්ථානයේ සිදු කරන බව මම ඉතාමත්ම කනගාටුවෙන් මෙම සභාවට දැනුම් දෙනවා.*

*ඒ වාගේම මා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේත්, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත් ශෝකය හා කනගාටුව ඒ පවුලේ ඥාතීන්ට පුද කර සිටිනවා.*

# කාරක සභා වාර්තා

COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.03.08 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්

PETITIONS

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. මීරිගම, විල්වත්ත, ගොඩැල්ල වත්ත, අංක 60 හි පදිංචි එච්.ආර්. කමල් හරිස්චන්ද්‍ර පීරිස් යන අයගේ පෙත්සම සහ,

ii. වේයන්ගොඩ, ගල්ගමුව, නිදහස් මාවත, අංක 119/26 හි පදිංචි කේ.ඒ.එන්. කපුරුබණ්ඩාර යන අයගේ පෙත්සම.

**ගරු නන්දන පත්මකුමාර**

Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, දර්ගා නගරය, කොස්වත්තගොඩ, කේ.කේ.එල්. අමරවංශ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. අළුබෝමුල්ල, පමුණුගම, පිංකොටුව හන්දිය, අංක 299 හි පදිංචි බී. නෙවිල් පෙරේරා යන අයගේ පෙත්සම සහ,

ii. අළුබෝමුල්ල, අරුක්ගොඩ පාර, ග්‍රීන්වැලි ගාර්ඩන්, අංක 113/2 හි පදිංචි ටී.සී.එස්. ප්‍රනාන්දු යන අයගේ පෙත්සම.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. මහරගම, වීදිය බණ්ඩාර පෙදෙස, අංක 14 හි පදිංචි ඉන්ද්‍රා මාධව යන අයගේ පෙත්සම,

ii. ගල්කිස්ස, 6 වන පටුමග, කුසුම් නිවාස, අංක 68/39 හි පදිංචි සිත්මා නිහාරා යන අයගේ පෙත්සම සහ,

iii. හෝමාගම, මාලපල්ල, අංක 47 හි පදිංචි යුරේෂා යසමාලි ජයසිංහ යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 02 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමාගේමයි. එම ප්‍රශ්නයත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**02.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/23)**

අ. බප/කළු/කළුතර ඥානෝදය විද්‍යාලයේ 2017 වර්ෂයේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා ලද මුළු ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඇ. මේ වන විට ඇතුළත් කර ගෙන ඇති ළමුන් ගණන එක් එක් ගණයට අනුව කීයද?

ඈ. ඇතුළත් කර ගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. එම පුරප්පාඩු සඳහා මේ වන විට දරුවන් ඇතුළත් කළ ගණන කොපමණද?

ඌ. පාසලට ඇතුළත් කර නොගත් පොරොත්තු ලේඛනයේ සිටින එක් එක් ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. පන්ති 04 යි.

ආ. ළමුන් 156 යි

ඇ.

| | | |
|---|---|---|
| පාසලට ආසන්න | - | 71 |
| ආදි ශිෂ්‍ය | - | 34 |
| සහෝදර | - | 20 |
| අධ්‍යාපන | - | 07 |
| ස්ථාන මාරු | - | 01 |
| විදේශ | - | 01 |
| ක්‍රියාන්විත | - | 18 |
| **එකතුව** | **-** | **152** |

ඈ. ඔව්. (ඇමුණුම 01)[1]

ඉ. ළමුන් 04 යි.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 20 යි.
ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන් 06 යි.

උ. ආරක්ෂක අංශ සඳහා - 18
ස්ථාන මාරු සඳහා - 01

ඌ. ඔව්. (ඇමුණුම 02)[2]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි. ගරු ඇමතිතුමා සඳහන් කළා ආරක්ෂක අංශය සඳහා ඇතුළත් කළ හැකි දරුවන් සංඛ්‍යාව 20 යි කියලා. මේ වන කොට ඒ දරුවන් 20 දෙනාම ඒ පාසලට ඇතුළත් කර තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

18 යි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඒ 18 දෙනාම මේ වන කොට ඇතුළත් කර තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් මේ දීලා තිබෙන උත්තරේ තමයි ඇත්ත උත්තරය. මොකක්ද ප්‍රශ්නය තිබෙන්නේ?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මට පැහැදිලි නැහැ, ඔබතුමා කියපු උත්තරය. 18 දෙනා ඇතුළත් කළාද කියලා මම ඇහුවේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. 18 දෙනෙක්.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මේ වන කොට ඇතුළත් කරලා අවසන් කරලා තිබෙනවා නේද?

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. අවසන් කිරිල්ලයි ඇතුළත් කිරිල්ලයි වචන දෙකක් නොවෙයි. එකයි. ඇතුළත් කළා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමාට පුළුවන්ද ඒ ඇතුළත් කරපු නාම ලේඛනය අපට ලබා දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මේකේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඇමුණුම්වල තිබෙනවා. ඔබතුමාට ඒ ටික බලාගන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, එතුමාගේ අවසරය පරිදි මට තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. දැන් මේකේ අවසාන වශයෙන් ඇමතිතුමා මේ වන තෙක්ම පන්තියක ළමුන් ගණන නිශ්චිත කරලා නැද්ද? මොකද, දැන් අප්‍රේල් මාසෙටත් යන්න තිබෙන්නේ. ඒ නිසා අවසාන මොහොතේත් ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, චක්‍රලේඛය අනුව පන්තියක ළමුන් ගණන නිශ්චිත වෙලා තිබෙනවා නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒක තමයි. කීයද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

39 යි නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතකොට 39 ට ඉහළ එකක්වත් ගන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. එහෙම ගන්නේ නැහැයි කියන්න බැහැ. මේ චක්‍රලේඛයේ තිබෙන -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි අපි කියන්නේ. දැන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බෙල්ලේ වැල දා ගන්න ගියොත් එකක් දෙකක් ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මට විවාදයකට යන්න දෙන්න බැහැ. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මම ඒකට ගරු මන්ත්‍රීතුමාට උත්තරයක් දෙන්නම්. විනාඩියක්. දැන් මෙහෙම නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා පැහැදිලි උත්තරයක් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම පැහැදිලි උත්තරයක් දෙන්නම්. ගරු සභාපතිතුමනි, දැනට අපි හමුවේ තිබෙන ගැටළුවක් තමයි, මේ ආසන්නතාවය කියන කාරණාව. ඒ කියන්නේ මේ චක්‍රලේඛයේ කුමන දේ සඳහන් වෙලා තිබුණත් පාසල ආශ්‍රිත, වැට අයිනේ, ගේට්ටුව අයිනේ, මීටර් කිහිපයක් ඉස්සරහා ආසන්නයේ ඉන්න දරුවෝ ඒ දරුවන්ගේ ආච්චි, මුත්තලා, සීයලාගේ කාලයේ සිටම පදිංචි අය. ඒවාට ප්‍රවේණි ඉඩම් කියන්නේ. සමහර ඉඩම් තිබෙනවා LL බලපත්‍ර, ES, ජය භූමි, ස්වර්ණ භූමි. ඒ දරුවෝ

පැහැදිලිව ඉල්ලා සිටිනවා, තමන්ගේ පාසලේ අයිතිය. ඒ නිසා මම මේ දවස්වල ලඟි ලඟියේ - දැන් ලැබෙමින් තිබෙනවා. මම හිතන්නේ අද හවස් වන කොට ඔක්කොම අවසන් වෙනවා. ඒ දරුවන්ගේ අයිතිය මම ප්‍රාදේශීය ලේකම්වරු හරහා සැබවින්ම ඉල්ලා සිටිනවා. මොකද, ඒ දරුවන්ට ඒ පාසල දීම, අධ්‍යාපනික වශයෙන් දරුවන්ගේ අයිතිය ආරක්ෂා කර දීම මගේ වගකීමක්. චක්‍රලේඛය ආරක්ෂා කිරීම චක්‍රලේඛය හදපු අයගේ වගකීමක්. හැබැයි. මේ චක්‍රලේඛයේ ප්‍රශ්න තිබෙනවා කියලා අපි ඕනෑම තැනක තර්ක කරන්න සූදානම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මීළඟට අංක 03 යටතේ ඇති ප්‍රශ්නය මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

## 03.

**මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/24)**

අ. බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වී තිබේද?

ආ. එම තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබේද? ඒ කවදාද?

ඇ. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?

ඈ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන්ගේ නම් හා ඔවුන් ලබා ගත් ලකුණු මෙම සභාවට හෙළි කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

ඉ. එම ලකුණු අනුව වඩාත් සුදුසුම අයදුම්කරු අදාළ තනතුරට පත් නොකරන්නේ කුමන කාරණාවක් නිසාද?

ඊ. මෙම තනතුර සඳහා බඳවා ගැනීමට නැවත වතාවක් පුවත්පත් දැන්වීමක් පළ කර තිබේද?

උ. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුස්සෙකු තෝරා තිබියදී නැවත වතාවක් පුවත්පත් දැන්වීමක් පළ කළේ මන්ද?

ඌ. පළමු පරීක්ෂණයෙන් තේරී පත් වූ අයදුම්කරු අදාළ තනතුරට කඩිනමින් පත් කරන්නේද? නොඑසේ නම් මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ඔව්. 2016 අගෝස්තු 08.

ඇ. ඔව්. (ඇමුණුම 01) - බලන්න.

1. ජී.ඩී. ගාමිණී විජේනායක මයා - සභාපති, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය.
2. එම්. අශෝක පීරිස් මයා - පරිපාලන නිලධාරී, අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය. (බ.ප.)
3. එච්.එම්.බී. චතුර කුමාර මයා - සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
4. සෝම හෙට්ටිආරච්චි මයා - පාලන මණ්ඩල සාමාජික, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය

ඈ. ඔව්.

| අංකය | නම | ලකුණු | වෙනත් කරුණු |
|---|---|---|---|
| 1. | එන්.කේ. හේවාමාන මිය | 33 | පළපුරුද්ද සනාථ කර නොමැත. |
| 2. | වී.පී.එන්. පැතුම් වීරසිංහ මයා | 28 | උපාධිය සනාථ කිරීමට ලිපි නොමැත. |
| 3. | වී.ඒ. සුජීවා වර්ණසූරිය මිය | 0 | අදාළ උපාධි සුදුසුකම් නොමැත. |
| 4. | ආර්.ඒ. දීප්ති විජේතුංග මයා | 0 | වයස ඉක්මවා ඇත. |
| 5. | සී.එම්. විජේපාලන දිසානායක මයා | 42 | පළපුරුද්ද සනාථ කර නොමැත. |
| 6. | ඩබ්ලිව්.ඒ.පී. ලක්මාල් මයා | 0 | සුදුසුකම් සනාථ කළ නොහැක. |
| 7. | චමින්ද අනුරුද්ධ විදානගමච්චි මයා | 0 | අදාළ උපාධි පහසුකම් නොමැත. |
| 8. | ඊ.ඒ.අයි. රුවන්තිකා එදිරිසූරිය මෙය | 0 | මූලික සුදුසුකම් නොමැත. |
| 9. | පී.එම්. ප්‍රසාද් මංජුල කරුණාරත්න මයා | 19 | වසර 03 ක පළපුරුද්දක් නොමැත. |
| 10. | එච්. හර්ෂාන් පෙරේරා මයා | 24 | අතිරේක පළපුරුද්ද හා අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා ගෙන නැත. |
| 11. | මහින්ද රූබසිංහ මයා | 0 | මූලික සුදුසුකම් නොමැත. |

ඉ. කිසිදු අයදුම්කරුවෙකු සුදුසුකම් ලබා නොමැති නිසා.

ඊ. ඔව්.

උ. පළමු පරීක්ෂණයෙන් කිසිදු අයදුම්කරුවෙකු සුදුසුකම් ලබා නොතිබීම නිසා.

ඌ. අදාළ නොවේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පළමු පරීක්ෂණයෙන් කවුරුවත් තේරිලා නැත්නම් ඊළඟට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? මේ තනතුර තවමත් පුරප්පාඩු විධියට තියනවාද? නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවාද? නැවත සම්මුඛ පරීක්ෂණයක් හරහා සුදුසු කෙනෙක් තෝරා ගන්න කටයුතු කරනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ සඳහා මේ ප්‍රශ්නය මම ගියවර මේ සභාවේ සාකච්ඡාවෙන් පසු මගේ අමාත්‍යාංශ ලේකම්තුමාට ඉදිරිපත් කළා. අපි කඩිනම් පියවරකට යනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම එක ප්‍රශ්නයයි ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නය අහන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කිසිම කෙනෙක් සුදුසුකම් ලබලා නැහැයි කියන කාරණය ගරු අමාත්‍යතුමා මේ සභාවට පැහැදිලි කරන්නේ කොහොමද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලි කරන්නේ, මේකේ ඇමුණුම් තිබෙනවා. ගරු සභාපතිතුමාට මම මේ ඇමුණුම් ඉදිරිපත් කරනවා. ඉතාමත් පැහැදිලිව ඔවුන් තේරී පත් නොවූ ආකාරය පැහැදිලිව විස්තරාත්මකව සඳහන් කරලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, දැන් ඇමුණුම් හරහා අපට අතුරු ප්‍රශ්නයක් අහගන්න පුළුවන්කමක් නැහැ. ගරු ඇමතිතුමා ඇමුණුම් ඉදිරිපත් කරනවා. ඒක මම දන්නේ නැහැ න්‍යාය පත්‍රය -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරලා රීති සංශෝධනයකට යන්න ඕනෑ. ඔබතුමා හිටපු ගරු ඇමතිවරයෙක්. පරණ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා දන්නවා මේ රීති සංග්‍රහය ගැන.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැන්සාඩ් එක හරහා එන්න හුඟක් කල් යනවා. දැන් හැන්සාඩ් එක හරහා අපට ලබන සභා වාරයට ආවාට පස්සේ නැවත අතුරු ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙනවාද? හැන්සාඩ් එක හරහා අපට මේ ඇමුණුම් ලැබුණාට පස්සේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට දැන් මේ ප්‍රශ්නත් එක්ක අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

තුනක් ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැත්නම් ඔබතුමාට ඊළඟ සභාවට ඒ අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්. එතුමා උත්තර දෙන්න -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ ඇමුණුම් හැන්සාඩ් එකට දානවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දානවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරන්න ඕනෑ. සභාවේ ඉන්න කොයි මන්ත්‍රීතුමාටත් එක සමාන අයිතිවාසිකම් තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා පළපුරුදු, ජ්‍යෙෂ්ට සභාපතිවරයෙක්. විශේෂ අවස්ථාවල් නොදේවි කියලා මම විශ්වාස කරනවා. අතුරු ප්‍රශ්න මොනවාටද අහන්නේ. රීති සංග්‍රහය හොඳට කියවලා එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, අපි දැන් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දීපු ස්වභාවයෙන්ම තේරෙනවා එතැන වංචාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා. ගරු ඇමතිතුමා මෙපමණ වේගයෙන් එක ප්‍රශ්නයකටවත් උත්තර දුන්නේ නැහැ. ඒ දීපු වේගෙන්ම තේරෙනවා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඉතින් ඇමුණුම් හරහා දුන්නාම අපට ප්‍රශ්න අහගන්න බැහැ. අපට ඕනෑ ප්‍රශ්නය මේකේදී කියන්න. හරි උත්තරය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම 36(1) යටතේ කථා කරන්නේ. මොනවාද කියන්නේ? වංචාවක් සිදු වෙලා. කොහේද වංචාවක්. මේ තිබෙන්නේ, තොරතුරු. ගරු සභාපතිතුමාට ඉතාම ගෞරවයෙන් අපි මේ තොරතුරු සභාගත [3] කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාගත කරන්න කෝ. මම බලන්නම් ඒක.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ අමතර ප්‍රශ්න අහන්න දෙන්න බැහැ. රීතිය හොඳට කියවලා එන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ තොරතුරු සියල්ල හැන්සාඩ් වාර්තාවට දාන්න කියලා.

[3] පිළිතුර අවසානයේ පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඒ පිළිතුර මම දැන් දෙන්නම්. ඔබතුමා හවස අහන්න. සභාව කල් තබන අවස්ථාවේදී ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ රීති පොතේ යම් යම් අඩුපාඩු තිබෙනවා. අපි දැන් අලුතෙන් එම රීති පොත සකස් කරමින් යනවා. ඒ නිසා ඔය වාගේ ප්‍රායෝගික ගැටළු ඉදිරියේදී නැති වෙන්න පුළුවන්. ඒ කෙසේ වෙතත් මම එතුමාගේ සභාගත කරපු ඒ වාර්තාව ඔබතුමාට ලැබෙන්නට සලස්වන්නම්. සභාව කල් තබන අවස්ථාවේදී අතුරු ප්‍රශ්නයක් වශයෙන් අහන්න පුළුවන්. ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ කාරණාවේත් ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමාට ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දැන් සභාව කල් තබන වෙලාවේ ප්‍රශ්න අහනවා කිව්වාම, ගරු මහ ඇමතිතුමාගේ සිට සියලුම මැති ඇමතිවරුන්ට සමහර දවස්වල ඉතාම සුවිශේෂී කාරණා තිබෙනවා. සමහර පාසල්වල ප්‍රශ්න තිබෙනවා. මම කියන්නේ, ඒ අවස්ථාව රීති සංශෝධනයකින් හරි අපි උත්තර දෙන අවස්ථාවේදී -ඔබතුමා මම හිතන්නේ නිවැරදි කළොත් හොඳයි. නැත්නම් ඊට පස්සේ කියයි, සභාවේ හිටියේ නැහැ. ප්‍රශ්නය යොමු කළාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැත්නම් ඔබතුමාට ඊළඟ සභාවේදී උත්තර දෙන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. අමාත්‍යවරුන්ගේ නිවේදන/අමාත්‍යාංශ ප්‍රකාශ න්‍යාය පත්‍රයේ තිබෙනවා නේ? ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. එතකොට අපට චෝදනාවක් -

ෆෙළේ ජූ කා 02

## බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය

අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ගොනු අංක 1/1/4/236 හා 2013/09/17 දිනැති බඳවා ගැනීමේ පටිපාටි අනුමැතිය අනුව 2016-08-08 දින පවත්වන ලදි

| අනු අංකය | නම | ලිපිනය | උපන් දිනය සහ වයස | විවාහක අවිවාහක බව | ජාතික හැඳුනුම්පත් අංකය | බස්නාහිර පළාත තුල වසර 03ක පදිංචිය | උපාධි සුදුසුකම | වසර 03ක පළපුරුද්ද | සම්මුඛ පරීක්ෂණ ලකුණු: අතිරේක අධ්‍යාපන සුදුසුකම් (30) | අතිරේක පළපුරුද්ද (30) | අනෙකුත් කුසලතා/කාර්ය සාධනය (15) | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා (25): පෞරුෂය (10) | කුසලතා (15) | එකතුව | නිර්දේශය පත්වීම ලබා දීම නිර්දේශ කරයි/නොකරයි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | එන් .කේ.හේවාමන මිය | අංක467/1,මාප්පෙ උතුර,පිළියන්දල | 24/12/1981( 35) | විවාහක | ..... 8/8592829V | ඇත. | වාණිජවේදී උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | වෙල්මේජ් ආයතනයේ සහකාර කළමනාකාරවරයෙකු වශයෙන් ( ප්‍රසම්පාදන)සේවය කරයි | 15 | – | – | 07 | 11 | 33 | |
| 2 | වී.පී.එන් .පැතුම් විරසිංහ මයා | අංක 119/1,දොරොව්ව,දිවුල්දෙණිය | 15/09/1984( 32) | අවිවාහක | 842594987v | ඇත. | සංගීත කලාවේදී උපාධිය ඉන්දිරා කලා සංගීත් විශ්ව විද්‍යාලය හා ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | සංවර්ධන නිලධාරි 2013 සිට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 10. | – | 05 | 06 | 07 | 28 | |
| 3 | ඩී.ජී.සුජීවා වර්ණසූරිය මිය | අංක 5 A / 25 පිරිපහදු නිවාස,මාකොළ දකුණ,මාකොළ | 03/09/1967 (49) | විවාහක | 677470240v | ඇත. | ශාස්ත්‍රවේදී උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය/ ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්ව විද්‍යාලය | • 1999 සිට 2001 දක්වා වයඹ පළාත් සභාවේ සංස්කෘතික නිලධාරි. • 2001 සිට මේ දක්වා බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික නිලධාරි | | | | | | | |

(62)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | ආර්.ඒ.දිප්ති විජේතුංග මයා | අංක 221/2,මාකොල උතුර,මාකොල | 29/06/1967 (49) | විවාහක | 671810180v | ඇත. | ශ්‍රම අධ්‍යනාවේදී විශේෂ උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය/ ජන සන්නිවේදනය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්ව විද්‍යාලය | • 1990 සිට බස්නාහිර පළාත් සභාවේ ප්‍රවෘත්ති නිලධාරීවරයා ලෙස වසර 26 කටයුතු කර ඇත. | | | | | | | |
| 5 | සී.එම්.විජේපාල දිසානායක මයා | නො.194/24 විද්‍යාරාජ මාවත,හෝකන්දර | 01/0[illegible]/1972 (44) | විවාහක | 722144201v | ඇත. | ව්‍යාපාර අධ්‍යනය උපාධිය රුහුණ විශ්ව විද්‍යාලය )/ ජනමාද්‍ය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | •ලංකා පුවත්පතෙහි කළමනාකරණ අධ්‍යක්ෂක වශයෙන් 2002 සිට 2006 දක්වා සේවය කර ඇත. • වී එන්.එම් රේඩියෝ හි 2006 සිට 2012 දක්වා කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස සේවය කර ඇත . • වර්තමානයේ ඇග්‍රෝමැටික් (පුද්) ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස සේවය කරයි. | 20 | - | 05 | 07 | 10 | 42 | |
| 6 | ඩබ්.ඒ.පී.ලක්මාලී මයා | ගල්අමුණපාර,මාක ලන්දාව,වලල්ලාවිට ,මතුගම | 18/05/1985 (31) | විවාහක | 851390375v | ඇත. | මූල්‍ය කළමනාකරණය පිලිබඳ විශේෂ උපාධිය ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය | •සහකාර ගණකාධිකාරී වරයෙකු වශයෙන් සේවය කරයි 2013 සිට මේ දක්වා | | | | | | | |
| 7 | චමින්ද අනුරාධ විදානගමච්චි මයා | 26/10,විමලවිහාර පාර,නාවල,රාජගිරි ය. | 17/09/1971 (45) | | ~~881840263v~~ | ඇත. | ශ්‍රම අධ්‍යාපනය පිලිබඳ උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | • හයිටෙක් කොම්පියුටර් ආයතනය කලමනාකාර වශයෙන් සේවය කර ඇත.2008 -2012 සහකාර අධ්‍යක්ෂක වශයෙන් ජාතික තරුණ සේවා සභාවේ 2014 සිට | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | ඊ.ඒ.අයි.රුවන්තිකා එදිරිසූරිය මෙය | 190/1/D,නාගහහේන වත්ත,පිටුවල්ගොඩ, යක්කල | 10/10/1986 (30) | ........ | ........ 867843400V | ඇත. | කලාවේදී උපාධිය කැලණිය විශ්ව විද්‍යාලය | • ආචාර්ය වරයෙකු වශයෙන් කොරියානු භාෂා මධ්‍යස්ථානයේ සේවය කර ඇත. • භාෂා පරිවර්තක වශයෙන් කොරියානු තානාපති කාර්යාලයේ සේවය කර ඇත. | | | | | | | | |
| 9 | පී.එම්.ප්‍රසාද් මංජුල කරුණාරත්න මයා | 41/8/A,දෙවන පටුමග,රත්නායක මාවත,තලංගම,පැල වත්ත | 27/12/1986 (30) | | 863621070v | ඇත. | ප්‍රසාංගික කලාවේදී විශේෂ උපාධිය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | • නර්තන ආචාර්යවරයෙකු වශයෙන් ලයිසියම් ජාත්‍යාන්තර පාසලේ සේවය කර ඇත.2011 - 2013. • සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ භාහිර කථිකාචාර්ය වරයෙකු වශයෙන් 2014- 2015 | — | — | | 5 | 7 | 7 | 19 | |
| 10 | එච්.හර්ෂාන් පෙරේරා මයා | 97/28,සේනාසන පාර,කොතලාවල,බණ්ඩාරගම | 29/04/1982 (34) | ..... | ..... 821200504V | ඇත. | ප්‍රාසාංගික කලාවේදී උපාධිය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | •එස් $ එස් පෞද්ගලික ආයතනයේ පිරිස් කළමනාකරු වශයෙන් 2012 වසරේ සිට 2016 වසර දක්වා සේවය කර ඇත. | — | — | | 10 | 6 | 8 | 24 | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | මහින්ද රුබසිංහ මයා | 706/02/01,කුලසේන මාවත,තලවතුගොඩ ,කොට්ටාව | 04/03/1974 (42) | විවාහක | 740643550v | | කලාවේදී විශේෂ උපාධිය දෙවනපෙළ ඉහළ, කොළඹ විශ්ව විද්‍යාලය / ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්ව විද්‍යාලය | •2005 ජූලි මස සිට වර්තමානය දක්වා ප්‍රවෘත්ති කළමනාකාර හා ප්‍රවෘත්ති සංස්කරණ නිලධාරියා වශයෙන් ඇසට රේඩියෝ ආයතනයේ සේවය කරයි. • රේඩියෝ ජනමාධ්‍ය ආයතන කිහිපයක සේවය කර ඇත 1995 සිට. • භාහිර කථිකාචාර්ය වරයෙකු වශයෙන් ජාතික තරුණ සේවා සභාවේ/ජනමාධ්‍ය කළමනාකරණ ආයතනයේ සේවය කරයි. | | | | | | | | |

සභාපති
අත්සන
නම:-ජී.ඩී.ගාමිණී විජේනායක මයා
තනතුර :- සභාපති
බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය
මුද්‍රව
දිනය 2016.08.08.

සාමාජික 01
අත්සන
නම:-එස්.ඩී.විජයසේන මයා
තනතුර :- ලේකම් අධ්‍යාපන හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය බ.ප.
මුද්‍රව
දිනය 16/08/08

සාමාජික 02
අත්සන
H.M.B.
නම:-
තනතුර :- ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය බ.ප.
මුද්‍රව
දිනය 2016/08/08

සාමාජික 03
අත්සන
නම:-
තනතුර :- පාලන මණ්ඩල අධිකාරී සමාජික
බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය
මුද්‍රව
දිනය

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟ ප්‍රශ්නය මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගේ මිත්‍ර මහින්ද ජයසිංග ගරු මන්ත්‍රීතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මිත්‍ර කියලා ගොඩ දා ගන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. එතුමායි මමයි හැමදාම මිත්‍රයි. කොහොමටවත් සභාවේ එතුමාගේ අයිතිය මම උල්ලංඝනය කරන්න යන්නේ නැහැ.

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/23)**

අ. 1 AB පාසලක විදුහල්පතිවරයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් මොනවාද?

ආ. නුගේගොඩ සාන්ත ජෝන් විදුහලේ විදුහල්පතිවරයාට එකී අවශ්‍ය සුදුසුකම් තිබේද?

ඇ. විදුහලේ සිසු විනය තදින් පිරිහී ඇති බව හා ඒ සඳහා විදුහල්පතිවරයාගේ ක්‍රියාකලාපය බලපා ඇති බව දන්නවාද? ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. විදුහල්පතිවරයා අල්ලස්වලට ළමයින් ඇතුළු කරන්නේය යන සිසුන්ගේ චෝදනාව පිළිබඳ විමර්ශනයක් සිදු කර තිබේද? නැතහොත් එසේ කරන්නේද?

ඉ. පාසලින් ඉවත්ව යන ලෙස සිසුන් විදුහල්පතිවරයාට කියා ඇති බව හා ඔහුට එරෙහිව පාසල තුළ උද්ඝෝෂණය කළ බව ඔබ දන්නවාද?

ඊ. ඒ පිළිබඳ පරීක්ෂණයකට පැමිණි කලාප අධ්‍යක්ෂවරිය සියලු උසස් පෙළ පංති වසා දැමීම නීත්‍යානුකූලද?

උ. නොඑසේනම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඌ. මේ සිදුවීම් පදනම් කර ගෙන ගුරුවරුන් පිරිසක් මාරු කිරීමට විදුහල්පති කටයුතු කරන අතර ඒ සම්බන්ධයෙන් ඔබ ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, III නිලධාරියෙකු හෝ විදුහල්පති සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම.

ආ. නැත.

ඇ. විදුහලේ විනය පිරිහී ඇති බව පිළිගනිමි. දැනට මේ පිළිබඳව විමර්ශනයක් කරමින් පවතී.

ඈ. සිසුන් එවැනි චෝදනාවක් කර නොමැති බැවින් විමර්ශනයක් කර නැත.

ඉ. ඔව්.

ඊ. පැවති තත්ත්වය යටතේ දින 04 කට පමණක් උසස් පෙළ සිසුන්ට නිවාඩු ලබා දී ඇත.

උ. අදාළ නොවේ.

ඌ. දැනට ගුරුවරු මාරු කිරීමක් සිදු කර නැති අතර, විමර්ශන වාර්තාව අනුව ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතරු ප්‍රශ්නය. පසුගිය මාර්තු 01 වැනිදා තමයි සිසුන් - මම හිතන්නේ, ඔබතුමා මාධ්‍යවලිනුත් දැක්කා නම් මේ විදුහල්පතිවරයා දරුවන්ගෙන් මුදල් ගන්නා බවටත්, ඒ වාගේම පාසලේ

වාහනය පෞද්ගලිකව පාවිච්චි කරන බවටත් චෝදනා නගමින් පාසල ඇතුළේ උද්ඝෝෂණයක් කළා. දරුවෝ මේ පාසල තුළ උද්ඝෝෂණය කිරීම අපි පිළිගන්නේ නැහැ. නමුත් දරුවන් මේ විදුහල්පතිවරයාට විරුද්ධව ලොකු උද්ඝෝෂණයක් කළා. එතකොට ඔබතුමා මේකේ කියනවා, පාසලේ ළමුන් - ඒ කියන්නේ ළමුන්ම චෝදනා කරනවා, විදුහල්පතිවරයා මුදල් ගන්නා බවට. හැබැයි, ඔබතුමා මට උත්තර දෙනවා එහෙම චෝදනාවක් ළමුන් කළේ නැහැයි කියලා. ඒ නිසා මේ උත්තරේ හරිම පරස්පරයි. ළමුන් පැහැදිලිවම චෝදනා කරනවා. මේ විදුහල්පතිවරයා එක පැත්තකින් පාසලේ දරුවන් ඇතුළත් කර ගන්න මුදල් අරගෙන තිබෙනවා. අනික් පැත්තෙන් පාසලේ තිබෙන පොදු වාහනය පෞද්ගලිකව පාවිච්චි කරනවාය කියලා. ඒක තමයි ඔවුන්ගේ ප්‍රධාන චෝදනා දෙක. එතකොට ඔබතුමා කියනවා, එහෙම චෝදනාවක් කළේ නැහැයි කියලා. එතකොට කෝකද ඇත්ත?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් එතුමා ප්‍රශ්නයක් නොවෙයි ඇහුවේ. එතුමා ප්‍රකාශයක් කියෙව්වා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රකාශයක් නොවෙයි. මම කියන්නේ, ඔබතුමා කියනවා, ළමුන් එහෙම චෝදනාවක් කරන්නේ නැහැයි කියලා. නමුත් පසුගිය මාර්තු 01 වැනිදා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම නිවැරදි කරන්නම් ගරු මන්ත්‍රීතුමා වෙනුවෙන්. මෙතැන එතුමා අහලා තිබෙන ප්‍රශ්නය තමයි - මෙතැන 'ඇ' යටතේ මම උත්තර දීලා තිබෙනවා, විදුහල්පතිවරයා අල්ලස්වලට ළමුන් ඇතුළත් කරන්නේය යන සිසුන්ගේ චෝදනාව පිළිබඳව විමර්ශනයක් සිදු කර තිබේද? නැතහොත් එසේ කරන්නේද? කිසිදු චෝදනාවක් ඉදිරිපත් කර නොමැති බැවින් විමර්ශනයක් කර නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ළමුන් එහෙම චෝදනාවක් කරනවා. පසුගිය මාර්තු 01 වැනිදා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට විවාදයකට කාලය දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟ එක. මේ විදුහල්පතිවරයා මේ සිදුවීම්වලින් අනතුරුව පසුගිය මාර්තු 08 වැනිදා දෙමව්පිය රැස්වීමක් තියනවා. ඒ වාගේම මාර්තු 07 වැනිදා ගුරුවරු සහ කලාප පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ රැස්වීමක් තියනවා. මේ විදුහල්පතිවරයාට විරුද්ධව කටයුතු කළා යැයි ඔහු විශ්වාස කරන ගුරුවරු හය දෙනෙකුගේ නම් සහිතව ඔහු ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා, මේ හය දෙනාව මාරු කරනවාය කියලා. නමුත් ඔබතුමා කියනවා, එහෙම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැයි කියලා. නමුත් විදුහල්පතිවරයා ප්‍රසිද්ධියේ පාසලේදී කියලා තිබෙනවා, ගුරුවරු හය දෙනෙකුගේ නම් කියලා, ඒ හය දෙනාව ස්ථාන මාරු කරනවාය කියලා. ඔබතුමා සහතික වෙනවාද මේ ගුරුවරු මාරු කරන්නේ නැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න නොවෙයි. එතුමා යළි විමසන්නේ. ප්‍රකාශ කරන්නේ. දැන් ඊළඟ කාරණාව තමයි, දැන් මේ පාසලක දෙමව්පියෝ දරුවෝ කඩ පිල්වල, ගේට්ටු අසළ, තැන් තැන්වල බස්වල එහෙම කථා කරන ඒවා ප්‍රශ්න හැටියට ගොනු ගත නොකළ යුතුයි. ඒත් මම මේකට උත්තර දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම කිව්වේ කඩපිල්වල කථා කරන ඒවා නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් ඉන්න කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විදුහල්පතිවරයා ප්‍රසිද්ධියේ කියන ප්‍රකාශ මම අහන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතුමා මේ ප්‍රශ්න විමසන්න පෙර අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නියෝගය පරිදි නියෝජ්‍ය ලේකම්තුමා මේ වන විට ඒ පාසලේ පරීක්ෂණය සඳහා යොමු කරලා, අවස්ථා දෙකකදී පාසලට ගිහිල්ලා, දෙමව්පියෝ හමු වෙලා, ආදි ශිෂ්‍යයෝ හමු වෙලා, මේ පාසලේ ගුරු භවතුන් හමු වෙලා අපි නිවැරදි තීන්දු කිහිපයකට ඇවිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒක මෙතුමාගේ හෘදය සාක්ෂිය පිළිගනීවි. ඉතාම නුදුරේදී ඉතාම හොඳ යහපත් තීන්දුවලට අපි යනවා. මේ පාසලේ ප්‍රශ්නය අපි විසඳනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නගත විදුහල්පතිවරයා තවදුරටත් පාසලේ සේවය කරමින් ඉන්නවා. ඔහු සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නේ කවදාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට දින කියන්න බැහැ. ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපනයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පැහැදිලිව කිව්වා නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි තීන්දුවක් ගන්නවා. ඒකට දෙන්න. අපට සතියක් විතර දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තුතියි. එහෙම කියන්න. වැල් බයිලා කියන්නේ නැතිව.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දින දෙන්න පුළුවන් පාරවල්වලට තාර දමන අමාත්‍යාංශයක් නම් මේක. මේක අධ්‍යාපන අමාත්‍යාංශය. පාරවල්වල තාර දානවා නම් දැම්මා, හෙට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 05 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නය ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව. එතුමිය සභා ගර්භයේ නැහැ. ගරු ඇමතිතුමා පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

*ප්‍රශ්නය :*

*අ. පසුගිය වසර තුළ පළාත් අයවැයෙන් වෙන් කරන ලද මුදලින් ඔබ අමාත්‍යාංශය මගින් ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන් සඳහා සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් මොනවාද?*

*පිළිතුර :*

*අ. ඇමුණුම 01*[4] *මගින් දක්වා ඇත.*

*ප්‍රශ්නය :*

*ආ. ඉහත පරිදි ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කර ඔබ අමාත්‍යාංශය මගින් කලින් වසරට වඩා ප්‍රගතියක් අත් කර ගෙන ඇති ක්ෂේත්‍ර/අංශ මොනවාද?*

[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.

*පිළිතුර :*

*ආ. වාරිමාර්ග ක්ෂේත්‍රය*
*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රය*
*ඉඩම් ක්ෂේත්‍රය*

*ප්‍රශ්නය :*

*ඇ. සංවර්ධනය සඳහා දිගින් දිගටම මුදල් වැය කළත් කලින් වසරට සාපේක්ෂව ප්‍රගතියක් අත් කර ගෙන නොමැති ක්ෂේත්‍ර/අංශ මොනවාද?*

*පිළිතුර :*

*ඇ. කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි යෝජනා කර තිබූ කෘෂි මාර්ග හා ඉදිකිරීම.*

*ප්‍රශ්නය :*

*ඈ. එවැනි කලින් වසරට වඩා ප්‍රගතිය අත් කර ගෙන නොමැති ක්ෂේත්‍ර/අංශ වඩා ඵලදායී බවට පත් කර ගැනීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

*පිළිතුර :*

*ඈ. වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතුවලට අතිරේකව අනෙකුත් ගොඩනැගිලි සහ කෘෂි මාර්ග ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු සැකසුම් කටයුතු දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වෙත මෙම වසරේ සිට පවරා ඇති අතර එමගින් ඇස්තමේන්තු සැකසීමේදී සිදු වන ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කර ඇත.*

*ප්‍රශ්නය :*

*ඉ. එකී ව්‍යාපෘතීන්ට අමතරව මෙම නව වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් නව රැකියා උත්පාදනය කළ හැකි නව ව්‍යාපෘති පවතින්නේද?*

*පිළිතුර :*

*ඉ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඊ. එසේනම් ඒ මොනවාදැයි ඉදිරිපත් කරන්නේද?*

*පිළිතුර :*

*ඊ. ඇමුණුම 02*[5] *මගින් දක්වා ඇත.*

[5] හැන්සාඩ් අංශයේ තබා ඇත.

*ප්‍රශ්නය :*

*උ. නොඑසේනම් ඒ මන්ද?*

*පිළිතුර :*

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව. එතුමිය සභා ගර්භයේ නැහැ.

**ගරු ඉසුරු දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 07 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමියගේමයි.

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පිළිතුරු සභාගත කරනවා.

* [***සභාගත කරන ලද පිළිතුරු***]
*[Tabled Answer]*

*ප්‍රශ්නය :*

*අ. ඔබතුමා විසින් පළාත් සභා අරමුදල් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පසුගිය වසරේ පළාත් සභා මන්ත්‍රීතුමන්ලා 104 දෙනාගෙන් එක් එක් මන්ත්‍රීතුමා වෙත වෙන් කර දුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද?*

*පිළිතුර:*

*අ. සෑම මන්ත්‍රීවරයෙකුටම රු.මි. 5 බැගින් ලබා දී ඇත.*

*ප්‍රශ්නය :*

*ආ. එකී එක් එක් මන්ත්‍රීවරුන් වෙත වෙන් කර දෙන ලද මුදල ගම්පහ, කොළඹ සහ කළුතර යන දිස්ත්‍රික්කවල මන්ත්‍රීතුමන්ලා වෙත වෙන් කළ ආකාරයට දිස්ත්‍රික් අනුව ප්‍රතිශතයක් ලෙස කොපමණද?*

*පිළිතුර:*

*ආ.*

| වෙන් කළ මුදල | කොළඹ රු.මි. | ගම්පහ රු.මි. | කළුතර රු.මි. | එකතුව රු.මි. |
|---|---|---|---|---|
| විශේෂිතව හඳුනාගත් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය 39.42කිරීම/ පළාත් සංවර්ධන ප්‍රදාන | 102.5 | 102.5 | 55.0 | 260.0 |
| උපමාන පාදක ප්‍රදාන | 102.5 | 102.5 | 55.0 | 260.0 |
| ප්‍රතිශතය | 39.42% | 39.42% | 21.16% | 100% |

*ප්‍රශ්නය :*

*ඇ. ඉහත කී මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය අනුව මහජන ඡන්දයෙන් තේරී පත්ව එන ඇතැම් මන්ත්‍රීතුමන්ලාට තම මහජන සේවාවන් සැපයීමට අඩු මුදල් ප්‍රමාණයක් ලබා දීම හේතුවෙන් අසාධාරණයක් සිදු වන බව ඔබතුමා පිළිගන්නේද?*

*පිළිතුර:*

*ඇ නැත.*

*ප්‍රශ්නය :*

*ඈ. මෙම 2017 වසරේදී සමාන ක්‍රමවේදයකට මෙම පළාත් සභා අරමුදල් වෙන් කර දීමට ඔබතුමා ක්‍රියා කරන්නේද?*

*පිළිතුර:*

*ඈ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඉ. නොඑසේ නම් ඒ මන්ද?*

*පිළිතුර:*

*ඈ. අදාළ නොවේ.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, මේ දිනවල අපේ රටේ අවධානය යොමු වෙලා තිබෙන ප්‍රධාන කාරණයක් තමයි, 34 වන ජිනීවා මානව හිමිකම් සැසිය. මේ සැසියේදී විශේෂයෙන්ම 2015 සැප්තැම්බර් 21 වැනිදා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජිනීවා මානව හිමිකම් සැසියට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව ඉදිරිපත් කළේ ඇමරිකාව, මහා බ්‍රිතාන්‍ය, මොන්ටිනිග්‍රෝ සහ මැසිඩෝනියාව කියන රටවල් හතර එකතු වෙලා. සැප්තැම්බර් 21 වැනිදා අපේ රටට එරෙහිව යෝජනාවක් ඉදිරිපත් කළා. මුල් අවස්ථාවේදී මේ යෝජනාවට ශ්‍රී ලංකාව විරුද්ධත්වය පළ කළා. නමුත් 2015 සැප්තැම්බර් 24 වැනිදා ශ්‍රී ලංකා රජය මේ යෝජනාවට තම අනුග්‍රාහකත්වය ලබා දෙන්න තීරණය කළා. එම යෝජනාව තුළ ඉතා පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, ශ්‍රී ලංකාව තුළ සිදු වුණා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා හයිබ්‍රිඩ් අධිකරණයක්, ඒ කියන්නේ දෙමුහුන් අධිකරණයක අවශ්‍යතාවය පිළිඅරගෙන තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර විනිසුරුවරුන් එයට කැඳවා ගත යුතු බවත් එහි සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රතිසංස්කරණ සහ බලය බෙදා හැරීම පිළිබඳ කාරණාත් මේ යෝජනාවලියට ඇතුළත් කරලා තිබෙනවා. එතකොට ගරු සභාපතිතුමනි, එවකට පැවති ඇමරිකා එක්සත් ජනපදයේ ඔබාමා පාලනය යටතේ තමයි අපට මේ යෝජනාවලිය ගෙනාවේ. ඔබාමා පාලනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉතාම දැඩි ස්ථාවරයක හිටියා. යුද්ධය පැවති සමයේදීත්. ඒ වාගේම යුද්ධයේ අවසාන අදියරේදීත් සිදු වුණාය කියන යුධ අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවටත් ඒ වාගේම හිටපු ජනාධිපතිතුමාට, ආරක්ෂක ලේකම්තුමා ඇතුළු ත්‍රිවිධ හමුදාපතිවරුන් වගඋත්තරකරුවන් විධියට ඔවුන්ට දඬුවම්

කළ යුතුයි කියන ස්ථාවරයක ඇමරිකා එක්සත් ජනපදය හිටියා. විශේෂයෙන්ම හිලරි ක්ලින්ටන් එවකට රාජ්‍ය ලේකම්වරිය විධියට දැඩි ස්ථාවරයක ඉඳගෙන කටයුතු කළා. ඒ වාගේම සමන්තා පවර් මැතිනිය සහ නිශා බිෂ්වාල්. මේ කියන අයත්, ඒ වාගේම ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිවරයාත් ඉතාම දැඩි ස්ථාවරයක හිටියා මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට කිසිසේත් බුරුලක් නොදිය යුතුයි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර යුධ අපරාධ අධිකරණයට ගෙන යා යුතුයි කියන ස්ථාවරයක තමයි ඔවුන් හිටියේ. දැන් ඇමරිකාවේ පාලනය වෙනස් වෙලා තිබෙනවා. ඒ අනුව එහි ඩිමොක්‍රොටික් පාලනය වෙනස් වෙලා, දැන් රිපබ්ලිකන් පාලනයක් ඇති වෙලා තිබෙනවා. ට්‍රම්ප්ගේ පාලනය යටතේ ලෝකයේ සිදු වෙමින් තිබෙන ජාත්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් ඔවුන් එතරම් උනන්දුවක් දක්වන්නේ නැහැ.

ඒ වාගේම මානව හිමිකම් සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒ නිසා පැහැදිලිවම අද අපට මේ සම්බන්ධයෙන් ඉතා වාසිදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත් කනගාටුවට කාරණාව තමයි, අද ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන මේ වාසිදායක තත්ත්වය ශ්‍රී ලංකා රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය නිසි පරිදි කළමනාකරණය කර ගනිමින්, එය ප්‍රයෝජනයට ගනිමින් මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවලිය සංශෝධනය කර ගන්න කටයුතු කරන්නේ නැහැ. ඒ වෙනුවට වසර දෙකක කාලයක් සඳහා මේ යෝජනාවලිය කල් තබන ලෙස තමයි ඉල්ලා තිබෙන්නේ. ඒ අනුව විදේශ කටයුතු ඇමතිවරයාගේ ස්ථාවරය වී තිබෙන්නේ, ටෙක්නිකල් රෝල් ඕවර් කියන ප්‍රතිපත්තිය මත. ඒ කියන්නේ, මේ යෝජනාව වසර දෙකකට බහා තබන්න කියන ප්‍රතිපත්තියට තමයි ගමන් කරලා තිබෙන්නේ.

අපි පැහැදිලිවම කියන්න ඕනෑ. මේ වෙලාවේ මහා බ්‍රිතාන්‍ය පාලනය වෙනස් වෙලා තිබෙනවා. ඇමරිකා එක්සත් ජනපදයේ පාලනය වෙනස් වෙලා තිබෙනවා. අපට ඉතාම වාසිදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් අද පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, විදේශ විනිසුරුවන් සහ හයිබ්‍රිඩ් අධිකරණයක් අවශ්‍ය නැති බව. නමුත් මෙහි පරස්පරයක් තිබෙනවා. ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ මේ ප්‍රතිපත්තිය, ස්ථාවරය විදේශ කටයුතු අමාත්‍යාංශය කොතෙක් දුරට මේ ජිනීවා මානව හිමිකම් සැසිය තුළ නියෝජනය කරනවාද කියන එක. මේ ප්‍රශ්නයෙන් අපට බේරෙන්න තිබෙන අවස්ථාව, ගැලවෙන්න තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට ගන්න බවක් පෙනෙන්නට නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ. ස්වර්ණමය අවස්ථාවක් මේ තිබෙන්නේ. ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් අපට එල්ල වෙලා තිබෙන මේ යුධ අපරාධ චෝදනාවලින් නිදහස් වෙන්න තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ සඳහා කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අපේ බලවත් අප්‍රසාදය ජාතික හෙළ උරුමය විධියට මේ වෙලාවේ පළ කරන්න කැමැතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අස්වෙන්න. යූ.එන්.පී. සන්ධානෙන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ඒක කියන්න ඕනෑ චම්පික රණවක ඇමතිතුමාට. අපට නොවෙයි. චම්පික ඇමතිතුමාට කියන්න. කැබිනට් එකට කියන්න. අපට කියලා වැඩක් නැහැ. මොකද, යහපාලන ආණ්ඩුව ගෙනාවේ ඒගොල්ලෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යහපාලන ආණ්ඩුව වෙනස් කරන්න. එතකොට හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සතියක් තිස්සේ අපේ කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ සිසු දරුවෝ, දෙමව්පියෝ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ? ඔබතුමාට ඒක ප්‍රශ්නයක් නොවෙයි. 36(1) යටතේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. 36(1) යටතේ ප්‍රශ්නයක් නොවෙයි. කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය ඒවාට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කාලය දෙන්න බැහැ. ඒක 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. කොට්ටාව ධර්මපාල පාසලේ ප්‍රශ්නය කොහොමද ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්නේ? අනවශ්‍ය දේවල් කථා කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට එතැනට ගිහිල්ලා ගැහුවා නම් කථා කරන්න පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, එතුමා ඒකේ බාලාංශය පන්තියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, එතුමාට -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට දෙන්න බැහැයි කියන්න බැහැ. මම මහරගම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ප්‍රශ්නය ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඔබතුමාගේ දරුවෝ යන්නෙත් නැහැ නේ ඒ ඉස්කෝලෙට. ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම බස්නාහිර පළාත් සභාවේ. මට ඡන්දය දීපු මිනිස්සු 50,000 ක් විතර ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. වෙන්න පුළුවන්. ඒක වෙනම දෙයක්. ඔබතුමාගේ ළමයින් යන්නේ නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ ඡන්ද දායකයන්ගේ දරුවෝ යන ඉස්කෝලයක්. අපේ පළාත් සභාවේ පාසලක් මේක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. කරුණාකර වාඩි වෙන්න. මට අවස්ථාව දෙන්න බැහැ. අනවශ්‍ය ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ තිබෙනවා නේ? පත්තර පිටු ගණන් බලන්න. පළාත් සභාවට කොපමණ ලැජ්ජද මේක? පළාත් සභාව විහිළුවක් කරන්න අරන්නේ? මේකේ අධ්‍යාපන අමාත්‍යාංශය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොරණ නගර සභා බල ප්‍රදේශයේ කඩ හිමියන් සිදු වී ඇති අසාධාරණය පිළිබඳව පැහැදිලි කරන්න යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මම කථා කරන්න සූදානම් වුණේ, ගරු ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ

අවධානයටත්, ඒ වාගේම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා වැනි හොරණ ආසනයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේත් අවධානයට යොමු කරනවා. මම දන්නේ නැහැ අනික් නගරවලත් මෙහෙම වෙනවාද කියලා. හොරණ නගරයේ මේ අවස්ථාව වන කොට අලුතෙන් බදු පැනවීමේ ක්‍රමවේදය මත රු. 300/- ට තිබුණු බදු මුදල රු. 2700/- දක්වා වැඩි වෙලා තිබෙනවා. මාසික කුලිය. ඒ වාගේම රු. 3000/- ට තිබුණු එක රු. 20,000/- දක්වා වැඩි වෙලා තිබෙනවා. එලෙස අසීමිත බදු මුදලක් අය කරලා වෙළඳ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටීමේ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේක ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට ඔබතුමා මගින් යොමු කරලා, මේ මිනිස්සුන්ට, මේ වෙළඳුන්ට සහනයක් ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේ පෙන්වා දෙමින් මේ පිළිබඳව මම සභාගත[6] කරනවා ඒ දුන්න සියලු ලිපි ලේඛන. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන පරිපාලනය බිඳ වැටීම පිළිබඳ කාරණාවට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පසුගිය කාලය තුළ ආපහු හැරිලා බලපුවාම මේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන පරිපාලනයේ බරපතළ බිඳ වැටීම් ගණනාවක් අපට පේන්න තිබෙනවා. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාත් යම් කාරණයක් මතු කරන්න උත්සාහ කළා. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේක දේශපාලන අධිකාරියේ වැරැද්දක්ද? එහෙම නැත්නම් මේක නිලධාරීන්ගේ වැරැද්දක්ද කියන එක ගැන බරපතළ ප්‍රශ්න තිබෙනවා. සමහර වෙලාවට දේශපාලන අධිකාරියට පාලනය කර ගන්න බැරි විධියට සමහර නිලධාරීන් කටයුතු කරනවා. සමහර වෙලාවට නිලධාරීන් අසරණයි. දේශපාලඥයෝ මතු වෙලා දේශපාලන අධිකාරිය විසින් නිලධාරීන්ව බල්ලාට දාලා තිබෙනවා. මේකේ උදාහරණ කිහිපයක් මම දැන් වරින් වර

[6] හැන්සාඩ් අංශයේ තබා ඇත.

මේ ඇමතිතුමාට කිව්වා. ඇමතිතුමාට නම් කිව්වාට වැඩක් නැහැ. ගිය සුමානේ මම ඇමතිතුමාට කථා කරලා කිව්වා, වැදගත් විධියට. ඔබතුමා එහෙම නැත්නම් රටටම කියලා අයින් වෙන්න. තමන්ට කරන්න බැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමාට කිව්වාට, ගරු ඇමතිතුමාට කිව්වාට වැඩක් නැහැයි කියලා කියනවා. මම පැය විසි හතරේම උදේ ඉඳන් හැන්දෑ වෙනකල් - මේ ෆෝන් එකෙනුත් එතුමාත් එක්ක සම්බන්ධ වෙනවා. එතුමා රෑ දෙකටත් කථා කරනවා. මම ඉතාම මිත්‍රශීලීව, සුහදව උදව් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රෑ දෙකට මොකටද කථා කරන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොකුත් ඕනෑ නැහැ. අර වාහන යෝජනාව වාගේ එකක් ගෙනාවා නම් ඔක්කොම ඉවරයි. වැඩ ටික කෙරෙනවා. (බාධා කිරීමක්) අර වාගේ කථාවක් ගෙනැල්ලා තාප්පෙට හේත්තු කළා නම්, වැඩ ටික කෙරෙනවා. එහෙම තමයි වැඩේ යන්නේ. ගරු ඇමතිතුමනි, මගේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මම කාලය දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම එක උදාහරණයක් කියන්නම්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

හැමතිස්සේම අමාත්‍යාංශය ඇතුළේ ඉන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අමාත්‍යාංශය ඇතුළේ ඉන්න නිසා තමයි අමාත්‍යාංශයට යන නිසා තමයි ගරු මන්ත්‍රීතුමා මේවා දන්නේ. එහෙම නැතිව ඒගොල්ලන්ට බටර් ගාන්න මම යන්නේ නැහැ. මිනිස්සුන්ගේ ප්‍රශ්න අරන් මම යන්නේ.

ගරු සභාපතිතුමනි, කොල්ලුපිටිය ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙස අවුරුදු නවයක් කටයුතු කරපු කන්‍යා සොහොයුරියගේ ස්ථාන මාරුවක් සිද්ධ වෙනවා. එතුමිය විදුහල්පති ශ්‍රේණියේ නොවෙයි. ඒක ඇත්ත. හැබැයි, අවුරුදු නවයක් විදුහල්පතිනිය. දැන් මොකක්ද මේකට හේතුව? මේකට හේතුව තමයි, මේ පාසලේ නිල ඇඳුම් පාසලේ වික්කාය කියලා. මේ චක්‍රලේඛයේ එක තැනක තිබෙනවා, විවෘත වෙළඳපොලෙන් නිල ඇඳුම් තිළිණ පත් සඳහා රෙදි මිලදී ගැනීමට ඉඩ සලසා ඇති බැවින්, අලෙවිකරුවන් ලියාපදිංචි කිරීම නොකළ යුතුය. එතකොට මේ පාසලේ තිබෙනවා, සල්පිලක්. මේ සල්පිල අවසර සහිතව කරන සල්පිලක්. මේ සල්පිලේදී මේ කූපන් එකට ගන්න පුළුවන් රෙදි ටික දෙමව්පියෝ මැදිහත් වෙලා පොඩි කඩයක් දාලා, මේ කූපන් එකට රෙදි ටික දෙනවා. එතකොට මේක කථා කරලා පළාත් අධ්‍යක්ෂකට කියනවා, කාලයක් තිස්සේ මේ විදුහල්පතිනි කන්‍යා සොහොයුරියට පහර දෙන පියුමි කියලා විදුහලේ ඉන්න ගුරුතුමියක්. එතුමිය පළාත් ලේකම්ගේ මිතුරියක්. පළාත් ලේකම්වරයාටත් සල්පිල යන අතරතුරේදී හදිසියේ කෝල් එකක් දුන්නාම, පළාත් ලේකම් ගිහිල්ලා රෙද්දකට මුවා වෙලා හොරෙන් බලාගෙන ඉඳලා මේ කන්‍යා සොහොයුරියට, විදුහල්පතිනියට විරුද්ධව ලොග් සටහනක් ගහනවා. මොකක්ද ලොග් සටහනේ කියන්නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේක මම ඇමතිවරයා හැටියට මට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පොඩ්ඩක් ඉන්න කෝ ඇමතිතුමා. මට කථා කරන්න දෙන්න කෝ මගේ වෙලාවේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

රීති ප්‍රශ්නයක්. දැන් මේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොකක්ද රීති ප්‍රශ්නය. මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය කියන්න කෝ ඉස්සෙල්ලා, රීති අංකය කියන්න කෝ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36(1). මොකද, පළාත් ලේකම්වරයා ගිහිල්ලා රෙද්දකට මුවා වෙලා හොරෙන් බැලුවාලු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක ඔබතුමාට වැඩක් නැහැ. ඔබතුමා බලාගෙන හිටියේ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ලේකම්තුමාට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා මේ වැරදි සාධාරණීකරනය කරන්න එපා. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා නැහැ. ඔබතුමා රෙද්ද අස්සේ හිටියාද? මම කිව්වාද ඔබතුමා රෙද්ද අස්සේ හිටියා කියලා. ඔබතුමා රෙද්ද අස්සේ හිටියේ නැත්නම්, ඉඳගන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

රෙද්ද අස්සේ නොවෙයි. රෙද්ද ගලවලා යන්න ඕනෑ වෙන දේවල්වල හැටියට. මොන රෙද්ද අස්සේද? රෙදි ගලවාගෙන යන්න ඕනෑ. මෙතුමාට මම කිව්වා. රෙදි ගලවාගෙන - (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔබතුමාටත් ප්‍රශ්න ඇති. පොඩ්ඩක් ඉන්න. ඒවා

පස්සේ කථා කර ගන්න. එතුමාත් එක්ක පෞද්ගලික හම්බ වෙලා. මෙතැන ඕක අදින්න එපා.

ගරු සභාපතිතුමනි, ඊට පස්සේ අර පියුමි කියන කාන්තාවගේ ඕනෑකමට ලේකම්තුමා මේ විදුහල්පතිනියව මාරු කරනවා. (බාධා කිරීම්) කතෝලික සභාව, දෙමව්පියෝ සියලු දෙනා මේ කන්‍යා සොහොයුරියව විදුහල්පතිනියව රැකලා දෙන්න කියලා ඉල්ලනවා. හැබැයි, ඒක කරන්නේ නැහැ. මේක පෞද්ගලික හේතුමත කරන්නේ. මේකේ තිබෙන විධියට චක්‍රලේඛය උල්ලංඝනය කරලා නැහැ. මේ එක ප්‍රශ්නයක්.

ඊළඟට මම පෙන්වන්නම්, මොකක්ද කියලා. මේ ධර්මපාල විද්‍යාලය ගැන කථා කළා. ධර්මපාල විද්‍යාලයේ - පසුගිය පෙබරවාරි 22 වැනිදා රට යනවා. කවුද? පළාත් ලේකම්. 21 වැනිදා කඩා පනිනවා අසෝක විද්‍යාලයට. කඩා පැනලා ඉවර වෙලා අර යසරත්න විදුහල්පතිතුමාව තාප්පයට හේත්තු කරනවා. ෆයිල් වගයක් තෝරා ගන්නවා. මෙන්න ෆයිල් අංක ටික. ෆයිල් වගයක් තෝරා ගෙන නීති විරෝධීව ළමයින් ඇතුළත් කරනවාය කියලා, උඹව මම - තාප්පයට හේත්තු කරලා තියෙන්නේ. උඹ ආයිත් ධර්මපාල විද්‍යාලයට එන්න උත්සාහ කළොත් මම උඹව මේ පරීක්ෂණවලින් හිර කරනවා කියලා, පළාත් ලේකම් මේ මනුස්සයාව භය කරලා, විදුහල්පතිව භය කරලා රට යනවා. එනකොට ඒ මනුස්සයා පැත්ත වහලා ඉන්නවා. විජේරත්න කියන මිනිහාව විදුහල්පති කරනවා. මේක තමයි ඇත්ත. ඒ නිසා මිනිස්සුන්ව භය කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පළාත් ලේකම්ද? අධ්‍යක්ෂද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පළාත් අධ්‍යක්ෂ. පළාත් අධ්‍යක්ෂ තමයි මේක ගහන්නේ. සමාවෙන්න. පළාත් ලේකම්ටත් වැඩේ දීලයි වැඩේ කරන්න හදන්නේ. පළාත් ලේකම් යන්තම් තවම පුටුව බේරා ගෙන ඉන්නවා. ඒ මනුස්සයා හොඳ මහත්තයෙක්. ඒ මනුස්සයාටත් වැඩේ දෙන්න තවම ප්ලෑන් කරනවා. නමුත් මේක එකක්. මේ වාගේ ප්‍රශ්න ගණනාවක්.

ඊළඟට මම කිව්වා, මාළඹේ රාහුල විද්‍යාලයේ ප්‍රශ්නය. රාහුල විද්‍යාලයේ පරීක්ෂණයක් කරලා තීරණයක් ගත්තා. ආයිත් පාසල් සංවර්ධන කමිටුව පත් කරන්නය කියලා. හැබැයි, මෙන්න ලේඛන දෙකක් එවනවා. කවුද? විදුහල්පතිනිය. එක ලේඛනයක තිබෙනවා. මොකක්ද තිබෙන්නේ? වාර්ෂික නිලවරණය නැතිව එක ලේඛනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඊට පස්සේ ලේකම්තුමා කථා කරලා අහනවා, පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව මොකද වෙන්නේ කියලා. ඊට පස්සේ වාර්ෂික නිලවරණය දාලා එවනවා. දැන් මේවා සියල්ල, පරිපාලනය ගිලිහිලා ගිහිල්ලා. මේ ප්‍රශ්න ඔක්කොම මේ ඇමතිතුමාට කියලා තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

රාහුලේ ගාව ගන්න එපා. කඩුවෙල එක ඉස්කෝලයක් ගැන කථා කළොත් බලාගෙනයි. ඒවාට අපි ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

රාහුලේ පරිපාලනය නොවෙයි කියන්නේ. ඔබතුමාගේ මැදිහත් වීම වෙන ප්‍රශ්නයක්. මම රාහුලේ පරිපාලනය නොවෙයි කිව්වේ. ඔබතුමා පනින්නේ නැතිව ඉන්න කෝ. ඔබතුමා විදුහල්පතිනියත් එක්ක තිබෙන ප්‍රශ්නය - රාහුලේ ප්‍රශ්නය මේ තියෙන්නේ. අධ්‍යාපනය බිඳ වැටිලා තිබෙනවා. ඔබතුමාට ඇඟිල්ල දික් කරන්න පුළුවන් නම් මටත් ඇඟිල්ල දික් කරන්න පුළුවන්. මගේ කාලය නාස්ති කරන්නේ නැතිව ඉඳගන්න. නැහැ. ඔක්කොම ඉන්නවා තමයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හරක් මඩුවක් නොවෙයි. කීර්තිමත් ඉස්කෝලයක්. රාහුලේ ගැන කථා කරන්න එන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොනවා කරන්නද? ඔබතුමා කඩුවෙල චණ්ඩියාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. එතුමාට කථා කරන්න දෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කිරීම් කරන්න එපා. කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කියන්නේ, පාසල් නොවෙයි. අධ්‍යාපන පරිපාලනය ගැන මම කියන්නේ. මම කියන්නේ, අධ්‍යාපන පරිපාලනය බිඳ වැටිලා. මෙතුමා දන්නේ නැහැ, මෙතුමා මොනවාද කරන්නේ කියලා. මෙතුමා දන්නේ නැහැ නිලධාරීන් මොනවාද කරන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. ඇයි ඔබතුමා ඔපමණ කේන්ති ගන්නේ? මාළඹේ රාහුල විද්‍යාලය ගැන කථා කරන කොට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඇමතිතුමාගේ නියෝග නැහැ. ප්‍රශ්න කිව්වාම ඇමතිතුමා නිකම් බලාගෙන ඉන්නවා. එතුමා ඒවාට තීරණ ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කියන්නේ, අධ්‍යාපන පරිපාලනය බිඳ වැටිලා පළාතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට හොඳ නැහැ නේ මෙපමණ කථා කරන්න. කරුණාකර වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ ඇමතිතුමාට බැරි නම් යන්න. එපමණයි කියන්නේ. පාසල්වලට ඇතුළත් කිරීමත් අර්බුදයට ලක් කරලයි තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පළාත් සභාවේ වැඩියෙන් කථා කරන්නේ අධ්‍යාපනය ගැන. මේ ඇමතිතුමා ඇතුළු පිරිස අධ්‍යාපනය විනාශ කරලා. ඒකයි කියන්නේ. මේගොල්ලොත් මේකට උදව් කරනවා. ඒකයි මේකෙන් ඇත්ත පැහැදිලි වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා මූලාසනයට ඇහුම්කන් දෙන්න. වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කරපු ලේඛන ටික සභාගත[7] කරන්න. ඒ ඔක්කොම ලේඛන ටික දෙන්න. මීළඟට සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන ගැටළු පිළිබඳව නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අද බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍ය ධූරයේ වැඩ බලන්නේ, ආනල්ඩ් කියලා පුද්ගලයෙක්. සෞඛ්‍ය ඇමතිතුමා සිටිද්දී ආනල්ඩ් කියලා පුද්ගලයෙක් තමයි සෞඛ්‍ය ඇමති විධියට වැඩ බලන්නේ. අද ඔහු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි නැහැ. එතුමා ලංකාවේ ඉන්නවා නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ ඉන්නවා. ඒ වැඩ බලන්නේ.

---

[7] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් වැඩ බලන්නේ කවුද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක තමයි. අහගන්න. කථාව ඉවර නැහැ නේ? සාක්ෂියේ කෑල්ලක් අරගෙන ඔබතුමා කෑ ගහන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙම කියන්න එපා. එතුමා තවම ඉන්නවා නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ RD වරයා විධියට කටයුතු කරන ආනල්ඩ් කියන නිලධාරියා ක්‍රියා කරන කලාපය, අමාත්‍යවරයාට උඩින් ගිහිල්ලා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විවිධ ප්‍රශ්න කාරණා තිබෙනවා. විශේෂයෙන්ම අමාත්‍යතුමා දෙන නියෝග පවා ආනල්ඩ් කියන නිලධාරියා ක්‍රියාත්මක කරන්නේ නැහැ. සෞඛ්‍ය ඇමතිතුමාව හමු වෙන්න පුළුවන්. මහ ඇමතිතුමාව හම්බ වෙන්න පුළුවන්. බදාදාට. අධ්‍යාපන ඇමතිතුමාව හම්බ වෙන්න පුළුවන්. ඕනෑ අමාත්‍යවරයෙකුව හම්බ වෙන්න පුළුවන්. හැබැයි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොළඹ RD හම්බ වෙන්න ගියාම CC තමයි භාර ගන්නේ. නිලධාරීන්ව හම්බ වෙන්න ගියාම CC interview එකක් කරනවා. එහෙම නැත්නම් AO. මේ දෙන්නා තමයි ප්‍රතිපත්ති තීන්දු ක්‍රියාත්මක කරන්නේ. අමාත්‍යවරයා දෙන ලිපියක්වත් භාර ගන්නේ නැහැ. හැබැයි, ඒකට ප්‍රශ්න තිබෙනවා. පරිපාලනයේ ඔහුට වැඩිය අඩු, ආධුනිකයෙක් ඊට උඩ පුටුවේ වාඩි වෙලා කියනවා. හැබැයි, ඒ එකක්වත් බස්නාහිර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජනතාවගේ ප්‍රශ්න පාගන්න මේ නිලධාරියාට වැඩ කරන්න බැහැ. නමුත් හරියට මේ නිලධාරියා Arnold Schwarzenegger වාගේ. මේකේ ක්‍රියා කරන්නේ. ඒ නිසා මේක කරන්න බැහැ.

ගරු සභාපතිතුමනි, දැන් පිළියන්දල සේවකයෝ හතර දෙනෙකුට මොහු විසින් එවනවා, පරිපාලනමය හේතු මත රාජකාරියෙන් මාරු කිරීම් කළාය කියලා. මොකක්ද පරිපාලනමය හේතුව? අනික මේ දොස්තර මහත්වරු මොකද මිනිස්සුන්ගේ HR වැඩේ කරන්න. දොස්තරලා ඕනෑද? මේ දොස්තරලාට පපු කැවුතු නැහැ නේ? HR වැඩේ කරන්න. එක මනුස්සයෙක් තමන්ට තිබෙන ප්‍රශ්නය සෞඛ්‍ය ඇමතිතුමාට ලියනවා. මම එතුමාට ලිපියක් එවනවා මේක බලන්න කියලා. එතුමා ආනල්ඩ් නිලධාරියාට යොමු කරනවා. ඔහු ඇයව interdict කරනවා. හරිද? ඔහු කියනවා. ඔහුට බැහැ. බලපෑම් තිබෙනවා. ඒ යවලා තිබෙන තැන නිලධාරියාගෙන්. ඒ නිසා කරුණාකර ඇමතිතුමනි, මට මේ පිළිබඳව - මේ කරුණු හේතු දක්වන්නේ නැතිව පුළුවන්ද ගරු සභාපතිතුමනි. පිළියන්දල නිලධාරීන්ට එවනවා. ඔවුන් ඊට පස්සේ appeal ලියන්න හදනවා. පිළියන්දල DMO ට ආනල්ඩ් කෝල් කරලා කියනවා, appeal භාර ගන්න එපාය කියලා. ගරු සභාපතිතුමනි, එහෙම කරන්න පුළුවන්ද? මොහු කවුද? මොහු පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න. මේ අමාත්‍යාංශයේ මේ නිලධාරියාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව.

ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මේ තිබෙන්නේ එතුමා චෝදනා පත්‍රයේ - මිනිස්සුන්ට අයිතියක් නැද්ද තමන්ට appeal එකක් ලියලා දෙන්න. ඒ ඇපීල් එක පරීක්ෂණ පැවැත්වීමට -මේ පනතේ මේ වගන්තිවල බොහොම පැහැදිලිව තිබෙනවා. මිනිස්සුන්ගේ තිබෙන අයිතිය. මේවා ඇයි උල්ලංඝනය කරන්න, මේ නිලධාරියාට ඉඩ දෙන්නේ? සෞඛ්‍ය ඇමතිතුමා කියන එකක් කරන්නේ නැහැ. මිනිස්සුන්ට හම්බ වෙන්න බැහැ. ඒ නිසා මේ තනතුරේ මේ HR දන්න - පරිපාලනමය දැනුමක් තිබෙන නිලධාරීන් අවශ්‍යයි. අපට දොස්තරලා ඕනෑ නැහැ ඒකට. දොස්තරලා ඕනෑ නැහැ මේ වැඩේට. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා මම ඉල්ලා සිටිනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යවරයාගෙනුත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයෙනුත්. මේ පිළිබඳව වහාම තීන්දුවක් ගන්න. ඒ එක්කම අවසාන වශයෙන් ඔබතුමාට මතක් කරනවා. මේ යෝජනාවට අයිති නැතත් ගිය සතියේ පන්නිපිටිය ධර්මපාල මහා විද්‍යාලයේ ගුරුවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. දෙකක් පටලවා ගන්න එපා. කරුණාකර වාඩි වෙන්න. බැහැ. ඔබතුමන්ලා මේ පන්නිපිටිය ධර්මපාලය මේ දවස්වල -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. ඒක නොවෙයි. ධර්මපාල 17 ක් තිබෙනවා ලංකාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒත් බැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක නොවෙයි. නැගෙනහිර ධර්මපාලයට බලහත්කාරයෙන් ජාතික පාසලක විදුහල්පතිවරයෙක් ඇවිල්ලා වාඩි වෙලා. පළාත් සභා ඉස්කෝලයක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මගෙන් අවසර ඉල්ලුවේ වෙන එකකට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හරි ඒක මේ නිසා බැරි. පොඩ්ඩක් ඒකත් බලන්න කෝ ආ...

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලට උත්තර දෙන්න කාලයක් දෙන්න බැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

පොඩි උත්තරයක් දෙන්න. මොකද, මගේ නම සඳහන් කළා. ඇමතිවරයෙක් වශයෙන් මගේ වගකීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඇත්ත වශයෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ ප්‍රශ්නය මතු කළාට. මේ පිළිබඳව මම දැන් පියවර අරගෙන තිබෙන්නේ. මට මාරු කරන්න පුළුවන් නිලධාරියෙක් නම් මම එතැනින් මෙලහට කනෙන් ඇදලා දාලා. මට ඒ බලය නැහැ. ඒ බලය තිබෙන්නේ මධ්‍යම රජයට. මම ඒක දැනුම් දීලා තිබෙනවා. ඉදිරියේදී බොහොම ඉක්මණින් ඒ ක්‍රියාව කරනවා. ඒකයි මට කියන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා 36(1) කියමින් මේ සභාවට බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වාචිකව ප්‍රශ්න අහන්න වෙලාවක් දෙනවා. දැන් පළාත් සභා පනතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලින් අපට භාගයක් තිබෙනවා. එතකොට පාර්ලිමේන්තුවේ මේක නීති කෙටුම්පත් එකේ - මම මේ පාර්ලිමේන්තුවේ පොත ගෙනැල්ලා තිබෙනවා. එතකොට -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පාර්ලිමේන්තුවේ වරප්‍රසාද අපට නැහැ. මෙතුමා පටලවාගෙන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දැන් 104 ක් ඉන්නවා. පාර්ලිමේන්තුවේ 225 ක් ඉන්නවා. එතකොට මේ නීති පොතට ඇයි ඇතුළත් කරලා නැත්තේ? ඇමතිවරුන්ගෙන් වාචිකව ප්‍රශ්න අහන්න අවස්ථාවක් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක බලන්න දෙන්නම්. අපි ඒ ප්‍රශ්නය -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේවා රීති පොතට ඇතුළු කරන්න ඕනෑ. ඒක මම මේ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට බොහොම ස්තුතියි. ඔබතුමා කරපු යෝජනාව අපි රීති කාරක සභාවට යොමු කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, බාධා කරපු නිසා දෙන්න බැරි වුණා. ඒ ලිපිගොනු ටික සභාගත [8] කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන්නේ, මම ප්‍රමුඛ මේ සියලුම මන්ත්‍රීවරුන්ට බලපාන දෙයක්. ලංකාදීප ඉරිදා පුවත්පත නොවෙයි. ඊට පෙර ලංකාදීප පුවත්පතේ සඳහන් වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ගරු ජනාධිපතිතුමාව මුණ ගැසුණාය කියලා. අපේ මහ ඇමතිවරයා පිළිබඳව කථා කරන්නත්, ඒ පිළිබඳව සාකච්ඡා කරලා තොරතුරු ලබා ගැනීම සඳහා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මේකේ සඳහන් කරලා තිබෙනවා ඒ ගිය මන්ත්‍රීවරන්ට ෆයිසර් මුස්තාපා ගරු ඇමතිතුමා හරහා ලක්ෂ 20 ක මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව, නැත්නම් මේ අවුරුද්දේ ලබා දෙනවාය කියලා. ඉතින් එහෙම ඒ පාර්ශවයට පමණක් ලබා දෙනවා නම්, අපි මන්ත්‍රීවරු හැටියට අපේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක්. ඒ ලබා දීම ඉතාමත්ම උචිතයි. අපටත් ඒ දේ කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉල්ලීම කරන්න. ඒක අපි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

18 ක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ මතු වී ඇති ගැටළුව සම්බන්ධව මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ඔබතුමාත්, ඒ වාගේම මේ ගරු සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුනුත් දකින්න ඇති පසුගිය දින කිහිපය තිස්සේම කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ බරපතළ නොසන්සුන්කාරී තත්ත්වයක් මතු වෙලා තිබුණු අයුරු. අපි දන්නවා, කොට්ටාව ධර්මපාල කියලා කියන්නේ ගරු සභාපතිතුමනි, ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමනි, මහ ඇමතිතුමනි, බස්නාහිර පළාතේ තිබෙන පළාත් සභා පාසල් අතර ඉතා ඉහළ නමක් රඳවා ගත්ත, ඉතා ඉහළ දියුණුවක් සහිත පාසලක්. ජාතික පාසල් හැරුණාම බස්නාහිර පළාතේ තිබෙන ඉතා හොඳ අධ්‍යාපනයක් සහිත පාසලක්. ඒ නිසාම මේ පාසල අරාජික නොවී මේ පාසලේ පරිපාලනය බිඳ නොවැටී, මේ පාසලේ සිසු දරුවන්ගේ විනය බිඳ නොවැටී මේ පාසල ආරක්ෂා කර ගැනීමේ වගකීම මම හිතනවා, මේ පළාතේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට වාගේම අධ්‍යාපන බලධාරීන්ට වාගේම අපි හැමෝගේම වගකීමක් ලෙස පවතිනවා කියලා. නමුත් දැන් මේ වන කොට මේ පාසල සම්බන්ධයෙන් සමහර අධ්‍යාපන බලධාරීන්, ඒ වාගේම මේ සමහර දේශපාලන බලධාරීන් කටයුතු කරමින් තිබෙන්නේ, ඒ වගකීමෙන්

[8] හැන්සාඩ් අංශයේ තබා ඇත.

[ගරු මහින්ද ජයසිංහ]

බැහැරව කියලා තමයි මම විශ්වාස කරන්නේ. පසුගිය සති තුනක වාගේ කාලයක් තිස්සේ මේ පාසලේ තාවකාලික විදුහල්පතිවරයා විධියට වැඩ කරපු විදුහල්පතිතුමා ගුරුවරුන්ගේත්, ඒ වාගේම දෙමව්පියන්ගේත් බහුතරයකගේ - මම කියන්නේ නැහැ, 100% ක් කියලා. නමුත් බහුතරයකගේ යම් විශ්වාසයක් දිනා ගෙන වැඩ කරමින් හිටියා. ඒ අතරේ තමයි පසුගිය මාර්තු 02 වැනිදා මෙම විදුහල්පතිවරයා හදිසියේ ස්ථාන මාරු කරලා යවන්නේ. එම තාවකාලිකව වැඩ කරමින් හිටපු විදුහල්පතිවරයා ස්ථාන මාරු කරනවා නම්, ඔහුව ඉවත් කරනවා නම්, තාවකාලික විදුහල්පතිවරයෙක් ඉවත් කරලා සුදුසුකම් සහිත විධිමත් ලෙස පත් කරපු විදුහල්පතිවරයෙක් පත් කරන එකට අපි 100% ක් එකඟයි. නමුත් එසේ නොකර මේ තාවකාලිකව පත් කරපු විදුහල්පතිවරයා හදිසියේ ස්ථාන මාරු කරනවා. හදිසියේ ස්ථාන මාරු කරලා, මෙම විදුහලට දේශපාලන උවමනා එපාකම් මත විදුහල්පතිවරයෙක් පත් කරනවා. ඒ හරහා තමයි මේ ගැටළු මතු වෙන්නේ. ඊට පස්සේ පාසලේ ශිෂ්‍යයෝ කාර්යාලයට පහර දීලා, කාර්යාලය කඩා බිඳ දාලා බරපතළ කලබැගෑනියක් පාසල තුළ සිදු වෙනවා. පාසලේ සහකාර විදුහල්පතිවරයෙකුට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න. විනාඩි 03 ඉවරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තව විනාඩියක් දෙන්න. ඒ නිසා මම විශේෂයෙන්ම වගකීමකින් යුතුව ඉල්ලා සිටිනවා. මම කලිනුත් සඳහන් කළා වාගේ කොට්ටාව ධර්මපාල කියන කීර්තිමත් විදුහල. ඒ විදුහලේ පරිපාලනයත්, අධ්‍යාපනයත්, ඒ සිසු දරුවන්ගේ අධ්‍යාපන අයිතියත් රැක ගත යුතුයි. ඒ නිසා මේ පාසලට සුදුසුකම් සහිත විදුහල්පතිවරයෙකු වහාම පත් කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම මේ මොහොතේත් කරනවා. ඒ අවධාරණය මේ මොහොතේ කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම පළාතේ දේශපාලන බලධාරීන්ගේ මැදිහත් වීමෙන් දේශපාලන උවමනා එපාකම් මත මේ පාසලට ඇඟිලි ගහන එක වහාම නතර කරන්නය කියන බල කිරීම මම මේ මොහොතේ කරන්න කැමැතියි. මොකද, එසේ නොකළොත් තවදුරටත් මේ පාසල අරාජික වෙන්න පුළුවන්. ඒ වාගේම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය දේශපාලන වුවමනා එපාකම් මත කටයුතු කරමින් මේ පාසලේ පරිපාලනය අරාජික කරනවා. ඒක වහාම නතර කරන්න මේ පළාත් සභාවේ විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා වහාම මේ පාසලේ පරිපාලනයත්, අධ්‍යාපනයත් යථාවත් කරන්න අවශ්‍ය කරන පියවර ගන්නය කියන ඉල්ලීම මේ මොහොතේ කරන්න කැමැතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපේ ඒ ඉස්කෝලේ ගැන. මේකේ තිබෙනවා, සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා. සම්මුඛ පරීක්ෂණයෙන් පළමුවැනියා වුණු කෙනාට දීලා නැහැ මේකේ. දෙවැනියා වුණු කෙනාට දුන්න නිසා තමයි මේ අර්බුදය ආවේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ නීති දෙකක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ අධ්‍යාපන ඇමතිතුමාට මම දන්නේ නැහැ මොනවාද තේරෙන්නේ කියලා. සම්මුඛ පරීක්ෂණයක් තියලා, එයා තෝරලා තිබෙනවා. ඒ තෝරපු විදුහල්පතිවරයා පත් නොකරපු නිසා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ඉස්කෝලේ දීප්තිමත් ඉස්කෝලයක්. මේ පාසල -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වරප්‍රසාද ප්‍රශ්නයක්. මට තිබෙන්නේ රීති සම්බන්ධව ප්‍රශ්නයක්. මගේ නොවෙයි. පොදුවේ. සභාවේ. මෙහෙම

නැගිට නැගිට හැම එකකටම තප්පුලන කොට මේ සභාව ගෙනියන්න පුළුවන්ද කියලා මට කියන්න. මේ වැඩේ හැමදාම කරන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මූලාසනයෙන් බැහැලා තමයි වැඩේ කරන්න තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයෙක් ඉන්නවා. සභානායකවරයෙක් ඉන්නවා. සභාව පාලනය කරන්න බැහැ. දෙන්නාම බලාගෙන ඉන්නවා. ආයිත් නැගිට්ටා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පොඩ්ඩක් ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. මීළගට, බස්නාහිර පළාත් සමුපකාර ව්‍යාපාරය අනතුරට ලක් වෙමින් පවතින බැවින් ගරු සමුපකාර ඇමතිතුමාගේ අවධානයට. ගරු හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක් ලබා දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම විශේෂයෙන්ම සමුපකාර ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ. බස්නාහිර පළාතේ කීර්තිමත් සමුපකාර සේවයක් තිබුණා. දැන් සියලුම සමුපකාර වාගේ - එකක් දෙකක් හොඳ තත්ත්වයේ තිබෙන්න පුළුවන්. සියලුම සමුපකාර සමිති පරිහානියට යමින් පවතිනවා. සමහර ඒවා පරිහානියට ගිහිල්ලා ඉවරයි. මේ ඊයේ පෙරෙයිදා සමුපකාර කොමසාරිස්වරයා අන්තර්ජාලයට මුදා හැරපු සමුපකාරවල විස්තරයක් සමුපකාර සේවකයෝ මට ගෙනැල්ලා දුන්නා. කොමසාරිස්වරයා විසින් ඒ අන්තර්ජාලයට මුදා හැරපු විස්තර සත්‍ය නම් මම හිතන්නේ, විශාල අවධානමක තිබෙන්නේ සමුපකාරය. විශේෂයෙන්ම කොළඹ තිබෙන සමුපකාර සමිති 12 න් සියලුම සමිති වාගේ විශාල පාඩුවලට යන්නේ. ඇතැම් සමුපකාර සමිති පාරිභෝගික සේවාව විතරක් නොවෙයි. ග්‍රාමීය බැංකු සේවාව කෝටි ගණන් ණය වෙලා තිබෙන්නේ. බැරි වෙලාවත් මේ පාරිභෝගිකයෝ ස්ථාවර තැන්පතු ගත්තොත් සමුපකාර සේවය සම්පූර්ණයෙන් බිමට සමතලා වෙනවා. දහස් ගණනකගේ රැකියා - ලේකම්තුමා -

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගේ කථාවට ඇහුම්කන් දෙන්නේ නැත්නම් මමත් ඔබතුමාගේ කථාවට ඇහුම්කන් දෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා කියන්න. මම අහගෙන ඉන්නේ. ඔක්කොම රෙකෝඩ් වෙනවා නේ? මට මේ ඔක්කොම අහගෙන ඉන්නත් බැහැ ඉතින්. ඔය කියන ඒවා ඔක්කොම record වෙනවා. මම ටේප් එක බලන්නම්. ඔබතුමා කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මේ කියන්නේ පළාත් සභාව හැටියට අපි 104 දෙනාටම වගකියන්න වෙන කාරණාවක්. සමහර විට සමුපකාර අමාත්‍යවරයා, කොමසාරිස්වරයා, ලේකම්තුමා සියලු දෙනාටම හිරේ යන්නත් වෙන්න පුළුවන්. ඒ මොකද, මේ අහිංසක සමුපකාරිකයාගේ මුදල් අවභාවිතා කළොත්, මතක තියා ගන්න. FCID එකෙන් නොවෙයි ගෙනියන්නේ. කෙළින්ම පනත අනුව හිරේ යන්න වෙන්නේ. ඒකයි මේ අවදානම මම මේ සභාවට පෙන්වලා දෙන්නේ. මේ බලන්න පිළියන්දල විවිධ සේවා සමුපකාර සමිතියේ අවභාවිතය නිසා දැන් කොපමණ lost වෙලා තිබෙනවාද කිව්වොත් මිලියන 42 ක් පාඩුයි. සමහර විට කොළොන්නාවේ මිලියන 07 ක් පාඩුයි. ශ්‍රී ජයවර්ධනපුර මිලියන 1067 යි. මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ වාර්තාව මුදා හැරලා නැහැ. ඒක මොකද කියලා මම දන්නේ නැහැ. මහරගමට විශේෂයක් කරලා තිබෙනවා. මොරටුව විවිධ සේවා සමුපකාර සමිතිය කෝටි 65 ක් lost. ඒ වාගේම මම මෙහෙම ගිහිල්ලා, ගිහිල්ලා අන්තිමට එන්නේ බටහිර හේවාගම්කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය. ඒ කියන්නේ අපි නියෝජනය කරන කඩුවෙල විවිධ සේවා සමුපකාර සමිතිය. ඒකේ කෝටි 33 ක්, ඒ කියන්නේ මිලියන 3314 ක් පාඩුයි. මේ අනික් ඒවාටත් ඒ විදියට වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු සමුපකාර අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා. මේකට

[ගරු හෙක්ටර් බෙත්මගේ]

වර්තමාන ලේකම්වරියට වගකියන්න වෙන්නේ නැහැ. ඊයේ පෙරෙයිදා පත් වුණේ. සමූපකාර කොමසාරිස්වරයාටත් වගකියන්න පුළුවන් වෙයිද කියලා මම දන්නේ නැහැ. ඉතාම කෙටි කාලයක්. නමුත් මෙහෙම ගිහිල්ලා, ගිහිල්ලා සමූපකාරය බිමට වැටුණාම, අපි සියලු දෙනාටම ජනතාවට වගකියන්න වෙනවා. ඒ නිසා විශේෂයෙන් ඊට පෙර සූදානමක් හැටියට මම මේක අවධානය යොමු කරනවාය කියන කාරණාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි. (බාධා කිරීමක්) හෝමාගම විතරයි. මම ඒක නොකියා කිව්වේ. හෝමාගම විතරයි ටිකක් ලාභෙට යන්නේ. මොකද, මේකේ අමාත්‍යවරයෙක් ඉන්න නිසා ඒක කර ගෙන යනවා ඇති. ඒ අමාත්‍යවරයාගේ නමක් සඳහන් කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමා කියපු ඔක්කොම අහගෙන හිටියේ. මීළඟට න්‍යාය පත්‍රය අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනා දෙකක් තිබෙනවා. ඒත් එක්කම අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විනාඩියක් දෙන්න. මම ගියවරත් මේ සම්බන්ධවම 36(1) යටතේ ඉදිරිපත් කළා. සභා ලේකම් කාර්යාලයේ නවතා ඇති ¼ දීමනාව පිළිබඳව මමත් ගරු ආණ්ඩුකාරතුමා ළඟට ගිය මන්ත්‍රීවරයෙක්. තීන්දු වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක කරනවා සංවිධායකතුමා, නමුත් ඒක 36(1) නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මමත් ගියා නේ එදා ඒ රැස්වීමට. ඇයි තවම තීන්දු වෙලා නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ වැඬේ කෙරෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කෙරෙනවා කෙරෙනවා කිව්වාට නියෝගයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවත් කට්ටය ඉන්නවා. මමත් ඉන්නවා. මමත් උනන්දු වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මගේ ඉල්ලීමක්. කෙරෙනවා කිව්වාට කෙරෙන්නේ නැහැ නේ ගරු සභාපතිතුමා. මමත් ගියා නේ රැස්වීමට. වෙන ගේමක් මෙතැන තිබෙන්නේ. නිලධාරීවාදයක් මේ තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොමත් දෙනවා මේක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා, එතුමාට අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
# MOTION UNDER RULE NO : 107

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද, පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I

## සභාපති පළාත් කථානායක ලෙසත්, නියෝජ්‍ය සභාපති පළාත් නියෝජ්‍ය කථානායක ලෙසත් සංශෝධනය කිරීමටත්, අනිකුත් ධූරධාරී තනතුරුත් ඇතුළත් කරමින් පළාත් සභා පනත සංශෝධනය කිරීමට ඉල්ලා සිටීම

REQUESTING TO BE INCLUDED THE POSTS OF DESIGNATIONS OF CHAIRMAN AS THE PROVINCIAL LEADER OF THE HOUSE AND DEPUTY CHAIRMAN AS THE PROVINCIAL DEPUTY LEADER OF THE HOUSE AND TO BE AMENDED THE ACT OF PROVINCIAL COUNCIL

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, *“බස්නාහිර පළාත් සභාවේ සභාපති හා නියෝජ්‍ය සභාපති යන තනතුරු නාමයන් පළාත් කථා නායක හා පළාත් නියෝජ්‍ය කථා නායක වශයෙන් තනතුරු නාමයන් සංශෝධනය කිරීම සඳහාත්, පළාත් සභාවේ සභානායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන ධූරයන් පළාත් සභා පනතෙහි ඇතුළත් කිරීම සඳහා පළාත් සභා පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලෙසට බස්නාහිර පළාතේ පළාත් සභාව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටී.”*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙය කාලෝචිත යෝජනාවක්. අවුරුදු 30 ක පමණ සිට සම්ප්‍රදායිකව එන තනතුරු මේවා. මේ නාමයන් වෙනස් කරලා, මේවා සංශෝධනය කළ යුතුව තිබෙනවා. මෙය ස්ථිර කරනවා වාගේම මෙය පළාත් පාලන අමාත්‍යාංශයටත් නව සංශෝධන ව්‍යවස්ථා සංශෝධනයකට ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලීමක් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කිසියම් අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම පළාත් සභාවේ සභාපති, නියෝජ්‍ය සභාපති යන තනතුරු නාමයන් පළාත් කථානායක හා පළාත් නියෝජ්‍ය කථානායක වශයෙන් වෙනස් වීම සම්බන්ධයෙන් අපේ විරෝධයක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අනෙකුත් නිලතලයන් පළාත් සභා පනතේ නැති එකක් මේ කථා කරන්නේ. අනෙක් තනතුරු නාමයන් පළාත් සභා පනතට ඇතුළත් කිරීමට අදාළව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක තමයි යෝජනාව ගෙනාවේ මන්ත්‍රීතුමා. යෝජනාව ආවේ ඒකයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ සම්බන්ධව අපේ විරෝධයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විධියට, පළාත් සභාව සම්බන්ධයෙන් අපේ විවේචනයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තිබෙන විවේචනය වාගේම සභාපති සහ නියෝජ්‍ය සභාපති පනතින් ආපු එක ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අපේ ගැටළුවක් නැහැ. නමුත් ඊට එහා ගිය තනතුරු නිර්මාණය කරලා ඒවා පළාත් සභා පනතට ඇතුළත් කිරීමට අදාළ යෝජනාවක් එනවා නම්, ඒ යෝජනාව සම්බන්ධයෙන් අපේ විරෝධතාවයක් තිබෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

විරෝධතාවයට හේතුව මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි ඒක සටහන් කරන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපේ විරෝධතාවය සටහන් කර ගන්න ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ මේ සම්බන්ධව අපට තවදුරටත් විවාදයකට යන්න අවශ්‍ය වෙන්නේ නැති වෙයි. ජනතා විමුක්ති පෙරමුණේ විරෝධතාවය අපි සටහන් කරලා සභාවේ එකඟතාවය මත අපි -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, එතුමාට කෙටි පැහැදිලි කිරීමක් කරන්න දුන්නා වාගේම මමත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා රීති කෙසේ වෙතත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

දැන් මේකේ තනතුරු නාමය විතරනේ වෙනස් වෙන්නේ. මේකේ වෙනත් කිසි දෙයක් වෙනෙන් නැහැ. එයිනුත් බලාපොරොත්තු වෙන්නේ, මේ පළාත් සභාවට ගෞරවයක් ලබා දීමයි. හොඳම නිදර්ශනය තමයි අපි 1991 ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වනකොට අපට කිව්වේ, ප්‍රාදේශීය සභා සභික කියලා. මන්ත්‍රී කියලා කිව්වේ නැහැ. එවකට හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාට - එවකට මම සභාපතිවරයෙක් හැටියට ඉදිරිපත් කළා. ගරු ජනාධිපතිතුමනි, අපටත් මන්ත්‍රී කියන ගෞරවය ජනතාවගෙන් ලබන්න අවස්ථාවක් දෙන්න කියලා. එතුමා නිහතමානීව පිළි අරගෙන ප්‍රාදේශීය සභා පනත වෙනස් කළා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී කියන විධියට. ඉස්සෙල්ලා තිබුණේ සභික. ඉතින් ඒකේදී ජනතාවගෙන් ලැබුණු යම්කිසි විශේෂ සැලකිල්ලක්, ගෞරවයක් නිසාම, අපට පෙරලා සේවය කරන්න යම්කිසි අවස්ථාවක් ලැබුණා. ඒ නිසා අපි පෞද්ගලිකව ඔබතුමා ගැනවත්, නැත්නම් මේ යසපාල කෝරළගේ ගැනවත් නොවෙයි කථා කරන්නේ. ඔය පුටුව පළාත් සභාවේ කථානායක පුටුව කියලා කිව්වොත් සභාවටම ගෞරවයක්. ඔය පුටුවේ නියෝජ්‍ය සභාපතිවරයා, නියෝජ්‍ය කථානායකවරයා හැටියට ඉඳගත්තාම ඒකේ ගෞරවයත් අපටයි. අන්න ඒ ගෞරවය මේ උත්තරීතර සභාවට ලබා ගන්නයි මම හිතන්නේ මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි කවුරුත් මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්න ඕනෑ. හැබැයි මම දන්නා විධියට පක්ෂව ඡන්දය දුන්නා කියලා ඒක නීතිමය ලියවිල්ලක් වෙන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ ලියවිල්ල සංශෝධනය වෙන්න ඕනෑ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක මේක ඒ කෙටුම්පතට ඇතුළත් කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට සංශෝධනයක් ගෙන එන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් - බස්නාහිර පළාත් සභාවට විතරක් මේක කරන්න බැහැ. මේක පළාත් 09 ටම මේ යෝජනාව ගේන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වාගේම මේ තනතුරු සම්බන්ධ නාමය වෙනස් වුණත් මේකේ සංයුතියක් තිබෙනවා. මේක පිහිටුවා ගන්නා ආකාරය සම්බන්ධව. එතකොට මේ සභාවේ ඡන්දයකින් පිහිටුවා ගන්නා තනතුරු තිබෙනවා. එතකොට ඡන්දයකින් පිහිටුවා ගන්න තනතුරු සම්බන්ධව මෙන්ම මහජන ඡන්දයෙන් පත් වෙලා පක්ෂ නායකයෝ තෝරන විධියටත් වෙනසක් තිබෙනවා. එතකොට ඒ දෙකම සංශෝධනය නොවී මේ නාම වෙනස් කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. එතකොට ඒ දෙක සංශෝධනය වෙන්න ඕනෑ. ප්‍රධාන සංවිධායකවරයා පත් කර ගන්න ඕනෑ සභාවේ ඡන්දයකින්. එතකොට ඒකේ රීති මාලාවක් දාලා තිබෙනවා. එතකොට මේ රීතිත් එක්ක මේ දෙක එකට ගැළපෙන්න ඕනෑ. මෙන්න මේක කල්පනා කරලා, මේකට අපේ කිසිම විරෝධතාවයක් නැහැ. නමුත් මේක කෙරෙන විධිය තමයි මම මේ පැහැදිලි කරලා කිව්වේ. නැත්නම් අපට යෝජනාවක් සම්මත කරලා පත්තරේ නම දාගෙන පල් වෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

මේක මුළු පළාත් 09 ටම මේක කරන හැටි ගැනත් අපි කමිටුවක් පත් කරලා, ඒ නීතිරීති ටික බලලා ඒක පාර්ලිමේන්තුවට යවන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරගන්න ඕනෑ පළාත් පාලන ඇමැතිවරයා. එහෙම නැතුව මේක අපට කරන්න බලයක් නැහැ. අනෙක් පැත්තෙන් ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මේකත් කියන්න ඕනෑ. මහ ආණ්ඩුව දැන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට යනවා. පළාත් සංශෝධනයකුත් යනවා. එතකොට මේකට ඇතුල් කළා නම් මේ ප්‍රශ්නය නිකම්ම වෙනස් වෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, මේ රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධයෙන් අපි පක්ෂයක් විධියට අපේ ස්ථාවරය කියන්න ඕනෑ. මොකද, රාජ්‍ය සම්බන්ධයෙනුත්, ඒ වාගේම ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙනුත්, මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුව සම්බන්ධයෙනුත් අපි යම්කිසි සිද්ධාන්තයක් මතයි කටයුතු කරන්නේ. එතකොට ඒ සිද්ධාන්තයට අනුව, අපට පැහැදිලිව කියන්න වෙනවා. විශේෂයෙන් මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව පක්ෂයක් විධියට අපේ ස්ථාවරයක් තිබෙනවා. අපේ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ වාගේම විවේචනයක් තිබෙනවා. දැන් මේ උත්සාහ දරන්නේ, පවතින අපේ මහ ආණ්ඩුවේ පාර්ලිමේන්තුවට අනුකූල වන ආකාරයට මේ පළාත් සභාවේ තනතුරු සකස් කර ගැනීමේ උවමනාවක් මේක යට තිබෙන බව පේනවා. මේක අපි කිසිසේත් අනුමත කරන්නේ නැහැ. මොකද, මේ තිබෙන සභාපති, නියෝජ්‍ය සභාපති කියන තනතුරු වෙනුවට කථානායක, නියෝජ්‍ය කථානායක සහ අනෙකුත් තනතුරු පළාත් සභා පනතට ඇතුල් කර ගැනීම සඳහා කරන මේ යෝජනාව තුළ අපට පේනවා මේක යට කිසියම් ආකාරයකට බෙදුම් කඩනයක් ඇති කරන්නට උත්සාහ කරමින් තිබෙන බව. ඒක තුළ අපි දකින්නේ, ක්‍රමානුකූලව මේ පළාත් සභාවත් රටේ පාර්ලිමේන්තුවට අනුකූල ආකාරයට සකස් කර ගැනීමේ උවමනාවක්. ඒක නිසා පැහැදිලිව මේ ක්‍රමවේදය පිටිපස්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ මේ සභාවේ කරන්න එපා. මෙතැන එහෙම දෙයක් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක ඔබතුමන්ලාගේ වෙන්න පුළුවන්. මේක මගේ අදහස නේ? මේ යෝජනාව යට මට පේන අදහස මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම යටි අරමුණක් මේකේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක ඔබතුමන්ලාගේ අදහස වෙන්න පුළුවන්. නමුත් මේක යට තිබෙන අදහස ඉතා පැහැදිලියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යට මුකුත් නැහැ. යට කිසි දෙයක් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ එකඟතාවයක් නැහැ. මගේ විරුද්ධත්වය මේකට සටහන් කර ගන්න කියලයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සටහන් කර ගන්නවා. හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතුමා විරුද්ධ වුණත්, නැතත් වැඩක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. දැන් කීසැරයක් නැඟිට්ටද? හරි. තවත් මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරනවාද? යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ගෙන ආපු යෝජනාව සම්බන්ධයෙන් සභාවේ මතවාද කිහිපයක් ඉදිරිපත් වුණා. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරුද්ධතාවයක් නැහැ. පැහැදිලිව ඔබතුමන්ලාගේ විරුද්ධතාවයක් නැහැ නේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සභාපති තනතුර කථානායක හෝ වෙනත් ආකාරයකින් හඳුන්වන්න. නමුත් අනෙකුත් තනතුරු ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක සඳහන් කර ගන්නම්. මම හිතන්නේ අපි ඡන්දයකට යන්න අවශ්‍ය නැහැ. නමුත් විරෝධතාවයක් ආපු නිසා මට සිද්ධ වෙනවා සභාවේ එකඟතාවය විමසන්න. එම නිසා යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා ගෙන ආපු යෝජනාවට සභාවේ එකඟතාවය?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 40 යි, විරුද්ධව 07 යි, වැළකුණු 01 යි යනුවෙන් බෙදුණේය.***
*Accordingly Question put and the Council divided as per Rule No 61 (3), 40 for, 07 against and 01 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ පළමු යෝජනාව ඉදිරිපත් කිරීමට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඊත් එක්කම මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I
[ගණ පූරණය නොමැතිව කල් ගියේ ය.]
[POSTPONED AS QUORUM NOT BEING ACHIEVED]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇති කර ගනිමින් රටේ අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත් ගරු අග්‍රාමාත්‍යතුමාත් එක්ව යහපාලන රජයක් බිහි කරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරන මෙහෙවරට බස්නාහිර පළාත් සභාත් සභාව සිය ස්තුතිය පළ කර සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

*[විසින් ස්ථිර කරන ලදී.]*
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු සංවිධායකවරුන්ගේ කථික ලැයිස්තු ඉල්ලා සිටිනවා.

[පූ.භා.10.47]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වෙන්නේ ශ්‍රී ලංකාවේ ඇති වෙලා තිබෙන විධායක බලය දරන ජනාධිපතිතුමාත්, ව්‍යවස්ථාදායක බලය ලබා සිටින අග්‍රාමාත්‍යතුමාත් පිළිබඳව මේ විවාදයේදී අපේ රටේ ඇති වෙලා තිබෙන ක්‍රමවේදය පිළිබඳව යහපාලනයක් ඇති කර ගනිමින් බිහි කර ගත්තු රටක ජනතාවට ඇති වෙලා තිබෙන සේවාවන්, සංවර්ධනයට ඇති වුණු කරුණු කාරණා පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෝලීකරණය හා ශ්‍රී ලංකාව පිළිබඳව විද්වතුන් සහ ලෝකයේ ධනවත් ඒ වාගේම විද්වත්

පුද්ගලයන් නොයෙකුත් ආකාරයේ විග්‍රහයන් සිදු කොට තිබෙනවා. සංවර්ධනය කියන්නේ, ශ්‍රී ලංකාවේ ගෝලීකරණ සංවර්ධනය වර්තමානයේ ඔබ්බට ගිය සංකල්පයකි. සංවර්ධනය යනු රටක මූර්ත ජාතික නිෂ්පාදනයේ වරින් වර සිදු වන අඛණ්ඩ වැඩිවීමකි. නමුත් සංවර්ධනය වනාහි රටක ආර්ථික, සාමාජික, සංස්කෘතික, දේශපාලනික හා මානව යන සියලුම සංකල්පවල සිදු වන්නා වූ අඛණ්ඩ වර්ධනයක් පිළිබඳව මේ යෝජනාවේදී මා කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පසුගිය කාලයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයක් බිහි කර ගන්න අවස්ථාවේදී ජනාධිපතිතුමාත් අගමැතිතුමාත් අලුත් ක්‍රමවේදයක් මේ රටේ ඇති කර ගත්තා. මේ තනතුරු දෙක නම් වශයෙන් අපට ඕනෑ අයට ඉදිරිපත් කරන්නත් පුළුවන්. නම් වශයෙන් මා කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. මම පුද්ගලයින් ගැන නොවෙයි කථා කරන්නේ. තනතුරු පිළිබඳව. එහෙම නම් මෙන්න මේ ගෝලීයකරණය වූ ලෝකයේ ජාත්‍යන්තර සබඳතා දිනා ගැනීම පිළිබඳව අනාගතය සුරක්ෂිත කර ගැනීමට යහපාලනයක් බිහි කර ගන්නේ මොකටද කියන සංකල්පය පිළිබඳව අපි කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. පාර්ලිමේන්තුවේ, පළාත් සභාවල්වල, රටේ ජනතාව අතර මේ කතිකාව ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. අනෙක් පැත්තෙන් දේශපාලනික වශයෙන් අපි අරගත්තොත් එහෙම අද නිදහස ලබාගත්තු ශ්‍රී ලංකාවේ ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු වෙලා යහපාලන කියන රජයක් ඇති කරගෙන, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිනීන් පිළිබඳව සියලුම නීති සම්පාදන සකස් කරන කොට, යහපාලන රජය නීතියට ඉහළම තැන ලබා දෙන්න, පුරවැසියන්ට අයිතියක් ලබා දෙන්න කටයුතු සිදු කොට තිබෙනවා. අනෙක් පැත්තෙන් අරගෙන බැලුවාම පුරවැසියන්ට තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳව දීර්ඝ කාලයක් දැවැන්ත ගැටළුවක්ව ලංකාවේ පැවතුනා. ලංකාවේ පැවතුණු ඒ වැඩ පිළිවෙළට ජාතික සංහිඳියාව ඇති කර ගැනීමේදී, ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීමේදී අපට ගොඩක් වැඩ කටයුතු කරන්න සිද්ධ වුණා. මොකද, හේතුව මේ තනතුරු හොබවපු පුද්ගලයින් පළමුවෙන්ම ව්‍යවස්ථාදායක බලය, පසුව විධායක බලය 1977 න් පස්සේ හඳුන්වලා දුන්නා. ශ්‍රී ලංකාවේ ජනාධිපති ධූරය ස්ථාපිත කළා. ඒ ස්ථාපිත කරපු ජනාධිපති ධූරයේ පළමුවැනි ජනාධිපතිවරයා හැටියට වැඩ කටයුතු කරන්නේ, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා. එතුමාගේ ව්‍යවස්ථාදායකයේ අග්‍රාමාත්‍යවරයා හැටියට වැඩ කටයුතු කරන්නේ රණසිංහ ප්‍රේමදාස අග්‍රාමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ තනතුරු දෙකත් උපයෝගී කරගෙන ඇති කරගත්තු ජාත්‍යන්තර සම්බන්ධතාවයන් පිළිබඳව ඔබතුමාත් සමග කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

සංවර්ධනය කියන්නේ සමාජ සංවර්ධනය, තිරසර සංවර්ධනය, සදාචාර සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, මානව සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය කියලා කොටස් හයකට බෙදලා තිබෙනවා. මේ බෙදලා තිබෙන කොටස් හය පිළිබඳව අද දැවැන්ත කථා කිරීමකට ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක බලතල තිබෙන පාර්ලිමේන්තුව තුළ නොයෙකුත් මත දරන, නොයෙකුත් පක්ෂ නියෝජනය කරන සියලු දෙනාගේම අයිතිය පිළිබඳව කථා කරන්න අද පාර්ලිමේන්තුව ඉදිරිපත් වෙලා තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගණපූරණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. සභාවේ ගණපූරණය තිබෙනවා කියලා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.57 ට යළිත් රැස් විය.***

*Committee counted, and as it was apparent that there was no quorum in the Council the division bells were ordered to be rung.*
*Later, as quorum was not formed the Hon. Presiding Member, suspended the sitting temporarily and it resumed at 11.57 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගණපූරණය සම්පූර්ණ නිසා කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිවරයාත්, අග්‍රාමාත්‍යවරයාත් ජාත්‍යන්තර සම්බන්ධතා වැඩ දියුණු කර ගැනීම සම්බන්ධ මේ ලිපිය මම සභාගත කරනවා.[9] කාලය අනුව මේ අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර පිළිබඳව කෙටියෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. විදේශ සංචාරය ගිහිල්ලා තිබෙන්නේ, 2016 දී ස්විස්ටර්ලන්තයේ ලෝක ආර්ථික සමුළුවට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සම්බන්ධ වෙලා ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යවරුත්, අමාත්‍යවරුත්, විවිධ ආර්ථික සංවිධානවල සභාපතිවරුන්, නියෝජිතයින් හා වෙළඳ ප්‍රජාව හමුවේ සාකච්ඡා කිහිපයක් පවත්වලා තිබෙනවා. ඒ මගින් වර්ධනය වෙමින් පවතින සංවර්ධනයක් ඇති ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පහත ක්ෂේත්‍රයන්ට අවශ්‍ය සහාය ලබා දීමට එකඟ වී ඇත. මේ ස්විස්ටර්ලන්ත සංචාරයේදී එකඟ වෙලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා පනවා තිබුණු තහනම ඉවත් කරන්න.

ඒකේ දෙවැනියාට තවත් එකඟතාවයක් ඇති කරලා තිබෙනවා. ශ්‍රී ලංකාව හා නෙදර්ලන්තය අතර පවතින දීර්ඝ ඓතිහාසික සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීමේ අරමුණින් ගාලු වරායට අමතරව ශ්‍රී ලංකාවේ ඇති ඕලන්ද වරායන් අටක් සංවර්ධනය කිරීමට.

තුන, නෙදර්ලන්ත කණ්ඩායමක් සමග සාකච්ඡා කරලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂමතාවය ඇති කිරීමට සූර්ය කිරණ බලශක්ති ක්‍රමවේදය භාවිතය දුෂ්කර පළාත් සඳහා අනුරූපිත ආදී ක්ෂේත්‍රයන් සඳහා ඇති කිරීමට සහයෝගය ලබා දීම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2016 ජූලි මාසේ 07 වැනිදා සිට 19 වැනිදා දක්වා සිංගප්පූරු නිල සංචාරයක් ගිහිල්ලා තිබෙනවා. සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය සමග සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ පරිපාලන සේවයේ තත්ත්වය ඉහළ නැංවීම. එකේ හතර සිංගප්පූරුව සමග නව වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම. විවිධ පාසල් අධ්‍යාපනය අවසන් කළ ශ්‍රී ලංකා තරුණයින්ගේ අනෙකුත් කුසලතා වර්ධනය කර ගැනීමේ අරමුණින් 2016 අගෝස්තු මස සිට පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා සිංගප්පූරුවේ තොරතුරු දැන ගැනීමේ තාක්ෂණික අධ්‍යාපන සේවා සංවර්ධනය ශ්‍රී ලංකා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අභ්‍යාස ක්ෂේත්‍රයේ සහයෝගය ලබා ගැනීමත් ඉන් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ වාගේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ජාත්‍යන්තර සහයෝගය සංවර්ධනයේ වාර්තාව ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට මම ඉදිරිපත් කරනවා. ඔබතුමා අපි මන්ත්‍රීවරු 104 දෙනාට මේක ලබා දීමට අවශ්‍ය වැඩ කටයුතු කරන්න කියන එක මම බලාපොරොත්තු වෙනවා. ගෝලීයකරණ ලෝකයක ජාත්‍යන්තර සම්බන්ධතාවය තුළ අපට වැඩි වෙලා තිබෙන ඒවා පිළිබඳව වාර්තාවක් මගේ ළඟ තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකේ අපට තිබෙන්නේ, ගෝලීකරණයේ වාසි පිළිබඳවයි. මම පොඩි විස්තරයක් සඳහන් කරලා, මේකත් සභාගත කරනවා.[10] දේශීය ආයෝජන, නවීන තාක්ෂණය ගලා ඒම පිළිබඳව එක වැඩ සටහනක් අපට ගෝලීකරණයේ වාසි හැටියට ලබා දීලා තිබෙනවා. කලාපීය විවිධ සංගම් එකතු වීම තුළ මේ ගෝලීකරණය තුළින් අපට වාසි ඇති වෙලා තිබෙනවා. ජාත්‍යන්තර වෙළඳාම පදනම් කර ගත් දේශීය නිෂ්පාදන බිහි වීම පිළිබඳව වාසි ඇති වෙලා තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෝලීයකරණය තුළ දකුණු ආසියාවේ වර්ණාත්මක වෙළඳ ගිවිසුමක් සඳහා ඇති කරගත්තු ගිවිසුමේ සටහන් මම මේ සභාවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. යුරෝපා සංගමය EU සංවිධානය ඇති කර ගැනීමේ ගිවිසුම පිළිබඳව මේකේ සඳහන් කරලා තිබෙනවා. සාක් සංවිධානය පිළිබඳව සඳහන් කරනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ UNA එක පිළිබඳව ඒ වාර්තාවේ සඳහන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒකත් මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනීම සඳහා ඔබතුමාගේ මාර්ගයෙන් සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

---

[9] හැන්සාඩ් අංශයේ තබා ඇත.

[10] හැන්සාඩ් අංශයේ තබා ඇත.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජනාධිපති තනතුරත්, අග්‍රාමාත්‍ය තනතුරත් මේ ශ්‍රී ලංකාවේ එකට එකතු වෙලා යහපාලන ආණ්ඩුවක් තුළ ඇති කරගත්තු වැඩ පිළිවෙළේ දේශීය වාසිය පිළිබඳව කරුණු කිහිපයක් මේ ආකාරයට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රගති වාර්තාව ජනාධිපති කාර්යාලයේ සංවර්ධන විශේෂ ව්‍යාපෘති අංශය මෙහෙයවීම ලබන, ජනාධිපතිතුමා වශයෙන් අධීක්ෂණය කරන 2016 ප්‍රගති වාර්තාවයි. මේකේදී අපි ජාතික නිෂ්පාදන ජාතික වැඩ සටහන ඇති කරගෙන තිබෙනවා. පරිසර රක්ෂණ ජාතික වැඩ සටහන. මත්ද්‍රව්‍ය නිවාරණය කර ගැනීමේ ජාතික වැඩ සටහන. වකුගඩු රෝග නිවාරණය කිරීමේ ජාතික වැඩ සටහන. දරුවන් සුරකිමු ජාතික වැඩ සටහන. මේ වාගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නොයෙකුත් ආකාරයේ ව්‍යාපෘති අපි මේ යහපාලන රජයේ තිබෙන සබඳතාවය තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න අද අපේ රටේ තිබෙන සියලුම දේශපාලන පක්ෂවලට නිදහස දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ කථා කිරීමේ අයිතිය. ඊළඟට පිට පුරවැසියන්ට මේ පිළිබඳව දේශපාලන අධිකාරිය ඇහුම්කන් නොදීමක් කරනවා නම් උද්ඝෝෂණ පැවැත්වීමේ අයිතිය, නිදහස අද අපි ලබා දීලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අරගෙන බැලුවා අපේ මාධ්‍ය අංශයට ඕනෑම දෙයක් නිවැරදි කර ගැනීම, හරියාකාරව විවේචනයට ලක් වන කරුණු කාරණා රටේ පුරවැසියන්ට ලබා දීම සඳහා ඒ අයිතිය අපි ලබා දීලා තිබෙනවා. ඒ සටහන් මේ පොත්වල තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ විශේෂ සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම පිළිබඳව ජාතික නිෂ්පාදන ජාතික වැඩ සටහන් ආරම්භ කිරීම හා වප්මඟුල් උත්සවය ආදිය 2015 ඔක්තෝබර් මාසේ 15 වැනිදා කිලිනොච්චිය සහ වඩච්චි කියන ගම්මානවල පවත්වලා තිබෙනවා. උතුරු - නැගෙනහිර යුද්ධයක් පැවතුණු ප්‍රදේශවල වප් මඟුල් උත්සවයක් පවත්වන්න පුළුවන් තත්ත්වයට හිටපු විධායක ජනාධිපතිවරුත්, අද ඉන්න ජනාධිපතිතුමාගේත් සහයෝගය මත මෙවැනි වප් මඟුල් උත්සවයක් අපට යාපනේ ප්‍රදේශයේ නැත්නම්, උතුරු - නැගෙනහිර ප්‍රදේශයේ ඇති කිරීමට තිබුණු ප්‍රධානම අවිය සහ හයිය තමයි යහපාලන ආණ්ඩුවක තිබුණු ශක්තිය කියන එක මෙතැනින් අපි ඔප්පු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට දෙක. වස විස නැති රටක්, කෘෂිකාර්මික අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය. 2016 මාර්තු මාසේ 06, 07, 08 කොළඹ BMICH එකේ ප්‍රදර්ශනයක් පවත්වලා තිබෙනවා. ඒ පවත්වපු ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ හැම පක්ෂවලටම ඡන්දය දාපු පුද්ගලයින් ඇවිත් මේකේ ගුණාත්මකභාවය, මේකේ වටිනාකම, මේක කොළඹ BMICH එකේ සංවිධානය කිරීම තුළ ඇති වෙලා තිබෙන වාසිය පිළිබඳව අද මේ සභාවේ විවේචනය කරන්න, කථා කරන්න මම මේ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව දැවැන්ත අඩුපාඩුකම් තිබෙනවා. විශේෂයෙන්ම මම ඔබතුමාගේ මාර්ගයෙන් අර පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා විවේචනය කරන්න. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ, යහපාලන ආණ්ඩුවේ දර්ශනය. විවේචනය කර ගත්තු දේවල්වලින් ඉගෙන ගන්න හොඳ දේවල් රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒවා යහපාලන රජය භාරගන්න ලැහැස්තියි. අපි පුද්ගලයින් හැටියට නම් කරලා කථා කළොත් මම හිතනෝ අද මෙතැන ගණපූරණය වෙනස් වෙන්න සහයෝගය ලබා නොදී ඉදියි කියලා මම බලාපොරොත්තුවෙන් සිටිනවා.

මම මේක ගේන කොටත් අපේ පක්ෂ නායකයින් අපි ඔක්කෝම මේක බලාපොරොත්තු වුණා. මහින්ද රාජපක්ෂ මහත්තයාට අපි අගෞරව කරන්නේ නැහැ. අපි ගෞරව කරනවා. ඇයි ඒ? එතුමා විධායක බලතල පාවිච්චි කරපු ආකාරය, විධායක නීති උල්ලංඝණය වෙලා ගිහිල්ලා වුණු වැරැදිවලින් තමයි එතුමාට පාලනය අහිමි වුණේ. එතුමා ඒ පාලනය භාර අරගෙන එතුමාට ඉවත් වෙන්න සිද්ධ වුණේ, එතුමාගේ විධායක බලතලත් එක්ක ඇති කර ගත්තු ක්‍රමවේදවල අඩුපාඩු තිබුණු නිසයි. විධායක බලතල පාවිච්චි කරන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වාසනාවන්ත වුණා. දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ජනාධිපතිවරයෙකුට වැඩ කරන්න පුළුවන් අගමැතිවරයෙක් බිහි කර ගන්න බැරි වුණා. මෙන්න මේක තමයි ඇත්ත කථාව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඉන්න කොට එතුමිය දාගත්තා එතුමියගේ මව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැති කරලා. තනතුරට ශක්තියක් ලැබුණේ නැහැ. පුටුවට පුද්ගලයෙක් වාඩි කළා විතරයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඊට පස්සේ ආවා රත්නසිරි වික්‍රමනායක අගමැතිතුමා. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අගමැති දී.මු. ජයරත්න අග්‍රාමාත්‍යතුමා. [ගරු කිත්සිරි කහටපිටිය]

හැබැයි මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ විධායකයේ ගෝලයා ව්‍යවස්ථාදායකය වුණේ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ බුද්ධිය ගැන අපි විග්‍රහයක් කළොත් මම ඉතාමත් සතුටු වන පුද්ගලයෙක් තමයි, මේ රටේ ප්‍රධාන පක්ෂ දෙකක් තිබුණා. අපි සුද්දන්ගේ කාලයේ මේ පක්ෂ දෙකම අයවැය ඉදිරිපත් කරන කොට ශ්‍රී ලංකාව ණයයි කියලා කොහේවත් පෙන්නුවේ නැහැ. සුද්දන්ගේ කාලයේ පාලනය කරන කොට අද ඉන්න මැති ඇමැතිවරු එහෙම නැත්නම් පක්ෂ දෙකේ දේශපාලනය කරපු හොරු කියන අයව නීති අංශයට ගෙන ගියේ නැහැ. එදා විනිවිද භාවයක් තිබුණා. ඇත්ත කථා කිරීමේ ශක්තියක්.

විදේශ රටවල්වලට ලංකාවේ පොළවෙන් උපයා ගන්නා නිෂ්පාදන අරගෙන ගිහිල්ලා ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් තිබුණේ. හැබැයි, නිදහස අර ගත්තාට පස්සේ අපි ශ්‍රී ලංකාවේ සිංහලයින්ට සිංහ කොඩිය දාගෙන, අයිතිය තියාගෙන, භූමිය ලබාගෙන නිදහස ලබාගෙන ඡන්ද පාවිච්චි කිරීමේ අයිතිය ලබාගෙන පත් කරගත්ත පුද්ගලයින් අතර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තමයි වාසනාවන්තම අග්‍රාමාත්‍යවරයා හම්බ වුණේ. ඒ අග්‍රාමාත්‍යවරයා කරන වැඩ පිළිවෙළ පිළිබඳව මේ සටහන්වල තිබෙනවා. අපි වර්ණා කරන්න යන්නේ නැහැ. අඩුපාඩු තිබෙයි. අපේ පර්මිට් එක අපට ලබා නොදෙයිද කියන ප්‍රශ්නය හැමෝම අහනවා. මේ පර්මිට් එක ගැන අපි ඔක්කොම කථා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට මතක් කරලා දෙන්න කැමැතියි. අපේ අයිතීන් පිළිබඳව කප්පාදුවක් කරන්න, ආණ්ඩුව කිසිසේත්ම මේක ක්‍රියාවට නොනගන්නේය කියන කථාව ක්‍රියාත්මක කරන්නේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ යෝජනාවෙන් පස්සේ පර්මිට් එක හම්බ වෙයිද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැමෝම මේ යෝජනාවට ඡන්දය දුන්නොත් වැඩේ හරි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ සභාවට ඔබතුමා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමාට විපක්ෂ නායකකමවත් හම්බ වෙයිද දන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බලගතු ශ්‍රී ලංකාවක්, සැලසුම් සහගත ගමනක්, කාටත් යමක් කමක් ඇති ආර්ථිකයක් ලැබෙන එක පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙමින් යනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංවිධායකතුමා කිව්වා තව විනාඩි පහක් අපට ලබා දෙනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ බලගතු ශ්‍රී ලංකාව කියන පොත රට සංවර්ධනය කරන ආකාරය පිළිබඳව ඇස් දෙකට සහ අකුරු කියවන්න පුළුවන් මිනිස්සුන්ට කියවන්න මුද්‍රණය කරලා ලබා දෙන පොතක් විතරයි. මේ පොත ඉරුවා කියලා, මේ පොත පිච්චුවා කියලා මොනවක්වත් අපට කරන්න පුළුවන් දෙයක් නැහැ. මේකේ තිබෙනවා. රට, නිරිත දිග ආර්ථික කවුළුව කියලා තැනකට යොමු කරලා, ශ්‍රී ලංකාව ගැන ප්‍රස්ථාරයක් දාලා. අනික් පැත්තේ තිබෙනවා, ඊසාන දිග ආර්ථික කවුළුව කියලා කඳුරට ආර්ථික කවුළුව අධිවේගී මාර්ග, ලංකා සිතියමේ සටහන් කරලා තිබෙනවා. ඉතින් මේ පොත මේ සභාවට එවන්න මූලික හේතුව වුණේ, මේ යෝජනාව අපි සකස් කරලා

මේ සභාවට දැම්මාම ගරු අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් එතුමා මාව සම්බන්ධ කළා එතුමාගේ ලේකම් කාර්යාලයේ ඉන්න ලේකම්තුමාට. ඒ ලේකම්තුමා ළඟට ගිහිල්ලා මේ කරුණු කාරණා මම ඉල්ලා ගත්තා. ඊට පස්සේ මම ජනාධිපතිතුමාගේ කාර්යාලයට ගියා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාවත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාවත් අපට නම් වශයෙන් පුම්බන්න අවශ්‍ය වෙලා නැහැ. අපට අවශ්‍ය වන්නේ ලංකාවේ පුරවැසියන් හැටියට, අපේ ධනයෙන් නඩත්තුවන ජනාධිපති. කවුරුහරි. මේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලිවලින් ආරක්ෂාව, ඉන්ධන, යාන වාහන, ගුවන් පහසුකම්, හෙලිකොප්ටර් භාවිතා කිරීම මේ තනතුරට තිබෙනවා. මේ තනතුරට පුද්ගලයෙක් පත් කරන්න මේ මහජනතාවගේ සල්ලි කොපමණ ජනාධිපති මැතිවරණයකට වියදම් කරනවාද? එක පුද්ගලයෙක් සොයන්න.

අනික් පැත්තෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අග්‍රාමාත්‍යවරයා හැටියට එතුමාගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලය. අරලිය ගහ මන්දිරය පාවිච්චි කරන්නේ මහජනතාවගේ යහපත සඳහා පාවිච්චි කරන කාර්යාලයක් හැටියට. ඉස්සර ඒ විධියට පාවිච්චි වුණේ නැහැ. මේක නිල නිවසක් වුණා. අද ජනාධිපතිතුමාගේ නිල නිවස එතුමා පාවිච්චි කරන්නේ නැහැ. ආර්ථිකයේ තිබෙන කඩා වැටීම උඩ ඒ වියදම් අඩු කර ගැනීමේ අරමුණින් තමයි ඒවාට ගිහිල්ලා බුදිය ගන්නේ නැතිව වියදම අඩු කරන්න කථා කරන්නේ. අනික් පැත්තෙන් අගමැතිවරයාගේ ආරක්ෂාව, ජනාධිපතිවරයාගේ ආරක්ෂාව අඩු කරලා තිබෙනවා. අනික් පැත්තෙන් මේ රටේ පුරවැසියන්ගේ දේපළවල් සංවිධානය කිරීම පිළිබඳව කටයුතු කරන කොට ඒවා හරියාකාරව ක්‍රියාත්මක කරන්නය කියලා නීතියට බලයක් දීලා තිබෙනවා. අනික් පැත්තෙන් ඕනෑ විධියට සත්‍යය ලියන්න මාධ්‍යවේදීන්ට නිදහස දීලා තිබෙනවා. සත්‍යය ජනතාවට තේරුම් කරලා දෙන්න විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය දෙකම පාවිච්චි කරන්න ඉඩ දීලා තිබෙනවා. අනික් පැත්තෙන් ගරු ජනාධිපතිතුමා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, නමට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වුණාට එතුමාට බලය තිබෙන්නේ, විධායක ජනාධිපතිවරයා හැටියට තමයි. දේශද්‍රෝහීන් හැටියට හිටපු පුද්ගලයින් - සුද්දෝ දේශද්‍රෝහීන් හැටියටයි අපේ පුරන්අප්පුලාව නම් කරලා තිබුණේ. මේ ජනාධිපති කමේ තිබෙන බලය උපයෝගී කරලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ වීරයින්ව සිංහල ජාතියට, ජාතික වීරයෝ හැටියට නම් කරනු ලැබුවා. ඉතිහාසයේ සුද්දන්ගේ පනතින් තිබුණු දේ ඉවත් කරලා මහනුවර මඟුල් මඩුවට ගිහිල්ලා ඒ ඓතිහාසික ගිවිසුම අත්සන් කරලා, අපේ ජාතියට ඒ අනන්‍යතාවය ඇති කරලා දුන්නා. මේ තමයි විධායක බලතලත් එක්ක කථා කරපු දේවල්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අගමැතිතුමා කරලා තිබෙන කාර්යය පිළිබඳව බැලුවාම ඒ සටහන් සියල්ලක්ම මම සභාගත කරනවා.[11] ඒ සියලුම දේවල්වලින් එතුමාගේ විනිවිද භාවය පෙනෙන, බුද්ධිය උපයෝගී කරගෙන දේශපාලන පක්ෂ හදන්නේ නැතිව, දේශපාලනය කරන්න ඕනෑ වෙලාවට දේශපාලන පක්ෂත් එක්ක වැඩ කරනවා. රටේ ආර්ථිකය සහ දියුණුව ඇති කරන්න ඕනෑ වෙලාවට හැමෝටම සහයෝගයෙන් වැඩ කටයුතු කරන්න අවස්ථාව රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා හදලා තිබෙනවා. එහෙමනම් ඒ තනතුර එදා හොබවපු අගමැතිවරුන් ගැන අපහාසයට මම කථා කරන්නේ නැහැයි කියන එක හිතාගන්න කියලා මම ඔබතුමන්ලාට කියනවා. ප්‍රයෝජනය ද? අප්‍රයෝජනයද වුණේ කියන එක. එහෙමනම් මීට වැඩිය මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. තවත් කථිකයන් මේ ගැන කථා කරයි. අපි ඒ කථා අහමු. මේ සියල්ලක්ම මම සභාගත කරනවා. ගෞරවයෙන් ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීම් කරනවා. මේවා කියවලා බලලා හොඳ දේ අරගන්න. නරක දේට ඕනෑ තරම් අපට බණින්න. අපහාස කරන්න. ප්‍රශ්න කරන්න. පරද්දන්න හදන්න. ඒකට අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපට ඕනෑ රට හදලා ජනතාවට සහන දීමට. ඒකීය රටක් තුළ ශ්‍රී ලංකාව දියුණු කරන්න ඕනෑය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.36]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින්, "*මේ ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇති කර ගනිමින් අනාගතය සුරක්ෂිත කර ගැනීමට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් එක්ව මේ යහපාලන රජය බිහි කරමින් රටේ*

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

[11] හැන්සාඩ් අංශයේ තබා ඇත.

*ජනතාව වෙනුවෙන් ඉටු කරන මෙහෙවරට බස්නාහිර පළාත් සභාවේ ස්තුතිය පළ කර සිටියි"* කියන මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. නමුත් මේ යෝජනාව ගෙන ආ අවස්ථාවේදීම මේ සභාව තුළ ඇති වූ ව්‍යාකූල තත්ත්වය පිළිබඳව පළමුවෙන්ම මගේ කනගාටුව පළ කරන්න කැමැතියි. දැන් මේ යෝජනාවට ප්‍රථම යෝජනාවකුත් ගෙනාවා. ඒ යෝජනාවේදී ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් දෙගොල්ලෝම බොහොම සමගියෙන්, එකඟතාවයෙන් තමන්ගේ තනතුරු, තාන්න මාන්න සඳහා, මේ පළාත් සභා පනතට ඒවා ඇතුළත් කර ගැනීම සඳහා බොහොම සමගියෙන් එකමුතුව කටයුතු කළා. මෙතැන මේ ඒකීය රටක් තුළ කියලා ඉදිරිපත් කරලා තිබෙනවා. බෙදුම්වාදය බස්නාහිර පළාත් සභාව ඇතුළෙන් ආවත්, නැගෙනහිර පළාත් සභාවෙන් ආවත්, උතුරු පළාත් සභාවෙන් ආවත් ජාතික හෙළ උරුමය ඒකට ප්‍රතිපත්තියක් වශයෙන් විරුද්ධයි. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න හරි, රටේ සමාජයේ ඒකාබද්ධතාවය, ජාතික ඒකාග්‍රතාවය, ජාතික සංහිඳියාව, සමඟිය ගොඩනඟන්න, ඒ වාගේම රටේ සංවර්ධනය දියුණුව ඉස්සරහාට යන්න නම් මධ්‍යගත ශක්තිමත් රාජ්‍යයක් අවශ්‍යයි. දැන් මේක ඇතුළේ මේ පෙනෙන්න තිබෙන්නේ බෙදුම් වාදයේ දිශාවට තමයි වැඩි වැඩියෙන් නැඹුරු වෙමින් තිබෙන්නේ.

ඒ කියන්නේ සමාජයීය වශයෙන් ගත්තාම, ආර්ථික වශයෙන් ගත්තාම බෙදුම්වාදය ශක්තිමත් වන පැත්තට යෝජනා ඉදිරිපත් වෙනවා. කථානායක ධූරය, නියෝජ්‍ය කථානායක ධූරය, ඊළඟට පළාත් අගමැති ධූරයත් ඉල්ලා සිටියි. මේ පාර්ලිමේන්තුවට සමාන්තර පළාත් පාර්ලිමේන්තුවක් සකස් කර ගැනීමේ, ඊළඟට මුළු රටේම පාර්ලිමේන්තු නවයක් - මේක තමයි මේ ක්‍රමානුකූලව ගේන්නේ. මේක රටේ ආර්ථිකයේ සංවර්ධනයට පිටුබලයක් වෙනවාද? රටේ සංවර්ධනයට පිටුබලයක් වෙනවාද? මේ පළාත් සභාවලින් දිගින් දිගටම කරනු ලබන යම් යම් කෙනහිලිකම් නිසා රටේ සංවර්ධනයේ ඉදිරි ගමනට විශාල වශයෙන් බාධාවක් වෙලා තිබෙනවා කියලා දැනටමත් අපට පේනවා. ඒ වාගේම පැහැදිලිව අපි කියන්න ඕනෑ. නිදහසින් පස්සේ - අපි කියනවා, මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක මැතිතුමා මේ රටට නිදහස ලබා දුන්නාය කියලා. ඔව්. ලේ බිඳුවක්වත් නොසල්වා එතුමා නිදහස ලබා දුන්නා. හැබැයි, නිදහසින් පස්සේ වසර 69 ක් ගත වෙලා තිබෙනවා. මේ වසර 69 ඇතුළේ අපි ඕනෑ තරම් ලේ වගුරවලා තිබෙනවා. තරුණ කැරළි දෙකක් ඇති වුණා. 1971 දී. ඒ වාගේම 1988, 1989 දී. මේ කැරළි වලින් සිංහල තරුණයන්, ග්‍රාමීය සිංහල තරුණයන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් මිය ගියා. ඒ වාගේම තමයි මේ රට දෙකඩ කරලා වෙනම රාජ්‍යයක් හදා ගන්න කියලා සටන් කරපු උතුරේ දෙමළ තරුණයන් නොමඟ ගිහිල්ලා ඒ දෙමළ ජාතිවාදය, බෙදුම්වාදය ඔස්සේ ගිහිල්ලා අවුරුදු 30 ක් යුද්ධ කළා. රටේ ආර්ථිකය පස්සට ගියා. සංවර්ධනය පස්සට ගියා. රට අරාජික වුණා. අස්ථාවර වුණා. නැවත වතාවක් ඒ බෙදුම්වාදය පරාජය කිරීම සඳහා දහස් ගණනක් අපේ ආරක්ෂක හමුදාවලට ජීවිත පූජා කරන්න සිදු වුණා. ඒ බෙදුම්වාදය දුර්වල කරලා රට ශක්තිමත් කරලා, රටේ ඒකාග්‍රතාවය ඇති කරලා, මධ්‍යගත භාවය ශක්තිමත් කරමින් තිබෙන අවස්ථාවක නැවත වතාවක් බෙදුම්වාදයේ දිශාවට කවුරු හරි යෝජනා ගේනවා නම් ඒක බස්නාහිර පළාතින් ගෙනාවත්, උතුරු පළාත් සභාවෙන් ගෙනාවත්, ඒ සියල්ලට අපි විරුද්ධයි. ඒකයි අපේ සිද්ධාන්තය. ඒ නිසයි මීට කලින් ගෙනාපු යෝජනාවට ප්‍රතිපත්තියක් විධියට මම විරුද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1977 න් පස්සේ මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් අපි විවිධ අදහස් පළ කරනවා. විශේෂයෙන්ම වෙළඳ පොළ ආර්ථික ක්‍රමය අද ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම පිළි අරගෙන තිබෙනවා. හැබැයි, වෙළඳ පොළ ආර්ථිකය ඇතුළේ රට ඉස්සරහාට ගෙනි යන්න නම් රටේ ස්ථාවර භාවයක් අවශ්‍යයි. රට ස්ථාවරව තිබෙන්න නම් මේ විධායක ජනාධිපති ක්‍රමය තිබෙන්න ඕනෑ. මේ විධායක ජනාධිපති ක්‍රමය මත තමයි මේ රටේ ස්ථාවර භාවය රැඳිලා තිබෙන්නේ. එහෙමනම් විධායක ජනාධිපති ක්‍රමය දුර්වල කරන්න, ව්‍යවස්ථා සංශෝධන ගෙනෙන්න කියලා කවුරු හරි යෝජනා කරනවා නම්, ඒ හැම එකක් ඇතුළේම සිදු වන්නේ රට තව තවත් අස්ථාවර වෙමින් රට ඇතුළේ සමාජයීය බෙදුම්වාදය ශක්තිමත් වෙන එකයි. වාර්ගික බෙදුම්වාදය ශක්තිමත් වෙන එක. භාෂාමය පළාත් වශයෙන් බෙදුම්වාදය ශක්තිමත් වන එක. ආර්ථික බෙදුම්වාදය ශක්තිමත් වන එක. අද මේ කලාපයේ තිබෙන සියලුම රටවල් ඉස්සරහාට ගියේ, තායිලන්තය, කොරියාව, මැලේසියාව, ඒ වාගේම සිංගප්පූරුවේ ලී ක්වාං යූ ලා ඒ රටවල් ගොඩනැඟුවේ ශක්තිමත්, ස්ථාවර දේශපාලන

ප්‍රතිපත්තියක් මත නිසයි. දැන් එවැනි ස්ථාවර දේශපාලන ප්‍රතිපත්තියක් නැහැ. හැබැයි, මම කියන්න ඕනෑ. යහපාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තිබුණු පමණින් රටේ ජනතාවගේ ආර්ථික ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබෙනවා. අද ප්‍රජාතන්ත්‍රවාදය දෝරේ ගලනවා. ඒකේ රතු ඉර පැනලා තිබෙන්නේ. අද ඕනෑම කෙනෙක් හැම ප්‍රශ්නයක්ම විසඳගන්න මහ පාරට එනවා. රට ඇතුළේ අපට පේනවා දිනපතා, පසුගිය මාසයේ කොළඹ නගරයේ පෙළපාලි, උද්ඝෝෂන, පාගමන් විතරක් 66 කට ආසන්න ප්‍රමාණයක් පැවැතිලා තිබෙනවා. කොළඹ නගරයේ වැඩ කටයුතු අඩාල වුණා. අරාජික වුණා. අස්ථාවර වුණා. මේ රටට එන ආයෝජකයන් කවුද? පසුගිය වසර ඇතුළත පමණක් අපට ලැබිලා තිබෙන අයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 350 යි. අපි කථා කරන බුරුමයට ඩොලර් මිලියන 8500 ක් ගිහිල්ලා තිබෙනවා. වියට්නාමයට ඩොලර් මිලියන 15,000 කට ආසන්න ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙනවා. ලංකාවට ආයෝජකයන් එන්නේ නැත්තේ ඇයි? රටේ දේශපාලන ස්ථාවර භාවය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. යහපාලනය කියලා කියන්නේ, No Governors නොවෙයි. අද මේ රටේ පාලනයක් නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පාලනයක් ඇති කරන්න ඕනෑ. පාලනයක් නැතිව රටක් ගෙනි යන්න බැහැ. Good Governors හදන්න කලින් governors තිබෙන්න ඕනෑ. ඒ නිසා අද එක පැත්තකින් අපට පේනවා. දේශපාලන අධිකාරිය අකර්මන්‍ය වෙමින් නිලධාරි වාදයක් රට තුළ ස්ථාවර වෙලා තිබෙනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදය දුන්නා. ස්වාධීන කොමිෂන් සභා හැදුවා. ඒ ස්වාධීන කොමිෂන් සභා ඇතුළේ අද ඉස්සරහාට එමින් තිබෙන්නේ, නිලධාරී වාදයක්. එහෙමනම් මේ නිලධාරී වාදය ඇතුළෙත් රටක් ඉස්සරහාට ගෙනි යන්න බැහැ. දේශපාලන අධිකාරිය ඇතුළේ ප්‍රශ්නයක් තිබෙන බව ඇත්ත. හැබැයි, මේ දෙක අපි තුලනය කර ගත්තේ නැත්නම්, කළමනාකරණය කර ගත්තේ නැත්නම් රටක් විධියට අපට ඉස්සරහාට යන්න බැහැ.

ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ. අද රට ආර්ථිකමය වශයෙන් විශාල අර්බුදයක තියෙන්නේ. ඒකේ ඇත්ත සංඛ්‍යා ලේඛන අපි රටට කියන්න ඕනෑ. හැබැයි, ඒ සංඛ්‍යා ලේඛන හැමදාම ඉදිරිපත් කර කර ඉඳලා වැඩක් නැහැ. මේකට අපට උපාය මාර්ගයක් තිබෙන්න ඕනෑ. සැලැස්මක් තිබෙන්න ඕනෑ. රට කොහාටද අපි ගෙනි යන්නේ? ආයෝජකයන් හතර පස් දෙනෙක් ආවා. ඒ ආයෝජකයන් සියලු දෙනාගේ බලාපොරොත්තු අද සුන් වෙලා තිබෙනවා. කුලියාපිටියට ආයෝජනයක් ගෙනාවා. හොරණට ටයර් කර්මාන්ත ශාලාවක් ගෙනාවා. ඒ වාගේම හම්බන්තොට වරාය සම්බන්ධයෙන් තීරණයක් ගන්න බැරිව තවමත් ඒක එක තැන පල් වෙවී තිබෙනවා. එහෙමනම් කොහොමද මේ රටේ ආර්ථිකය ඉස්සරහාට ගෙනි යන්නේ? ආර්ථිකයේ මහා මොළකාරයෝ ඔස්තාර්ලා ඉන්නවා කියනවා නම්, ඒ අයට පුළුවන් වෙන්න ඕනෑ මේ වෙලාවේ මේ ආර්ථිකයේ පිම්ම පනින්න. හැබැයි, ඒ ආර්ථික පනින්න පුළුවන් ආකාරයේ ශක්‍යතාවයක්, හැකියාවක්, කුසලතාවයක් මේ දක්වා පෙන්වලා නැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා. අද ජනතාව අතර විශාල වශයෙන් ඉච්ඡාභංගත්වයක් ඇති වෙලා තිබෙනවා. අසහනයක්, කළකිරීමක් ඇති වෙලා තිබෙනවා. ඇයි අපට ආර්ථිකයේ ඉක්මන් පිම්මක් පනින්න බැරි? ඒ ඉක්මන් පිම්මක් පනින්න නම් ඒකට අවශ්‍ය කරන ආකාරයට ආර්ථිකය අපි සැලසුම් කරගන්න ඕනෑ. විදේශ ආයෝජකයන් එන්නේ නැත්තේ ඇයි? විදේශ ආයෝජකයන් එයිද? එන විදේශ ආයෝජකයන්ටත් ඒ අයට බැණලා, ඒ අයට ගල් ගහලා, හූ කියලා එලවනවා නම්, ඒ අය රට ඇතුළේ රස්තියාදු කරනවා නම් මොනම ආයෝජකයෙක්වත් මේ රටට එන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අද බංගලාදේශයට, වියට්නාමයට, බුරුමයට, කාම්බෝජයට අයෝජකයන් මේ රටේ තිබෙන ආයෝජනත් ගලවාගෙන යනවා. කර්මාන්තශාලා ගලවා ගෙන යනවා. එහෙමනම් අපි අලුතෙන් අපේ අයෝජන ක්ෂේත්‍රය පිළිබඳව අපි හිතන්න ඕනෑ.

ඒ වාගේම අතමයි, අපනයන ක්ෂේත්‍රෙය් අපි වෙළඳපොළ පුළුල් කරගන්න ඕනෑ. අලුත් අපනයන විධියට අපට මොනවද තිබෙන්නේ? තේ, පොල්, රබර්, ඇඟලුම්, ඒ වාගේම විදේශ ශ්‍රමිකයන්ගෙන් අපට ලැබෙන ආදායම හැරුණු කොට, අලුත් ආදායම් මාර්ගයක් අපි සොයාගෙන නැහැ. විදේශ විනිමය උපයන ක්‍රමයක් සොයාගෙන නැහැ. ඉතින් ඒ නිසා අපි පැහැදිලිව දකින්න ඕනෑ. නව උත්පාදනය සඳහා වූ නව ආර්ථික දැක්මක් අද අපට අවශ්‍යයි. ඒ වාගේම තමයි, හරිත ආර්ථිකය පිළිබඳව අපි කථා කරනවා. අපි කොහොමද අපේ රටේ මේ තිබෙන පිහිටීම ප්‍රයෝජනයට අරගෙන, මේ ඉන්දියානු සාගරය ඇතුළේ අපේ ආර්ථිකය ගොඩනඟාගන්න තිබෙන මේ ස්වර්ණමය අවස්ථාව ප්‍රයෝජනයට ගන්නේ. හැබැයි, ඒකට තිබෙන වැඩ පිළිවෙළ මේ රටේ තිබෙන ජාතික සම්පත් ටික, අපේ ජාතික

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ව්‍යාපාර ටික විදේශිකයන්ට විකුණා දාන එක නොවෙයි. තුට්ටු දෙකට කොල්ල කන්න ඉඩ දෙන එක නොවෙයි. ඒකට අපට සැලැස්මක් තිබෙන්න ඕනෑ. කොහොමද අපි මේ රට ඇතුළේ තිබෙන අපේ ජාතික සම්පත් නිසි පරිදි කළමනාකරණය කරගෙන විදේශීය සමාගම් එක්ක, කොම්පැණි එක්ක වෙන්න පුළුවන්. දේශීය ආයෝජකයන් එක්ක වෙන්න පුළුවන්. එකතු වෙලා මේවා ගොඩනඟන ක්‍රමවේදයක් ගැන සාකච්ඡා කරන්න ඕනෑ. එහෙම නැතිව අපි හැමදාම රට ණයයි, ණයයි කිය කියා සිට හරි යන්නේ නැහැ. මේ ණය උගුලෙන් කොහොමද ගොඩ යන්නේ. ඒකට වැඩ පිළිවෙළක් අපි යෝජනා කරන්න ඕනෑ. ඒ සඳහා ජනාධිපතිතුමායි, අගමැතිතුමායි අතර හොඳ සබැඳියාවක් තිබෙන්න ඕනෑ. එකඟතාවයක් තිබෙන්න ඕනෑ. මේක එළ හරකයි, මී හරකයි වාගේ යන්න බැහැ. ඒ නිසා පැහැදිලිව අපි කියන්නේ, මේ සඳහා එක වැඩ පිළිවෙළක් අවශ්‍යයි. එහෙම නැතිව අර පැත්තට අදින්නයි, මේ පැත්තට අදින්නයි මේ රට ඉස්සරහාට යන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක් දෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

විනාඩි දෙකක් වැඩිපුර දෙන්නේ, ආණ්ඩුවට ටිකක් බණින නිසාද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිව අපි කියන්න ඕනෑ. දැන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1977 විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දෙන කොට කෙටි කාලයක් ඇතුළත අපට 5% ක ආර්ථික වර්ධනයක් ඇති කරගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම විරැකියාව 4.2% ක් දක්වා පහත හෙළන්න පුළුවන්කම ලැබුණා. නමුත් ඒ ආර්ථිකය සමෘද්ධිය තිබුණේ, ඉතාම කෙටි කාලයයි. 1985 න් පසුව උතුරේ ඇති වුණු ඒ කැරැළිකාරී තත්ත්වයත්, යුධමය තත්ත්වයත් නිසා සම්පූර්ණයෙන්ම ආර්ථිකය අඩාල වුණා. ඒ වාගේම තමයි දකුණේ ඇති වුණු කැරැළිකාරී තත්ත්වය. ආර්ථිකය බිඳ වැටෙන්න ඒකත් හේතුපාදක වුණා. දැන් අපට මේ වෙළඳපොළ ආර්ථිකය ඇතුළේ යන්න පුළුවන් දුර අපි ගිහිල්ලා තිබෙනවා. දැන් අලුත් අදහසක් ඇවිල්ලා තිබෙනවා, මේ සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයකට යන්න ඕනෑය කියලා. ඒක ඇතුළේ තිබෙන්නේ සියලු දෙනාටම පොදු යහපත, සමාජ සාධාරණත්වය ඉෂ්ට වන, සියලු දෙනාටම යමක් කමක් ලැබෙන ආර්ථිකයක් ගොඩනැඟීමේ වැඩ පිළිවෙළක්. ඉතින් ඒ පිළිබඳව අද සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ මේ රටේ ආර්ථිකය ඉස්සරහාට ගෙනියන්න අද පැහැදිලි දැක්මක්, දර්ශනයක්, වැඩ පිළිවෙළක් අවශ්‍යයි. එක එක්කෙනා එක එක ඒවා කියලා හරි යන්නේ නැහැ. ඒ නිසා පැහැදිලිව මේ වැඩ පිළිවෙළ ඉස්සරහාට යා යුතුයි.

ඒ වාගේම තමයි මේ යහපාලන ආණ්ඩුව යටතේ අපි සියලු දෙනාගේම ප්‍රාර්ථනාව වුණේ, දූෂණය පිටු දැකීම. වංචාව, දූෂණය පිටු දැකීම. හැබැයි, වංචාව, දූෂණය පිටු දැකීම සඳහා ආපු ආණ්ඩුවක් විධියට අද අපට එල්ල වෙලා තිබෙන බරපතළ චෝදනාවක් තමයි මේ බැඳුම්කර මගඩිය. දැන් මේ සම්බන්ධයෙන් අද දක්වාම නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වෙලා තිබෙනවා. අවුරුදු දෙකක් ගත වුණා. මේ පිළිබඳව කොමිසන් ගණනාවක් පත් කළා. අපි දන්නවා, පාර්ලිමේන්තුවේ කෝප් සභාවේ වාර්තාව එළි දැක් වූවා. විගණකාධිපතිගේ වාර්තාව එළි දැක් වූවා. ඒ වාගේම මහ බැංකුවේ අභ්‍යන්තර වාර්තාව එළි දැක් වූවා. ඒ වාගේම දැන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන් මේ සියල්ල හෙළිදරව් වෙලා තිබෙනවා. හැබැයි තවමත් අපට පුළුවන් වෙලා නැහැ, හිටපු මහ බැංකු අධිපතිවරයා සම්බන්ධයෙන් තීරණයක් ගන්නත්. ඒ වාගේම Perpetual treasurys සමාගම සම්බන්ධයෙන් තීරණයක් ගන්නත් තවම පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒවායේ වත්කම් අත්සිටුවන්න, ඒ වායේ ගිණුම් අත්සිටුවන්න තවමත් තීරණයක් අරගෙන නැහැ. ඔවුන් නිදැල්ලේ තවම කටයුතු කරනවා. ඒ අයුතු විධියට උපායාගත්ත ධනය ඔවුන් රට ඇතුළේම ආයෝජනය කරමින් තිබෙනවා. ඒ නිසා අද අපි විශාල වශයෙන් ලැජ්ජාවට පත් වෙලා තිබෙන කාරණයක් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ Perpetual treasurys සමාගම සහ හිටපු මහ බැංකු අධිපතිවරයාගේ ක්‍රියා කලාපය. ඒ නිසා අවසාන වශයෙන් කියන්න ඕනෑ. අපි යහපාලනය ඇති කරන්න නම් දූෂණය පිටු දැකීම ප්‍රධානම අරමුණක්. හැබැයි, ඒක අපට සාක්ෂාත් කරගන්න පුළුවන් වෙලා නැහැ. ඒකට අපට පූර්වාදර්ශයක් ලබා දෙන්න පුළුවන්කමක් වෙලා නැහැ. ඒ වාගේම අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. අද විදේශීය වශයෙන්

අපේ රටට තිබෙන මේ බලපෑම, පීඩනය අපි තුනී කරගෙන තිබෙනවා. හැබැයි, ඒ උගුලෙන් අපට ගැලවෙන්න තිබෙන ස්වර්ණමය අවස්ථාවක් තිබෙනවා. අද ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් පැහැදිලිව ස්ථාවරයක ඉන්නවා. නමුත් විදේශ කටයුතු ඇමැතිවරයා මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය කිසිසේත් අපට අනුමත කරන්න බැහැ. ඔහුගේ පෞද්ගලික සිතැඟියාවන් මතයි ඔහු කටයුතු කරමින් තිබෙන්නේ. ඒක රටේ National Interest එක මත නොවෙයි. Human rights interest එක මතයි අද විදේශ කටයුතු ඇමැතිවරයා කටයුතු කරන්නේ. National Interest එක මත කටයුතු කරන්නය කියලා මේ මොහොතේ ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.51]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා අද මේ සභාවට ගෙනාපු යෝජනාව "*ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇති කර ගනිමින්, රටේ අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යතුමාත් එක්ක යහපාලන රජයක් බිහි කරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරන මෙහෙවරට බස්නාහිර පළාත් සභාවේ සිය ස්තූතිය පළ කළ යුතු යැයි*" කියන යෝජනාවට කරුණු කිහිපයක් එකතු කරමින් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ විශාල විපර්යාසයක් සිදු වුණා. ඒ වාගේම 2015 අගෝස්තු මාසයේ 17 වැනිදා එය තහවුරු කරමින් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත් වූවායින් පසුව තිබුණු ආණ්ඩුව නැත්නම් ජනාධිපතිතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ බලය අවසාන කරලා නව පාර්ලිමේන්තුවක් ස්ථාපිත කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා තමයි ජනාධිපතිවරයා හැටියට දිවුරුම් දුන්නේ. මේ රටේ සිවිල් සමාජ, ආගමික නායකයන්, විද්වතුන්, බුද්ධිමතුන් ඇතුළු සියලු ජන කොටස්වල කැකෑරෙමින් තිබුණු යම්කිසි හේතු සහගත වූ කරුණු කාරණා කිහිපයක් සාක්ෂාත් කර ගනිමින්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයාව එක්සත් ජාතික පක්ෂයේ හතළිස් හත් ලක්ෂයක්, පනස් ලක්ෂයක් පාක්ෂිකයන් එකතු වෙලා මේ රටේ ජනාධිපතිවරයා කරන්න හේතු වුණු කාරණය මම මේ අවස්ථාවේදී කථා කරන්නේ නැහැ. අවුරුදු දෙකයි මාස තුනක් යද්දී අද එතුමන්ලාට සුභාශිංසනය කරලා, ස්තුති කරලා ගෙනෙන මේ යෝජනාවේදී කථා කළ යුතු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මම කථාව පටන් ගන්නම්.

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා කිව්වා, අපි නිදහසක් ලබා ගත්තා. අපි සර්වජන ඡන්ද බල අයිතියක් ලබා ගත්තා. අද අපි කොහේද ඉන්නේ? මේවාට වගකිව යුත්තේ කවුද? 1948 පෙබරවාරි 04 වැනිදා ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ ධජය බිම දාලා සිංහ ධජය ඔසවලා අපි ජාතික ගීයක් හදාගෙන, අපි ජාතියක් හැටියට නැඟී සිටින්න උත්සාහ කෙරුවාට අපි අද ඉන්නේ කොතැනද? අපිට මොකද වුණේ? මේවාට වගකිවයුත්තන් කවුද? මේ ප්‍රශ්න ඇති කළේ කවුද? මේ යෝජනාවට කථා කරපු අවසන් ගරු මන්ත්‍රීතුමා කථා කළා වාගේ ඒ පැත්තේ උතුර ගිනි ගනිද්දී, මේ පැත්තේ දකුණ ගිනි ගද්දී, මේ තරුණ සංහාරයක් විනාශ කරලා, එදා කැරැල්ල මර්දනය කරලා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරද්දී, අවුරුදු 36 ක්තිබුණු යුද්ධය නිම කරලා ඒ තරුණ සංහාරයක් ජාති ආගම් බේදයක් නැතිව සමූල ඝාතනය කරලා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරද්දී අපි ලබා ගත්තේ මොනවාද? මේවාට වියදම් කරපු ඒ බදු මුදල්, ඒ රාජ්‍ය මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරපු මුදල් ගෙන්නපු අවි ආයුධ පතුරන් විනාශ වුණු ජීවිත, විනාශ වුණු දේපළ මේවා මේ රටේ සම්පත්, දේපළ සහ ජීවිත නොවෙයිද? ඒ නිසා නොවෙයිද අපට පස්සට යන්න සිද්ධ වුණේ? මේ හේතු කාරණාවට හේතු කාරකය වුණේ මොකක්ද ඒකට හේතුව? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය කියන, නිදහසින් පස්සේ මේ රට පාලනය කරපු ප්‍රධාන දේශපාලන පක්ෂ ධාරාවන් දෙක කියන එක අපි කාටත් අපේ හෘද සාක්ෂියට එකඟව පිළිගන්නට සිද්ධ වෙනවා. ඒ නිසා තමයි ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජනාධිපතිවරයෙක් පත් වෙද්දී, එක්සත් ජාතික පක්ෂයෙන් අගමැතිවරයෙක් පත් වෙද්දී, ජනතා විමුක්ති පෙරමුණෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා පත් වෙද්දී, උතුරෙන් ආර්. සම්බන්දන් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණෙන් විපක්ෂ නායක ධූරය භාර ගන්නේ. මේ සංකල්පයට තමයි අපි යහපාලනය කියන concept එක තිබ්බේ. අද එදා තිබුණු පාලනය වඩා වෙනස් පාලනය කියන්නේ, එදා ආණ්ඩුවක් ස්ථාපිත කරපු ගමන් ඒ පාලනය අයින් කරලා ජනාධිපතිවරයා, අගමැතිවරයා පත් කරපු ගමන්

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

ඉස්සෙල්ලාම කළේ මොකක්ද? ප්‍රාදේශීය ලේකම් මාරු කළා. අපේ ලේකම්වරයාව ගෙනාවා. විදුහල්පතිවරයාව මාරු කළා. විදුහල්පතිවරයෙක් ගෙනාවා. පොලිස් ස්ථානාධිපතිවරයාව මාරු කළා. සහකාර පොලිස් අධිකාරීවරයාව මාරු කළා. අපිට ගැතිකම් කියන කෙනාව ගෙනවා. කසිප්පු මුදලාලිගේ කසිප්පු තහනම් කළා. අපේ එකාට පෙරපන් කිව්වා. කුඩු විකුණන එකාව අල්ලලා දැම්මා. අපේ එකාට කුඩු විකුණපන් කිව්වා.

[සභාවේ ඝෝෂා ]

මේක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිදහසින් පස්සේ මේ ප්‍රධාන පක්ෂ දෙක, අපි දෙගොල්ලොම එක්කෙනාට එක්කෙනා බෝලේ පාස් කරමින්, දෝලනය කර ගනිමින් මේ රටට කළේ. ඒ ඇරෙන්නට බුදුරජාණන් වහන්සේ තුන් වතාවක් පය ගහපු මේ පිං බිම, ඉන්දියන් සාගරයෙන් වට වුණු, නිසි වේලාවට වැස්ස ලැබෙන, නිසි වේලාවට අව් රශ්මිය ලැබෙන වැව් පොකුණු, වැව් අමුණු ජලයෙන් පිරෙන මේ සශ්‍රීක මහ පොළව විනාශ කළේ, මේ දේශපාලන පක්ෂ දෙකේ පොදු න්‍යාය පත්‍රයත් ඇරෙන්න ජාතික ප්‍රතිපත්තියක් මේ රටේ නොතිබුණු නිසා කියන එක බස්නාහිර පළාත් සභාවේ අද මේ විවාදයට එක් වෙමින් මම ප්‍රකාශයට පත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එක්සත් ජාතික පක්ෂය.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

පිළිගන්නවා පක්ෂය. අනිවාර්යයෙන්ම.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

වෙද, සඟ, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය හදාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය විවෘත ආර්ථිකය හදලා මේවායින් කරගෙන අපි ආපු ගමනේ අපි අද මෙතැන සිටිද්දී හෘද සාක්ෂියට එකහව ආපස්සට හැරිලා බලන්න, අපි මොනවද ලබා ගත්තේ කියලා. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලියකියවිල්ලක් නැති මහා බ්‍රිතාන්‍යය අද කොහේද ඉන්නේ? අපි කොහෙද ඉන්නේ? අපි අද හරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදාගන්න පුළුවන් තත්ත්වයක ඉන්නවාද? අපි ජාතියක් හැටියට, මේ රටේ පුරවැසියන් හැටියට. අපට බැරි වෙලා තිබෙනවා. 48, 58, 68, 78, 88, 98, 2008, 2016 අවුරුදු 70 ක්. අපි තමුනාන්නසේලාගේ වයස බලද්දී අවුරුදු 20 ක් තමයි ඉදලා නැත්තේ. අවුරුදු 50 ක් අපි මේ මහ පොළවේ ජීවත් වෙලා තිබෙනවා. ඒකෙන් අවුරුදු 20, 30 දේශපාලනය කරන අය මෙතැන ඇති. අපි වග කියන්න ඕනෑ, එක එක්කෙනාට ඇඟිල්ල දික් කරමින් නොවෙයි. ඒ නිසා ප්‍රධාන දේශපාලන පක්ෂ ධාරාවන් දෙක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. තව කථා කෙරුවේ නැහැ. අරහෙත් අහපු දේවල්වලට කියන්න ඕනෑ. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මෙයට වග කිවයුතුයි. ඒ වරද අද පිළිඅරගෙන ඒ පක්ෂවල නායකයන් අද එකතු වෙලා ඉන්නවා නම් ඇයි ඒකේ සාමාජිකයන්ට, ඒකේ අනික් ආයතනවල පළාත් පාලන ආයතනවල පපුවක් තිබෙන, පෙනහළු කැහුතු තිබෙන දේශපාලඥයින්ට, රටට ආදරය කරන දේශපාලනඥයින්ට මේ Concept එක දිහා බලලා මේකත් එක්කලා මේ අවුරුදු දෙකක් ආපු මේ අයට ඉතිරි අවුරුදු තුනක් යන්න ඉඩ දෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ ඇයි කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ආණ්ඩුව පෙරළන්න -

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු මන්ත්‍රීතුමා, ආණ්ඩු පෙරළන විධිය තිබෙනවා. මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ කියන මැතිතුමන්ලා මේ ආණ්ඩු කරද්දී කවුද පෙරළයි කියලා හිතුවේ. ඒ වාගේ මහ රජාණනි කියපු අයව ගෙදර ඇරියා නම් මේ දෙන්නව අරින එක මහ ලොකු දෙයක්ද? ඒ නිසා ඉවසන්න. ඒකට ක්‍රමයක් තිබෙනවා. ඒකට දිනයක් තිබෙනවා. ඒකට වෙලාවක් තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඡන්දයක් දෙන්නේ නැහැ නේ.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

නියම වෙලාවට දෙනවා. තවම වෙලාව දුන්නේ නැහැ තවම සුමනේ වෙලාව දුන්නේ නැහැ. ඒ නිසා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සුමනේ නැකත හදනවා.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මම කියන්න ඕනැ. ඒකීයද එක්සත්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. මේ රටේ එක්තරා රාජ්‍ය නායකයෙක් මේ රට පාලනය කරන වෙලාවේ පොලිස්පතිතුමා සිටියේ සුද්‍රා රාජසිංහම්. නීතිපති සිටියේ කමල සබේසන්. අග්‍රවිනිශ්චයකාර සිටියේ ශර්වානන්දන් මැතිතුමා. නීතිපති සිටියේ නඩේසන් මැතිතුමා. මේ රටේ ඉහළ තනතුරු හතරම දැරුවේ ද්‍රවිඩ ජනතාව. ද්‍රවිඩ භාෂාව කථා කරන අය. ඒ නිසා මේක එක්සත්ද? ඒකීයද? කියන එක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේකේ තිබෙන්නේ අපි එකමුතු වෙලා රටක් හැටියට මිනිස්සු හැටියට, ලාංකිකයන් හැටියට දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ග, කතෝලික, හින්දු ජාති ආගම් බේදයකින් තොරව, නියම නායකත්වයක් එක්ක, නියම සැලැස්මක් එක්ක මේ රටේ භූගෝලීය සම්පත් ටික අපි ඒකරාශී කරගෙන අපි ඉස්සරහාට දැක්මක් ඇතිව යන ගමනකින් පමණයි අපට අනාගතයක් දිහා බලන්න පුළුවන් වන්නේ. එහෙම නොවුණොත් අපි ගන්න පඩියටත් අපි ණයයි. සියලු දෙනාගෙන්ම මම ඉල්ලීමක් කරනවා. මේ අවුරුදු පහ, ඉතිරි අවුරුදු දෙක ඉවසගෙන මේ අවුරුදු තුනත් එක්ක ඉස්සරහාට යමුයි කියලා ඉල්ලා සිටිමින්, මට අවස්ථාව ලබා දීම ගැන ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 12.01]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අපි ඉතාමත්ම ස්තූතිවන්ත වෙනවා. කාලීන වැදගත්කමක් තිබෙන දේශපාලන කාරණාවක් පිළිබඳව අද සාකච්ඡාවකට අවස්ථාවක්, ඉඩකඩ සැලසීම පිළිබඳව. එතුමාගේ යෝජනාව පිළිබඳව අපේ සතුට මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම අද තිබෙන දේශපාලන ස්වරූපයේ තිබෙන වෙනස තේරුම් ගන්න අවශ්‍ය වෙනවයි කියලා මම හිතනවා. ජනවාරි 08 වැනිදා මේ රටේ පොදු අපේක්ෂකයෙක්ව බලයට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ජනාධිපතිතුමා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව. ජනවාරි 08 වැනිදා ඒ ලබාගත්ත පොදු අපේක්ෂක ජයග්‍රහණ දේශපාලන වැඩ පිළිවෙළම ඉදිරියට ගෙනියන්න නැවත අගෝස්තු 17 වැනිදා මේ රටේ ජනතාව ජනවරමක් ලබා දීලා තිබෙනවා. මේ ජනවරම ලබා ගන්නා අවස්ථාවේදීම ජනතාව ඉදිරියේ බොහොම පැහැදිලිව කිව්වා, මේ ප්‍රධාන දේශපාලන පක්ෂ ධාරාවන් දෙකම එකට එකතු වෙලා අපි ජනාධිපතිතුමා හැටියට මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව පත් කර ගන්නවා වාගේම මේ රටේ අගමැති හැටියට රනිල් වික්‍රමසිංහ මහත්මයාව පත් කර ගන්නවා කියන එක ප්‍රකාශ කරලයි ජනතාව ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ. එහෙම නැතිව බලයට ඇවිල්ලා ආණ්ඩුව හදාගන්න යන වෙලාවේ වෙනත් දේශපාලනයක් මතයක් එක්ක හිටපු මන්ත්‍රීවරුන්ව තමන්ගේ ගොඩට බිලි බාගෙන, එහෙම නැත්නම් මුදල් ගෙවලා අරගෙන හදන ආණ්ඩුවක් හැටියට නොවෙයි මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙන්නේ. ඒක නිසා ආදර්ශයක් ඇති වන විධියට, රටට අලුත් දේශපාලන සංස්කෘතියක් හඳුන්වා දීපු ආණ්ඩුවක් හැටියටයි අපි මේ ආණ්ඩුව සලකන්නේ. විශේෂයෙන්ම කල්පනා කරන්නේ. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, රනිල් වික්‍රමසිංහ

[ගරු කීර්ති කාරියවසම්]

මැතිතුමාගේ නායකත්වය යටතේ රටේ අලුත් වෙනස් වීම් රාශියකටම මුල පුරලා තිබෙනවා කියන එක සඳහන් කරන්න ඕනෑ. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න එපාය. මේකේ බලය අඩු කරන්න එපැයි කියලා. එහෙම කිව්වත්, ඒක රටේ අස්ථාවර භාවයකට හේතු වෙනවාය කිව්වත්, අපි දැකලා නැහැ, ලෝකයේ අනික් රටවල්වල එහෙම දෙයක් වෙලා තිබෙනවා. අගමැති ක්‍රමය තිබෙන රටවල්වල, පාර්ලිමේන්තු ක්‍රමය තිබෙන රටවල්වල එහෙම දෙයක් වෙලා නැහැ. ඒක නිසා මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ තමන්ගේ බලතල අඩු කර ගන්න වෙනත් කිසිම රාජ්‍ය නායකයෙක් ක්‍රියා නොකරන ආකාරයට ආරම්භ කරපු ආණ්ඩුවක් හැටියටයි මේ ආණ්ඩුව අපට සලකන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම ඉඩකඩ සලස්වලා තිබෙනවා. රටට ස්වාධීනව කටයුතු කරන්න, දේශපාලනයෙන් තොරව ස්වාධීනව කටයුතු කරන්න තිබෙන ඉඩකඩ වඩාත් ශක්තිමත් කරලා තිබෙනවා කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. විවිධ කොමිෂන් සභා හරහා මාධ්‍යයට තිබෙ නිදහස තහවුරු කරලා, සුදු වෑන් සංස්කෘතිය ඉවත් කරලා දාලා මිනිස්සුන්ට තමන්ගේ විරෝධයන් ගොඩනහන්න තිබෙන ඉඩකඩ ශක්තිමත් කරලා මේ කාලපරිච්ඡේදය තුළ අලුත් දේශපාලන මාවතකට රට යොමු කරලා තිබෙනවා කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ රටේ අධිකරණයට ස්වාධීනව කටයුතු කරන්න ඉඩකඩ දීලා තිබෙනවා. දිවි නැඟුම පනත එනකොට, දිවි නැඟුම පනත පිළිගන්න අග්‍රවිනිශ්වයකාරවරයාගේ තීන්දුව ඊට පටහැනියි කියලා එයාව ගෙදර යවන්න කටයුතු කළා. මේ ආණ්ඩුවට විරුද්ධවත් ගෙනාපු කාරණාවලදී උසාවිය ක්‍රියා කරන කොට ඒකට විරුද්ධව අධිකරණයට කටයුතු කරන්න මේ රජය කටයුතු කරලා නැහැ. ඒ ආකාරයට අලුත් මාවතකට රට ගෙනියන්න අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ වාගේම අද අමතක වෙලා තිබුණත් ජනතාවට සහන දීලා තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් කළාම රුපියල් 10,000 කින් පඩි වැඩි කළා. ගෑස් මිල අඩු කළා. ඉන්ධන මිල අඩු කළා.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

හැබැයි, රුපියල මස්ත බාල්දු වුණා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පොඩ්ඩක් ඉන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අනේ දෙයියනේ පානදුරේ සමසමාජ ඡන්ද ටිකෙන් ආවේ. දැන් යූ.ඇන්.පී යට කහිනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ජනතාව වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් වුණු හැම සහනයක්ම ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අති විශාල ණය කන්දරාවකුත් බේරන ගමන් මේ ආර්ථික අමාරුකම් එක්ක ඒවාට මුහුණ දීලා කටයුතු කරලා තිබෙනවාය කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අද අපට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ රට ඉදිරියට ගෙනියන්න කෝ සල්ලි කියන ප්‍රශ්නයයි. අපේ ආර්ථිකය කොයි තැනද කියන ප්‍රශ්නයට තමයි අද අපට මුහුණ දෙන්න වෙලා තිබෙන කාරණාව බවට පත් වෙලා තිබෙන්නේ. ඇත්ත. විශාල ආයෝජනයක් රට කරා ගමන් කරාවිය කියලා ආණ්ඩුව බලාපොරොත්තු වුණා. නමුත් ආයෝජනයකට මේ රටේ තිබුණු ඉඩකඩ එකපාරට ගොඩනැහෙන්නේ නැති තත්ත්වයක් තිබුණේ. එකක් තමයි, ආයෝජකයෙක් රටට ආවාම තමන්ගේ ආයෝජනය නිදහසේ කරන්න තිබෙන ඉඩකඩ ඔහුට නැති වුණා. ඒක නිසා ඒකට ඉඩක් සලසන්න තමයි අර සංවර්ධන පනත ගෙනැල්ලා ආයෝජකයන්ට රටට එන්න තිබෙන ඉඩකඩ වඩාත් ශක්තිමත් කරන්න අවස්ථාව සලසා තිබෙන්නේ.

ඒ වාගේම විවිධ පනත් යටතේ අවස්ථාව සැලසුවා. විගණන පනත වෙන්න පුළුවන්. තොරතුරු දැන ගැනීමේ පනත වෙන්න පුළුවන්. මේ ආකාරයට මේවා හරහා හොරකම, දූෂණයට, වංචාවට තිබෙන ඉඩකඩ අඩු කරන්න අවස්ථාව සලසා තිබෙනවාය කියන එක අපි විශේෂයෙන්ම සලකන්න ඕනෑ. ඇත්ත. අපි පිළිගන්නවා. බැඳුම්කර පිළිබඳව අද බොහොම පැහැදිලිව චෝදනාවක් තිබෙනවා.

මේ චෝදනාව වාගේම තේරුම් ගන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා. 2005 සිට 2015 වනතුරු මේ රටේ රුපියල් බිලියන 8000 ක බැඳුම්කර නිකුත් කරලා තිබෙනවා. එහෙත් මේ රුපියල් බිලියන 8000 ක බැඳුම්කර නිකුත් කරන කොට මේ බැඳුම්කරවලින් 80% ක්ම දීලා තිබෙන්නේ පර්සනල් ප්ලේස්මන්ට්වලට දීලා තිබෙන්නේ. පුද්ගලිකව එක එක්කෙනාට ආයෝජනය කිරීමේ ඉඩකඩ. ඒ කරපු 80% ක ආයෝජනයෙනුත් විශාල ප්‍රමණයක්, වැඩිම ප්‍රමාණය සමාගම් තුනකට හිමි වෙලා තිබෙනවා. කොමර්ෂල් බැංකුව වැනි සමාගම්වලට. කොමර්ෂල් බැංකුවව - එදා හිටපු බැංකු අධිපතිවරයාගේ, කබ්රාල් මහත්මයාගේ ඥාතීන්ගේ කොම්පැණිය. ඔය පර්පචුවල් සමාගම මේ රටේ බැඳුම්කර වලට, ඒ අයට ප්‍රාථමිකයන් හැටියට එන්න ඉඩකඩ සැලැස්සුවෙත් 2014 දී ඔය කබ්රාල් මහත්මයාගේ සහෝදරියම අධ්‍යාක්ෂවරියක් හැටියට සිටීම තුළයි.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ කාලයේ පරීක්ෂණයක් කරන්න තිබුණා නේ?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒක නිසා මේ කාලපරිච්ඡේදය තුළ මේ වුණු ක්‍රමවේදය ඉවත් කරලා, අඩුම ගණනේ ඒකේ අඩුපාඩුකම් හඳාගන්න තිබුණත් අවස්ථාව දීලා තිබෙනවා මින් ඉදිරියට සියලුම බැඳුම්කර ටෙන්ඩර් ක්‍රමයකට යන්න ඕනෑය කියලා. ඒක හොඳ අවස්ථාවක්, හොඳ ආරම්භයක් හැටියටයි අපි දකින්නේ. අඩුපාඩු ඉවර කරගෙන හරි ඉදිරියට යන්න. ඒක නිසා අපි විශ්වාස කරනවා, අද රටට මීට වැඩිය අමාරුවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මහින්ද රාජපක්ෂ මහත්මයා අවුරුදු දෙකකට ඉස්සෙල්ලා නැවත ඡන්දයකට යන්න තීන්දු කළේ, අර හඳහන නිසා නොවෙයි. අද ආණ්ඩුව මුහුණ දෙන මේ ආර්ථික අර්බුදයට එතුමාට මුහුණ දෙන්න සිද්ධ වෙනවාය කියන කාරණය එතුමා දැනගෙන සිටියා. ජිනීවා මානව කොමිසම ඉදිරියේ ඇති වන තත්ත්වයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙන බව දැනගෙන සිටියා. මේ අමාරුකම්වලට මුහුණ දෙන්න පුළුන්කමක් නැති නිසා තමයි අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ඡන්දයකට ගියේ. අද එතුමා මේ චෝදනාවන්වලට අනික් පැත්තට චෝදනා කරන්න සූදානම් වෙලා තිබෙන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

කළුතර දිස්ත්‍රික්කයේ වමේ ඡන්ද ටිකෙන් තමුන්නාන්සේ ආවේ. හෘද සාක්ෂියට එකඟවද කථා කරන්නේ?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

රට පවා දෙන්න කටයුතු කරන අය කිව්වා. අමතක කරන්න එපා. යුද්ධය අවසන් වුණු වෙලාවේ බෑන් කීං මූන්ව මේ රටට ගෙනැල්ලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අමතක කරන්න එපා. වමේ ඡන්දෙන් ආවේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

එකඟතාවයක් ඇති කර ගත්තා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වමේ ඡන්දෙන් ආවා කියලා අමතක කරන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

බෑන් කීං මූන්ගෙන් පස්සේ නවනීදන්පිල්ලේට වාර්තාවක් හදන්න රට පිළිබඳව ඉඩකඩ සලස්වලා දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යකඩෝ රනිල්ගේ තනතුරේ බලේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් දෙනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

දරුස්මාන් වාර්තාවකට මේ රටේ ඉඩකඩ සලස්වලා දුන්නා. LRC එකක් පත් කරලා LRC එක හරහා ඒ කියන සියලු දේවල් කරන්න ඉඩකඩ සලසා දුන්නා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අනේ! සමසමාජයට ගිය කල.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

LRC එක හා මේ දරුස්මාන් වාර්තාව -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි විමල් වීරවංශ වෙන්නද කියන්නේ?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

විදේශිකයින්ට, අර ඩෙස්මන් වාගේ උදවියට අතිවිශාල මුදල් ගෙවලා ඒ අය විශේෂඥයින් හැටියට පත් කරගෙන, විදේශිකයන්ට අපේ රටට ඇඟිලි ගහන්න තිබුණු අවස්ථාව සලසා දුන්නේත් ඒ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ කියන එක අමතක කරන්න නරකයි. අද එවැනි තත්ත්වයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් බොහොම පැහැදිලිව කියලා තිබෙනවා. එවැනි විනිසුරුවන්ට, ජාත්‍යන්තර විනිසුරුවන්ට ඉඩකඩක් ඇති වෙන්නේ නැහැයි කියලා. ඒ නිසා අපි අලුත් ආර්ථික ක්‍රමයකට ජාත්‍යන්තරයේ විශ්වාසය දිනාගෙන තිබෙනවා. අලුත් ආර්ථික මාවතකටයි මුහුණ දෙන්න සූදානම් වෙලා තිබෙන්නේ. අපි දන්නවා, අපට ආයෝජනයන් ආවේ නැහැ. ඒක නිසා ආයෝජනයන් දිහා විතරක් නොවෙයි. අද රජයේ මැදිහත්වීම අපේ ආර්ථිකයට එකතු කරන්න අලුත් වැඩ පිළිවෙළකටයි ගමන් කරමින් ඉන්නේ. ඒ තුළ වරායට වෙන්න පුළුවන්. ගුවන් තොටුපලට වෙන්න පුළුවන්. රජයේ මුදල් ආයෝජනය කරමින්, අලුත් ව්‍යාපාර අවස්ථාවන් ඇති කරන්න සූදානම් වෙලා තිබෙනවා. ස්වශක්ති ව්‍යාපාරය තුළ මේ රටේ තරුණ තරුණියන්ට ස්වයං රැකියා ආරම්භ කරන්න, තමන්ගේ කුඩා කර්මාන්ත දියුණු කරගන්න ණය පහසුකම් ඇති කරලා රජයේ මැදිහත්වීම රටේ ආර්ථිකයට ඇතුල් කරලා දීලා අර සඳහන් කරපු ආකාරයට ආර්ථිකය මිනිස්සුන්ගේ යහපත ඇති වන විධියට ගොඩනඟනවයි කියපු පොරොන්දුව තුළ කටයුතු කරන්න, මාර්ගය සලස්වලා තිබෙනවා. ඒක නිසා අපි ඉල්ලා සිටිනවා. මේ තත්ත්වය ආපස්සට හරවන්න දෙන්නේ නැතිව, මේ තත්ත්වය ආරක්ෂා කර ගන්නත්, මේ තත්ත්වය තවත් දියුණු කර ගන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. පළාත් සභා ප්‍රතික්ෂේප කරන්න නොවෙයි, අපට අවශ්‍ය වන්නේ. මේ සංවර්ධන කටයුත්තේදී ගමට, ප්‍රදේශයට, ජනතාවට වඩාත් හොඳ සේවයක් ලබා දෙන්න පුළුවන් වන විධියට ජනතාව එක්ක එකට කටයුතු කරන ප්‍රාදේශීය ආයතන හැටියට මේ බලය බෙදීම තුළ මේ ආයතන වඩාත් ශක්තිමත් කරලා, ජනතාවට මේවා වඩාත් යහපත් ආයතන බවට පත් කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීමයි අපි මේ අවස්ථාවේදී කරන්නේ. ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියන්න ඉකඩක් ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.13]

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන් එතුමා අද පවතින රජය පිළිබඳවත් රටේ ජනාධිපතිවරයාත්, රටේ අග්‍රාමාත්‍යවරයාත් ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳවත්, ජාත්‍යන්තර වශයෙන් අපට ලැබෙන සහයෝගය පිළිබඳවත් සැලකිල්ලට ගනිමින් තමයි එතුමා මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ. අපි කල්පනා කරන්න ඕනෑ, ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩු හැදුනේ කොහොමද කියලා. අපි දන්නවා, පසුගිය කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු ගණනක් දෙපැත්ත මාරු වෙවී හැදුණු කාලයක් තිබුණා. ආණ්ඩු මාරු වෙන්න ඉස්සෙල්ලා හැදුණේ ජනාධිපතිවරයාව වෙනස්වීම. ප්‍රධාන වශයෙන්ම. මේ රටේ ජනාධිපතිවරු 1994 සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පත් වෙලා තිබෙනවා. 1994 න් ඉස්සෙල්ලා එක්සත් ජාතික පක්ෂයෙන්. 1994 න් පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තමයි දිගටම ජනාධිපතිවරු පත් වුණේ. අද පත් වෙලා ඉන්න ජනාධිපතිවරයාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කියන එක හැමෝම දැනගන්න ඕනෑ. ඒක නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන හොඳට අවබෝධයක් තිබෙන ජනාධිපතිවරයෙක් සිටින නිසා අද එක්සත් ජාතික පක්ෂයටත් ඒ විධියට එකතු වෙලා ගමනක් යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේකේ ප්‍රධාන වශයෙන් අපි

බලන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ ව්‍යුහය වෙනස් වුණු ආකාරය. පාර්ලිමේන්තුව වෙනස් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයේ ස්ථිර වශයෙන් අපට ඉන්නේ මන්ත්‍රීවරු 82 යි. වෙනත් පක්ෂ හැරුණාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඉන්නේ මන්ත්‍රීවරු 82 යි. එක්සත් ජාතික පක්ෂයට ඉන්නෙත් සුළු පක්ෂ ටික හැරුණාම, අනිකුත් පක්ෂ ටික හැරුණාම 82 යි. දෙපැත්තටම ඉන්නේ 82 යි. මෙතැනින් තමයි ඉදිරියට යන්න වෙන්නේ. පක්ෂ බැලුවාම 82 යි, 82 යි. මේ ජනාධිපතිවරණයේදී මේක වෙනස් කරන්න තවත් පක්ෂයක් එකතු වුණා. කවුද? ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණ එකතු නොවුණා නම් අද මේ වෙනස වෙන්නේ නැහැ. අද එතුමන්ලා තමයි ඒකේ ප්‍රධානම භූමිකාව රඟපෑවේ. අද එතුමන්ලාට ඒකෙන් මඟ හැරලා යන්න බැහැ. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ ප්‍රධාන සංවිධායක ධූරය ජනතා විමුක්ති පෙරමුණ අරගෙන තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විවේචනය කරමින් හරි ආණ්ඩුවට සහයෝගය දෙන්න ඕනෑ. මගේ මතය. මම කියන්නේ. ඒ නිසා අද විවේචනය කරන එක නොවෙයි. අපි වැටිලා තිබෙන වලෙන් ගොඩ එන්නේ කොහොමද කියන එක බලන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බැඳ ගත්ත බෙරේ ගහන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අද හඳුන්නෙත්ති මැතිතුමා කෝප් කමිටුවේ සභාපතිවරයා හැටියට ලොකු සේවයක් කළා. මේ රටේ වංචාව දූෂණය ඇත්ත වශයෙන් නැති කරගන්න ඕනෑය කියන එකේ තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශේෂයෙන් සිටියේ. ඉතින් ඒක නිසා මේ වකවානුවේදී මේ ආණ්ඩුවේ සමහර තැන්වල වුණු වැරැදි නිසා මුළු ආණ්ඩුවටම දෝෂාරෝපණය වන තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කථා කළ විධියට ඇත්ත වශයෙන්ම යහපාලන ආණ්ඩු හදන්න අපි වැඩ පිළිවෙළකට යෙදුණේ නැහැ. මම නම් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් හැටියට, අපි රාජපක්ෂ මහත්මයාව මේ රටේ දිනවන්න කටයුතු කළා. නමුත් අද අපි සන්තෝෂ වන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරයෙක් මේ රටේ ඉන්න නිසයි. වමේ අදහස් තිබෙන රටේ නායකයෙක් ඉන්න නිසයි. මේ රට හදන්න හැම පක්ෂයක්ම කටයුතු කරපු එක ඇත්ත. පක්ෂ බෙදුණු එක ඇත්ත. පසුගිය කාලයේ අවුරුදු 30 කට මේ රට පස්සට ගිය වෙලාවේ ඇත්ත වශයෙන්ම අපි ඒ ගරුත්වය මහින්ද රාජපක්ෂ මැතිතුමාට දෙන්න ඕනෑ. එතුමා නායකත්වය නොගත්තා නම් ඔය යුද්ධය අවසන් කරන්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ත්‍රිවිධ හමුදාව, පොලීසියේ, හමුදාවේ ජීවිත දීලා සටන් නොකළා නම් මේ රට වෙනස් වෙන්නේ නැහැ. ඒක නිසා අද ඒ තිබුණු යුධ වාතාවරණය වෙනස් වෙලා අද රට හරි ගමනකට යන්න යන මොහොතක්. අපේ රටේ ජනාධිපතිතුමා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන කරුණු කිහිපයක් තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා. දැන් සමහර අය කියනවා, ජාතික සම්පත් ටික විකුණන්න හදනවා කියලා. ඒක වෙන්න අපේ රටේ ජනාධිපතිතුමා කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ඒක විශේෂයෙන් එතුමා කියලා තිබෙනවා. රටට හයිබ්‍රිඩ් අධිකරණ ගෙනෙන්න දෙන්නේ නැහැයි කියලා එතුමා කියලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි ඉතිහාසය ගැන හිතන කොට ඉන්දියාව වෙනස් කළේ කෙසඟ සිරුරක් තිබුණු මනුස්සයෙක්. මහත්මා ගාන්ධි මැතිතුමා. රට වෙනස් කරපු නායකයා විධියට අද එතුමාව තවමත් සලකනවා. ඒක නිසා අද කෙසඟ සිරුරක් තිබෙන මනුස්සයෙක් තමයි මේ රටේ ජනාධිපති වෙලා තිබෙන්නේ. එතුමා ඍජු තීරණ ගන්නවා. පක්ෂ විපක්ෂ දේ බලන්නේ නැහැ. එතුමා හරියට තීන්දු ගන්නවා. තීන්දු අරගෙන වෙලාවට වැඩ කරන රටේ ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඒ ගැන ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියට අපට භය වෙන්න දෙයක් නැහැ. අගමැතිතුමා වුණත් එතුමාත් එක්ක එකතු වෙලා ඒ වැඩ පිළිවෙළට යන්න වෙනවා. සමහර තැන්වලදී යම් යම් විවේචන තිබෙනවා. ආණ්ඩුව ගැන අපට විවේචන තිබෙනවා. ඒ විවේචනය කරන ගමන්මයි යන්න තිබෙන්නේ. ඒක තමයි මම කිව්වේ, 82 යි, 82 යි වශයෙන් මේ පක්ෂ දෙකට තිබෙන කොට, සුළු පක්ෂවල සහයෝගය නැතිව මේ රටේ ආණ්ඩුවක් පිහිටුවන්න බැහැ. මම අහන්නේ ඒක තමයි. 106 යි එක්සත් ජාතික පක්ෂයට. අපට 95 යි. එහෙම ආණ්ඩු හදන්න බැහැ. ඒක නිසා අද ආණ්ඩුව කොහොම හරි හැදුණා. මම හිතනවා, මේ රටේ ජනතාවගේ වාසනාවකට මේ වැඩ පිළිවෙළ යෙදිලා තිබෙන්නේ. ඒක නිසා මේකෙන් පරිබාහිරව අපට යන්න බැහැයි කියලයි මම හිතන්නේ. ඒ නිසා අපි ඉදිරියේදීත් අතිගරු ජනාධිපතිතුමා ගෙන යන මේ වැඩ පිළිවෙළට පූර්ණ

සහයෝගය දෙමින්, අග්‍රාමාත්‍යතුමාගේත් සහයෝගය අරගෙන ඉදිරියේදී මම හිතන්නේ මැතිවරණ පැවැත් වෙන්න පුළුවන්. ඉදිරියේදී පළාත් පාලන මැතිවරණය පවත්නවා. පළාත් පාලන මැතිවරණයේ දී පක්ෂ දෙක දෙකට බෙදිලා ඡන්දය ඉල්ලනවා. අපි ප්‍රාදේශීය සභාවල්වලට, නගර සභාවල්වලට පත් කර ගන්නවා. ඒවායේ අඩුපාඩු තිබෙනවා. ඒවා හදාගන්න ඕනෑ. අද පොහොට්ටුව, ශ්‍රී ලංකා අපි ඔක්කොම එකයි. ඒක නිසා මම තමුන්නාන්සේලාට අන්තිමට මෙන්න මේ වචනය කියලා මම නවතිනවා.

යාදෙක නොරද රථ
සන්ධානය එහෙම නැත
අපි එකට ඇත.

[අ.භා. 12.20]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ක්‍රි.පූ. දෙකේදී ටොලමි තමයි ලෝක සිතියම මුලින්ම හැදුවේ. නිර්මාණය කළේ. ටොලමි ලෝක සිතියම නිර්මාණය කරන කොට, ඒ වන කොට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටොලමි ලෝක සිතියම නිර්මාණය කරන කොට ශ්‍රී ලංකාවේ එදා, අද මේ ලෝකයේ තිබෙන දියුණු රටවල් නැතිව ශ්‍රී ලංකාව ප්‍රබානා කියලා සඳහන් වෙලා තිබුණා. ඒ කියන්නේ සිංහලෙන් ප්‍රබානා කියලා. English වලින් තැප්‍රොබේන් කියලා. එතකොට එදා ක්‍රි.පූ. 2 දී ටොලමි සිතියම නිර්මාණය කරන කොට, ශ්‍රී ලංකාව සිටියේ කොයි ස්ථානයකද? එතකොට අද කොයිතරම් කාලයකට ඇවිල්ලාද? අද අපේ ශ්‍රී ලංකාව පසු කාලීනව ගත්තොත් අපට වඩා ඉතාමත් ඉදිරියට ගිහින් තිබෙනවා . ඒ නිසා අපි එන්න, එන්න, එන්න, එන්න ඉතාම වැටුණු කොටසක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගෝලීයකරණය තුළ, ගෝලීයකරණය වෙන්න මූලිකම හේතුව තමයි පරිගණකය. අර පරිගණකය සම්බන්ධ නොවුණා නම් ගෝලීයකරණයක් සිදු වන්නේ නැහැ. අපේ සම්මානනීය පුරවැසියෙක් වුණු ආතර් සී. ක්ලාක් මැතිතුමා පොතක් ලියලා තිබෙනවා, Beyond 2000 කියලා. වසර 2000 න් ඔබ්බට කියලා පොතක්. 1960 ගණන්වල තමයි එතුමා මේ පොත ලියලා තිබෙන්නේ. ඒ Beyond 2000 කියන පොතේ සඳහන් වෙලා තිබෙනවා, වසර 2000 පමණ වන විට මිනිසා ගිණි පෙට්ටියක් වාගේ දෙයක් ළඟ තියාගෙන මේ ලෝකයේ මේ කෙළවරේ සිට අනික් කෙළවරට කථා කරන තත්ත්වයක් ඇති වෙනවා කියලා. එතකොට අනික් කට්ටිය ඔක්කොම කෑ ගැහුවා. පිස්සු. ලෝකය වෘත්තාකාරයි. කොහාමද සන්නිවේදන මාධ්‍යයක් හැටියට කටයුතු කරන්නේ කියලා. නමුත් එතුමා ඒ ප්‍රකාශ කරපු දේ 2000 වන විට මේ ලෝකයම එකම ගම්මානයක් බවට පත් කරන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. ජාත්‍යන්තරය දැන් ඒකරාශි වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තරය ඒකරාශී වන කොට අපි පසු කාලීනව - අපි ගත්තොත් එහෙම 2015 ජනවාරි මාසයේ 08 වැනිදා වන විට අපි තවදුරටත් ලෝකයේ පිටුපසට ගිහිල්ලා සිටියේ. අපේ රටේ ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධීකරණය, මෙතුමා මෙහි සඳහන් කරලා තිබෙන්නේ, ජාත්‍යන්තරය සම්බන්ධය ගැන. ජනවාරි මාසයේ 08 වැනිදා වන කොට අපි ඉතාම පසුගාමී වෙලා සිටියේ, ලෝකයේ සම්බන්ධතාවලින් ඈත් වෙලා. හිටපු ජනාධිපතිතුමා එදා කියන්න ගත්තේ මාව බේරගන්න. මාව ලෝකයෙන් බේර ගන්න නම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දෙන්න එපා. එහෙම වුණොත් එහෙම නැවත වතාවක් බෙදුන් වාදය ඉහළට යයි. එහෙම ගිහිල්ලා මට සිද්ධ වෙන්නේ අද බන්ධනාගාරගත වෙලා ඉන්න. විමල් වීරවංශ මැතිතුමාත් වැඳ, වැඳ කිව්වේ ඒකමයි. එතුමා එහෙම කිව්වේ එහෙම කළොත් එහෙම වෙන්නේ, මාව විදුලි පුටුවට අරගෙන ගිහිල්ලා මාව මරා දානවා. ඒ ජාත්‍යන්තරය මට නැහැයි කියලා. මාව නැති වෙනවා. ඒ නිසා මාව බේරගන්න තිබෙන එකම දේ තමයි මාව දිනලා දෙන්න ජාත්‍යන්තරය දිනාගන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාත්‍යන්තරයක් තිබුණේ කොහේද? මහා හෙලිවැලි සංස්කෘතියක් තිබෙන ස්වාසිලන්තය වාගේ රටවල්වලින් මිනිස්සු මෙහාට ආවේ. එකෙක් ගණන් ගත්තේ නැහැ. ලෝකයේ ප්‍රසිද්ධයි කියලා

සලකන කිසිම රටක් එවකට සිටිය පාලකයින් සමඟ සම්බන්ධීකරණයක් ඇති කර ගත්තේ නැහැ. අඩුම තරමේ ණයක් ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපට මෑත භාගයේදී මේ වත්මනේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමාත් එක්ක එකතු වෙලා, ලෝකයේ අද ජන නායකයින් - මෛත්‍රීපාල සිරිසේන ලෝක සම්මේලනවලට ගියාම ලෝකයේ ප්‍රධාන පෙළේ ඉන්න නායකයන් නැඟිටලා ළඟට ඇවිල්ලා අතට අත දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝකයේ කිසිම නායකයෙකුට නොකරන විධියට රජිණිය තමන්ගේ අත්වැසුම් ඉවත් කරලා මේ නිහතමානී නායකයාට අත දෙන්න තරම් ජාත්‍යන්තරය අද නැමෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එදා ස්වාසිලන්තය නොවේ. අද නවසීලන්තය පවා එන්නයි කියලා කියනවා. ඉතින් ඒ නිසා ජාත්‍යන්තර වශයෙන් විවිධාකාරයේ සම්බන්ධකම් තිබෙන්නා වූ රාජ්‍යයක් බවට අද පත් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා අද ලෝකය තුළ, මහින්ද රාජක්ෂ සහ ඔබතුමන්ලාගේ ප්‍රමුඛත්වය තිබුණා නම්, අද අනිවාර්යයෙන්ම මේක චීන කොළනියක් බවට පත් වෙලා චීනුන්ගේ රාජ්‍යයක් බවට පමණක් පත් වෙනවා. ඒ නිසා අද අපි අනිවාර්යයෙන්ම සතුටට පත් වෙන්න ඕනෑ. අපේ ජන නායකයා, ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ වාගේම තමයි අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගත්තු ණයට මොකද වුණේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අද මහින්ද රාජපක්ෂ කියන නායකතුමා සිටියා නම් අද මේ රට මේ වන විට අවුරුදු දෙකක් ගියාට පස්සේ අපි මහා විශාල අන්ත තත්ත්වයට පත් වෙන්නේ. අද එහෙමනම් සම්බාධක ඇවිල්ලා තෙල් ටික නැතිව, අපට බදු ගෙවා ගන්න බැරිව අපි මහ වැටුණු ජාතියක් බවට පත් වෙනවා. ඒ නිසා අපි සතුටට පත් වෙන්න ඕනෑ. අපේ මේ නායකයන් ගත්තොත් එහෙම (බාධා කිරීම්) අපට ඇත්ත වශයෙන්ම අද කථා කරන්නේ ප්‍රධාන පෙළේ රටවල්. අද ජාත්‍යන්තරයේ ඉන්න මහා රටවල් කථා කරලා අපට ණය දෙන්න, ඒ වාගේම තමයි සංවර්ධනය සඳහා කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි උත්සාහ කරන්න හොඳ නැහැ, ජාතියක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

රටක් හැටියට යන්න, රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට හොඳ යහපාලනයක් පාර්ලිමේන්තුව තුළ අද ඇති වෙලා තිබෙනවා. මම ඉතාමත් කනගාටුවට පත් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කථා කරන්නේ කොහෙන්ද කියලා. එතුමා මොන පැත්තෙන් කථා කළාද දන්නේ නැහැ. අපෙන් කළුතරට ඡන්දය ඉල්ලුවේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමාට පැත්තක් නැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඡන්දය ඉල්ලුවේ කළුතරට UNP යෙන්. අද ජනාධිපතිතුමාගේ උපදේශක. ජනාධිපතිතුමාගේ උපදේශක වෙලා (බාධා කිරීම්) ලැජ්ජයි ඔහොම කථා කරන්න. උපදේශකයා කියනවා ජනාධිපති -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දවල් මිගෙල් ඊ ඩැනියෙල්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ජනාධිපතිතුමාගේ උපදේශකයා කියනවා මේ යන තත්ත්වය හොඳ නැහැයි කියලා. ඔබතුමන්ලා තනියම ඡන්දය ඉල්ලන්න කෝ. (බාධා කිරීම්) ආසනයක් දිනාගන්න හම්බ වෙන්නේ නැහැ. ඔබතුමා දැන් මේ අන්තිම (බාධා කිරීමක්) මහින්ද රාජපක්ෂගේ පැත්ත

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

පොඩ්ඩක් හදාගෙන එනකොට හෙමින් ගැප් එක දාන්න. ඒ නිසා එහෙම කියන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලාල්කාන්ත හිටපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක අවුරුද්දක් කථා කළත් ඉගෙන ගන්න දෙයක් නැහැයි කිව්වා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක විනාඩි 10 ක් කථා කළොත් දාහක් දේවල් ඉගෙන ගන්න පුළුවන් කිව්වා. ඉතින් ඒ නිසා

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වන්න. ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ සියලු බේද අත් හැරලා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

විනාඩි 10 ට සුදු කොල්ලෝ 60 යි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

රට හදන්න එකතු වෙන්න. අපි එකතු නොවුණොත් එහෙම මේ රට හදන්න පුළුවන්කමක් නැහැ. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

[අ.භා. 12.29]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය අපේ ගරු මන්ත්‍රීතුමා ගෝලීයකරණය සහ යහපාලන ආණ්ඩුව සම්බන්ධව ගෙනැල්ලා තිබෙන යෝජනාව කෙටියෙන් මම කියන්නම්. පොඩ්ඩක් ඔක්කොම නිශ්ශබ්ද වන්න. අපේ ගෝලීයකරණය සහ යහපාලනය සඳහා එකතු කරපු ආණ්ඩුව සම්බන්ධ යෝජනාවක් අද අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාවා. ඒ යෝජනාවේ තිබෙනවා, ගෝලීයකරණය කරපු ලෝකය ඒකීය රටක් තුළ ජාත්‍යන්තරය සඳහා ඇති කර ගැනීම සුරක්ෂිත කර ගැනීම සඳහා අපේ යහපාලන ආණ්ඩුවක් පිහිටුවා ගත්තාය කියලා. ඔබතුමාට කියන්න කනගාටුයි. මේ 2015 ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම් හැටියට මේ ආප්පයක් කාලා, මධ්‍යම කාරක සභාවේ හිටපු කෙනෙක් හැටියට පුටුවට නොකියා ගිය මනුස්සයෙක්. ගිහිල්ලා මේ රටේ එක්සත් ජාතික පක්ෂය, අපේ තිබුණු ජනතා විමුක්ති පෙරමුණ, ඒ වාගේම TNA පක්ෂය, ඒ වාගේම මුස්ලිම් කොංග්‍රසය, ඒ වාගේම අපේ ජෙනරාල්ගේ පක්ෂය, ඒ වාගේම තිබුණු අපේ අනෙකුත් පොදු පොඩි පක්ෂ 47 ක්, 48 ක් ඒකරාශී කරලා මැතිවරණයකට මුහුණ දුන්නා. මේ මැතිවරණයේදී පොරොන්දු රාශියක් දුන්නා. මේ පොරොන්දු මොනවාද? මේ රටේ මිනිස්සුන්ට යහපතින් ජීවත් වෙන්න. පළමුවැනි පොරොන්දුව. දැන් මේ රටේ මිනිස්සුන්ට යහපතින් ජීවත් වෙන්න පළමුවැනි පොරොන්දුවට මොකද වුණේ? අවුරුදු දෙකක් යන කොට හාල් මිල රුපියල් 110/- යි. පරිප්පු රුපියල් 220/- යි. අල රුපියල් 280/- යි. රතු ළූණු රුපියල් 120/- යි. මේ වාගේ ආර්ථිකය කඩා වැටුණාම මිනිස්සුන්ට කන්න බැරි නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ, ගාමිණී තිලකසිරිගේ අමාත්‍යාංශයට ඉහළින් තිබෙන අමාත්‍යාංශය යටතේ හිටපු නිලධාරීන් බැලුවා, කමිටුවක් පත් කරලා දැන් පරිප්පු, අල, සීනි, බොම්බයි ළූණු ගණන් යනවා. මිනිස්සුන්ට කන්න විධියක් නැහැ. ඒ නිසා ක්‍රෝටන් කොළයි, කොස් කොළයි කාපන් කියලා ලංකාවේ මිනිස්සු වස්සෝ, වැස්සියෝ ගණනට දමපු ආණ්ඩුවක් තමයි මේ යහපාලන ආණ්ඩුව. දැන් ගෝලීකරණය. දැන් මේකේ තිබෙනවා. මේකේ තිබෙන්නේ මොකක්ද? බලගතු ශ්‍රී ලංකාවක්, කාටත් යමක් කමක් ලැබෙන ආර්ථිකයක්. කාටත් යමක් කමක් ලැබෙන ආර්ථිකයක් තිබෙන්නේ කොහොමද? දැන් මේ පත්තරේ බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පත්තරේ දිනේ කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පත්තරේ තිබෙනවා, ආර්ථික වර්ධනය 4.4 යි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පත්තරේ මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පත්තරේ ලංකාදීපය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කවදද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද. එතකොට බලන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලියලා තිබෙන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහින්ද රාජපක්ෂ මැතිතුමා. දැන් බලන්න 2011, 2012, 2013, 2014, 2015, 2016. දැන් 2011 කීයද? 6.4 යි. අපේ රටේ යුද්ධයත් එක්ක. යුද්ධය අවසන් කරලා මේ රට දෙකඩ කැඩුණු රට. අවුරුදු 30 ක් යුද්ධ කරලා අරගෙන ආර්ථික සංවර්ධනය ඇවිල්ලා තිබෙනවා. මුළු ලෝකයම පිළිගත්ත අපේ කොළඹ නගරය හදාගෙන එන කොට පෝට් සිටිය හදාගෙන එන කොට, අපේ පාරවල් ටික හදාගෙන එන කොට, අධිවේගී මාර්ග, ගුවන් තොටුපලවල්, වරායවල් හදාගෙන එන කොට ලෝකය පිළිගත්තා. ආර්ථිකය වේගයෙන්ම සංවර්ධනය වන රට බවට පරිවර්තනය වෙනවා කියලා පත්තරවල පිටු ගණන් ලෝකයේ ලිව්වා. දැන් එහෙම තිබුණු රට තමයි මෛත්‍රීපාල සිරිසේන අර කුඹුරු වැඩ කරලා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නිසා හොරට සහතික ලියලා පුරුදු මිනිස්සු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

මේ රටේ ආර්ථිකය කඩා දාලා මේ එක්සත් ජාතික පක්ෂය අවුරුදු 29 ක් දිනන්න බැරිව හිටපු රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවට ජැක් ගහලා මේ අපේ දියුණු කරපු රට කඩා වට්ටන්න පටන් ගත්තා. දැන් අද කඩා වැටිලා විතරක් නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ජනාධිපතිතුමා හොර සහතික ලියලා. ග්‍රාම සේවක කියන ඒවා ඉල්ලා අස් කරගන්න. ජනාධිපතිතුමා. ඒක ඉල්ලා අස් කරගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉල්ලා අස් කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ කාලය දෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉල්ලා අස් කර ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් ඊට පස්සේ තිබෙනවා. මේකේ බලන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගෙවුම් ශේෂය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැන්සාඩ් එකෙන් කපා හරින එක නොවෙයි. ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න. ඒකයි කියන්නේ. ඉල්ලා අස්කර ගන්න කියන්න. හැන්සාඩ් එකෙන් කපා හරින එක නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජනාධිපතිතුමාගේ නම කියපු එක ඉල්ලා අස්කර ගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඉල්ලා අස්කර ගන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉල්ලා අස් කර ගන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාව තහනම් කළත් මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙමනම් ඉතින් කථා කරන්න දෙන්න බැහැ නේ? මේ රටේ ජනාධිපතිවරයාට විරුද්ධව අපහාස කරනවා නම් මේ සභාව මොකක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒක ඉල්ලා අස් කර ගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කිව්වේ නැහැ, ජනාධිපති කියලා. මම කිව්වේ මෛත්‍රීපාල සිරිසේන කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ, නැහැ. මෛත්‍රීපාල සිරිසේන කියලා නමින්ම කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආයේ වෙන මොකක්වත් කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉල්ලා අස් කර ගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේ බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය පොත්පත් කියවන අය නොවෙයි නේ? රොඩ්නි ෆෙසර්ලා වාගේ අය ආර්ථිකය ගැන කථා කරන්නේ කොහේද? තමන්ගේ ටියුෂන් පන්තියෙන් එන ආදායම විතරයි මෙතුමා දන්නේ. අපේ දරුවන්ට ටියුෂන් දීලා ඒකෙන් එන පොකට් මනි එකෙන් ජීවත් වෙන අය කොහෙමද ආර්ථිකය දන්නේ. (බාධා කිරීම්) ගෙවුම් ශේෂ ආරවුල. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ගෝලීයකරණය කරගන්න - සිරිකමල් ගරු මන්ත්‍රීතුමා බෝනස් එකෙන් ආවේ. ඒ නිසා වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාව මොකක්ද? එතුමාට ඕනෑ ඕනෑ දේවල් මේ සභාවේ කරන්න දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා,

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමා කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කවුරු කිව්වත් මම අස් කරන්නේ නැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඉල්ලා අස් කරගන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බොහොම පැහැදිලිව කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉල්ලා අස්කර ගන්න කියන්න කෝ?

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තොරතුරු දැන ගැනීමේ පනත අනුව අහන්න පුළුවන්. කියන්න පුළුවන්. තොරතුරු දැන ගැනීමේ පනත දාලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

දැන් කොමිෂන් සභා පත් කළා. ස්වාධීන කොමිෂන් සභා. මැතිවරණ කොමිෂන් සභාව. අධිකරණ කොමිෂන් සභාව. රාජ්‍ය සේවා කොමිෂන් සභාව. පොලිස් කොමිෂන් සභාව. තොරතුරු දැන ගැනීම සඳහා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩි යයි තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තොරතුරු දැන ගැනීම අනුව අපට පුළුවන් මෛත්‍රීපාල සිරිසේන ගැන කථා කරන්න. ඒකට අයිතියක් තිබෙනවා. ඒ පනතේ තිබෙනවා. ඒකේ තිබෙනවා. ඉස්සර තමයි ජනාධිපතිවරයා උසාවි ගෙනියන්න බැරි. දැන් ඊයේ උසාවි නියෝගයක් දීලා තිබෙනවා, ජනාධිපතිටයි, අගමැතිටයි උසාවි එන්න කියලා තිස්ස අත්තනායකගේ නඩුවට.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒවා මහින්ද රාජපක්ෂගේ කාලයේ තිබුණේ නැහැ. මතක තියාගන්න. පිස්සෙක් වාගේ කථා කරන්න එපා. මේක හරි වැරැදියි.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වාඩි වෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේට හොඳින් එක පාරක්, දෙපාරක්, තුන් පාරක් කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

පිස්සු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කථා කළේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාවේ බල්ලොත් ඉන්නවාද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැමෝටම එකම නීතිය තිබෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

හැසිරෙන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බල්ලෝ වගේ මන්ත්‍රීවරු හැසිරෙනවාද එහෙම.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවේ නීතියක් තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බල්ලෝ ඉන්නවාද? පිස්සෝ ඉන්නවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. දැන් මේ ප්‍රජාතන්ත්‍රවාදය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බලන්න මේ රටේ පළාත් පාලන ආයතන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනවශ්‍ය -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරුමන්ත්‍රීතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙත් ප්‍රජාතන්ත්‍රවාදය නැති කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න. කාලය අවසන් වෙනවා. අනවශ්‍ය දේවල්, අනවශ්‍ය කථා සියල්ලක්ම හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලා මේ අවස්ථාවේදී මම නියෝග කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ වෙලාවේ නොදුන්නත් අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 12.39]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පළ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම මුලින්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ගෞරවය ස්තූතිය පුද කරනවා. පසුගිය 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාවට විශාල බලාපොරොත්තු ප්‍රමාණයක් දීලා, මේ රටේ ජනතාවට විශාල බොරු ප්‍රමාණයක් පොවලා ආණ්ඩු අරගෙන අද වන විට අවුරුදු දෙකකුත් මාස තුනක් යද්දී අපේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් මට හිතෙන්නේ, මේ පව් හෝදගන්න ගෙනාපු යෝජනාවක් කියන එක තමයි මට මේ යෝජනාව දැක්කාම කියන්න වෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ කථා කරපු මන්ත්‍රීවරුන්ට නම් මම හිතන්නේ වරප්‍රසාද කිසි දෙයක් නැතිව ඇති. හැබැයි, අපේ පැත්තේ කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන්, කොඩිකාර මන්ත්‍රීතුමා හැරෙන්න අනික් අයට නම් මේ යහපාලන ආණ්ඩුව පෙරළුනු එකේ වරප්‍රසාද යම් ප්‍රමාණයක් ලැබුණා. ඒක නිසා ඒ ටික ආරක්ෂා කර ගන්න, ඒ ගොල්ලෝ කථා කරන්න ඇති. හැබැයි අපට මතකයි, එදා 2015 ජනවාරි මාසයේ 08 වැනිදා වන විට මේ රට ආපු ගමන මොකක්ද කියන එක. අද අවුරුදු දෙකකුත් මාස තුනක් ගෙවන කොට මේ රටට වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක පිළිබඳව හිතට එකඟව කල්පනා කරන මේ රටේ ජීවත්වන ඕනෑ කෙනෙකුට හිතා ගන්න පුළුවන්, අපට මොකක්ද වුණේ කියලා. මම හිතන්නේ අද කවුරුත් මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව පැහැදිලිකමක් නැහැ. කවුරුත් මේ රටට වෙලා තිබෙන දේ පිළිබඳව අනේ! අපොයි කියනවාට වඩා වෙන කිසි දෙයක් මේ රටේ කවුරුත් අද කියනවා කියලා අපට හිතාගන්න පුළුවන්කමක් නැහැ.

එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගනිද්දී යුද්ධයක් තියලා භාරගෙන, මේ රටේ කිසිම ජාතික සංහිඳියාවක් ඒකීයභාවයක් පිළිබඳව කථා කරන්න තියා බලාපොරොත්තුවක් නොතිබුණු රටක, ඒ යුද්ධය අවසන් කරලා මේ රටේ ඒකීයභාවය, ඒ වාගේම ජාතික සංහිඳියාව පිළිබඳව ජනතාවට බලාපොරොත්තුවක් දුන්නා. මේ රටේ හැම තැනම බෝම්බ පිපුරුණා. මිනිස්සු මැරුණා. රටේ කොහේවත් යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා පෙන්නුවා, උතුරු - නැගෙනහිර උත්සව තිබුණු ඡායාරූප. හැබැයි, එතුමා කිව්වා, ඒකට ජනාධිපතිතුමා සම්බන්ධයි කියලා. ඒ තත්ත්වය ඇති කරන්න පුළුවන් වුණේ, එදා මහින්ද රාජපක්ෂ රජයට. ඉන් පසුව මේ රට ඉතාමත් වේගයෙන් ඉදිරියට ආවා. හැබැයි මහින්ද රාජපක්ෂ රජයට විශාල ජාත්‍යන්තර තර්ජන ප්‍රමාණයක් තිබුණා. මේ රටේ යුද්ධය අවසන් කරපු නිසා. ඒ තර්ජනවලට නොබියව මුහුණ දීලා, මේ රටේ ආර්ථිකය ගොඩනඟන තරගයට අවතීර්ණ වෙලා තිබුණා. කවුරු හරි කියනවා මට ඇහුණා, මේ වන කොට මහින්ද රාජපක්ෂ සිටියා නම් අපේ රට චීන කොලනියක් වෙලා කියලා. හැබැයි, අපේ රට යුද්ධය අවසන් කරලා, ආර්ථිකය පිළිබඳව බලාපොරොත්තුව ඇතිව මේ රට ඉදිරියට ගෙනාවා. මේ රටේ මාර්ග පද්ධතිය හැදුවා. අද විකුණන් කන්න පුළුවන් වෙන්න මේ රටේ හම්බන්තොට වරාය හැදුවා. ගුවන්තොටුපලවල් හැදුවා.

[ගරු ජනක වැලිවත්ත]

මේ රටේ ආයෝජකයන්ට එන්න පුළුවන් තත්ත්වයට මේ රට බලාපොරොත්තු ඇති රටක් බවට පත් වුණා. මේ රට වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා සිංගප්පූරුවක් එහෙම නැත්නම් තායිලන්තය වාගේ දියුණු වන රටක් බවට පත් වෙනවා කියන ලකුණු පහළ වුණා. මේ රටේ දේශපාලන ස්ථාවර භාවයක් තිබුණා. මේ රටේ ආණ්ඩු පෙරළෙයි කියන තත්ත්වයට මේ රට තිබුණේ නැහැ. ඒ නිසා මේ රටට ආයෝජනය කරන්න ආයෝජකයන් ආවා. චීනය වාගේ රටවල් විශාල වශයෙන් අපේ රට තුළ ආයෝජනය කළා. තව තවත් ආයෝජන එද්දී එදා 08 වැනිදා ආණ්ඩු මාරුවත් එක්කලා මේ සියලු බලාපොරොත්තු ආයෝජකයින් අතරින් නැති වුණා. මොකද, මේ පත් වුණු ආණ්ඩුව පත් වෙන්නේ ජනවාරි 08 වැනිදා ජනාධිපතිවරයා බලයට පත් වුණාට අගමැතිවරයා පත් වෙන්නේ, පාර්ලිමේන්තුවේ හතළිස් ගණනක මන්ත්‍රීවරු ඉන්න එක්සත් ජාතික පක්ෂයට අගමැතිකම දෙනවා. එතකොට අඩු ප්‍රමාණයක් ඉන්න පක්ෂයකින් අගමැතිවරයෙක් පත් වන කොට පාර්ලිමේන්තුවේ ස්ථාවර භාවයක් ගැන අපට හිතන්න බැහැ. මේ රටට මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳව හිතන්න බැහැ. ඊට පසුව තිබෙන මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉල්ලද්දී අද එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරුන් එන්නේ 97 ක් වාගේ ප්‍රමාණයක්. ඒත් බලහත්කාරයෙන් ආණ්ඩුව පත් කරන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වාසිවලට යන, තාන්නමාන්නවලට යන ජනතාවගේ ඡන්දයෙන් පිට උදව්ය අරගෙන පාර්ලිමේන්තුව අදත් කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රට අස්ථාවර භාවයක තිබෙන්නේ. අද මේ රට පුරාම උද්ඝෝෂණ ඇති වෙනවා. දිනෙන් දින මිනිස්සු පාරට බහිනවා. එදා ආණ්ඩුව පත් වෙන්න දීපු පොරොන්දු එකක්වත් ඉෂ්ට කරගන්න බැරි නිසා මිනිස්සු පාරට බහින කොට අද කියනවා, මේ රටේ යහපාලනය නිසයි මේ අවස්ථාව දීලා තිබෙන්නේ. ඒක නැති කරන්න ඕනෑය කියලා. මාධ්‍ය නිදහසක් ගැන කථා කරනවා. අපට මතකයි, එදා මාධ්‍යවල වාර්තා පළ කළේ කොහොමද කියලා. සිරස වාගේ මාධ්‍ය ගත්තාම දිගට හරහට ආණ්ඩුවට ගැහුවේ. පසුගිය ආණ්ඩුව වැටෙනකන් ගැහුවා. ඒ වෙලාවේ මාධ්‍ය නිදහස තිබුණේ නැද්ද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකට ගිණි තිබ්බේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පත්තරවල ඒවා දිගට හරහට ගියා. ඒවා පළ කරන්න පුළුවන්කම තිබුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ. දෙරණ වාගේ මාධ්‍යයකින් යන කොට නිවේදකයාට තර්ජනය කරන්න පුළුවන් තතත්වයකට මේ රටේ අගමැතිවරයා පහත් තත්ත්වයට වැටෙනවා. චතුර කියන නිවේදකයාට නම කියලා තර්ජනය කරන්න පුළුවන් තත්ත්වයට පත් වෙනවා. මෙන්න නිදහස. මේකද මේ රට තුළ මාධ්‍ය නිදහස කියලා කථා කළේ? අවුරුදු දෙකක් තුළ මේ රට තුළ ඇති වුණු දේවල්. මේ රටේ අධිකරණ නිදහසක් ගැන කථා කරනවා. අධිකරණයට ජනාධිපතිවරයා අත පොවලා විනිසුරුවරු පත් කරන තත්ත්වයට, මේ රටේ අධිකරණය අද හැල්ලුවට පත් කරන්න පුළුවන් තත්ත්වයට, මේ රටේ ජනාධිපතිවරයා කටයුතු කරනවා. එහෙම තත්ත්වයට පත් වුණු රටකට එන ආයෝජකයෝ ගැන කථා කරනවා. අද මේ රට මුළු ලෝකයේ අසාර්ථක වුණු රටක් බවට පත් වෙලා තිබෙන්නේ. අද මේ රටේ ගමන සම්පූර්ණයෙන් කඩා වැටිලා.

අද බඩු මිල පාලනය කරගන්න බැහැ. මැතිවරණ පොරොන්දුවලදී ආර්ථික ප්‍රශ්නත් එක්ක තිබෙද්දි රුපියල් 10,000/- කින් ජනතාවගේ පඩි වැඩි කරලා අද ඒ පඩිය ගෙවා ගන්න විධියක් නැහැ. අද පෙට්‍රල් මිල පාලනය කරන්න - ඒ ආයතන අද ඉතා පාඩු ලබන තත්ත්වයට පත් වෙලා. ගෑස් සිලින්ඩරය රුපියල් එක්දහස් ගණනට දෙන කොට විශාල පාඩුවක් රජය ලබනවා. අද රට ගෙනියන්න විධියක් නැහැ. කිසිම ආයෝජකයෙක් මේ රටට එන්නේ නැහැ. ඩොලරය පාලනය කරන්න මුදල් බලෙන් වෙළඳපොළට මුදා හැරලා, අද ඩොලරය පරිස්සම් කරන්නේ ඒ තත්ත්වයට. ඒ කඩා වැටුණු ආර්ථිකයට ජේන තෙක් මානයක රටට ආයෝජකයෙක් එන්නේ නැහැ. ආයෝජකයෙකුට එන්න පුළුවන්කමක් නැහැ. මේ රට ඉදිරි මාස කීපය තුළ ඩොලරය රුපියල් 170/- ට, 200 ට ආසන්න ප්‍රමාණයකට යනවා. ඉතින් මේ රටේ ආයෝජකයන් පිළිබඳව බලාපොරොත්තු තියන්න බැහැ. ඒ නිසා මේ පවතින යහපාලන ආණ්ඩුව තවත් ඉදිරියට ගියොත්

වෙන්නේ මේ රට තව තවත් විනාශ වෙන එක. එදා අපි භාර දෙන කොට රුපියල් 60 ට තිබුණු හාල් කිලෝ එක අද රුපියල් 100 පැනලා ගිහිල්ලා. අද පොල් ගෙඩියක් රුපියල් 85/- යි. අද මේ ආණ්ඩුවට මොනවද කරන්න පුළුවන් කියලා අපි අහනවා. මහ ලොකුවට එදා පොතක් ගෙනැල්ලා, පොත විසික් කළා කියලා මෙතැන අඬනවා. සුරංගනා කථා කියලා ගත්ත ආණ්ඩුව, සුරංගනා පොතක් ගෙනැල්ලා අපේ මේසය උඩ තිබ්බාම, අපි ඒක බලාගෙන අනේ මේක කවද්ද වෙන්නේ කියලා කියනවාද? එහෙම නැත්නම් මේක විවේචනය කරන එක පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපේ යුතුකමක් නොවෙයිද? කියන එක අහනවා. ඒවා කවදාවත් මේ යහපාලන ආණ්ඩුවට කරන්න පුළුවන් දේවල් නොවෙයි. යහපාලන ආණ්ඩුව ඕවා ගෙනෙන්නේ එදා ජනවාරි 08 වැනිදා ජනතාවට පෙන්නපු බොරුව නැවත කියන්න.

මේගොල්ලෝම ඇවිල්ලා එදා කථා කළා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ. ඒ හින්දා අපි ආණ්ඩුවෙන් ඉවත් වෙනවා. පැහැදිලි වචනයක් දෙන්න කියපු උදවිය - එදා මාදුලුවාවේ සෝභිත හාමුදුරුවෝ එළියට බැහැලා මේ ආණ්ඩුව පත් කරන් ප්‍රධාන මාතෘකාව වුණු විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කිව්වා. උන්වහන්සේ සිටියා නම් අද පෙට්‍රල් ටිකක් දාගෙන පිච්චිලා මැරෙනවා. මේ යහපාලන ආණ්ඩුවේ උන් කියන කථාවලට. මොකද, හොඳ වෙලාවට උන්වහන්සේ අපවත් වුණේ. අද කියනවා, මේක අයින් කරන්න ඕනෑ නැහැයි කියලා. මොකද, අපි දන්නවා අද එක්සත් ජාතික පක්ෂයේ කොටසයි, මෛත්‍රීපාලගේ කොටසයි දෙපැත්තට බෙදිලා දෙන්නාගේ දෙපැත්තේ බලය පරිස්සම් කර ගැනීමේ තරගයක ඉන්නවා. එක කොටසක් කියනවා, මේක තියන්න ඕනෑ. අනික් අය කියනවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වුණොත් එහෙම මෛත්‍රීපාල පස්සේ ගිය රැළටම වෙන්නේ වහ බොන්න. ඒ නිසා අදට ඒක පරිස්සම් කරගන්න හදනවා. ජනතාවට දීපු පොරොන්දු සියල්ල පසෙක දාලා. ඒ නිසා මේ ආණ්ඩුව පත් වෙලා, මේ ගෙවුණු අවුරුදු දෙකක කාලය තුළ අද මේ රටට වුණු දෙයක් නැහැ. මේ රටට ලැබුණු දෙයක් නැහැ. ඉදිරියට යන්න ගිය රට සම්පූර්ණයෙන් විනාශ වුණු රටක් බවට පත් කරලා, අද මිනිස්සුන්ට දවසේ ගන්න පඩිය, මාසේ ගන්න පඩිය සතියක් කන්න බැරි තත්ත්වයට, අද ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ. ව්‍යාපාරිකයන්ට ගහන්න පුළුවන් තරම් රටේ තිබෙන බදු ටික සේරම එකතු කරලා ව්‍යාපාරිකයන්ට ගහනවා. මේ ආණ්ඩුව ජීවත් වන්නේ, එදා වෙල ටුවර්ස් වාගේ. කොහෙන් හරි සල්ලි සොයලා. අද මේ ආණ්ඩුවට තිබෙන එකම විකල්පය පසුගිය රජය කාලයේ ඇති කරපු, පසුගිය රජය කාලයේ ආරක්ෂා කරපු රාජ්‍ය දේපළ ටික විකුණන එක විතරයි. ඉදිරි මාස කිහිපය තුළ මේ රටේ තිබෙන රාජ්‍ය දේපළ සියල්ල, ලාභ ලබන රාජ්‍ය දේපළ සියල්ල විකුණනවා. ඒ විකුණලා තමයි මේ ආණ්ඩුව ගෙනියන්න වෙන්නේ. එහෙම නැතිව අර ස්වාසිලන්තයක් ගැන කථා කරලා අපට විහිළු කළාට, අද බටහිර රටවල් දෙනවා කියපු දේවල් ලැබුණාද? එනවා කියපු රටවල් ආවට ආයෝජන ආවද? ටයර් කම්හල ස්ථාපිත කළාද? වොක්ස්වැගන් කොම්පැණි ඇති කළාද? අපි අහනවා, මේ රටේ ජනතාවට දීපු පොරොන්දුවලින් මේ ආණ්ඩුවට මොනවද කරන්න පුළුවන් වුණේ කියලා. මේ ගෙවුණු දින තුළ. දින 100 යේ ව්‍යාපෘතියක් කියලා සුරංගනා පොතක් ගහලා, සුරංගනා පොත පෙරළලා අහවල් දවසේ මේක කරනවා. අහවල් දවසේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා. අහවල් දවසේ රැකියා ලක්ෂ 10 ක් ඇති කරනවා. නංගිලාගේ මල්ලිලාගේ උකස් කරපු කණකරවලට කපපු පොලිය නැවත ගෙවනවා. එහෙම කියලා දීපු මේ ආණ්ඩුව අද වනතුරු මොනවද දීලා තිබෙන්නේ. මේ ගෙවිලා තිබෙන මාස 10 ක් තුළ. ඒ නිසා මේවා සුරංගනා කථා. මේ රටේ ජනතාව නොමඟ යවන බොරු ප්‍රචාර කරන්නේ නැතිව, පුළුවන් නම් මැතිවරණයක් ගෙනෙන්න. මැතිවරණයක් ගෙනැල්ලා මේ රටේ ජනතාව ඉන්නේ කොතැනද කියලා පෙන්වන්න ගෙනෙන්න. එහෙම නැතිව බහුතරයක් නැතිව ගෙනෙන මේ වාගේ යෝජනා තේරුමක් නැහැ.

අද ඒකාබද්ධ විපක්ෂයේ කට්ටිය මෙතැන වාඩි වෙලා ඉන්න නිසා යන්තම් මේ යෝජනාව පිළිබඳව විවාද කරන්න පුළුවන් තත්ත්වය හරි තිබෙනවා. නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 07 යි මෙතැන ඉන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 06 දෙනෙක් විතර ඉන්නවා. අපෙත් ඔය උදව් කරන මන්ත්‍රීවරු 17 දෙනෙක් විතර ඉන්නවා. නැත්නම් දැනුත් මේකේ ගණපූරණය නැහැ. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂය ආණ්ඩුව විතරක් නොවෙයි. රට විතරක් නොවෙයි. පළාත් සභාවත් රැකගෙන තවමත් ඉදිරියට යනවා. ජනතාවගේ බලාපොරොත්තු ආරක්ෂා කරන්න කියන දේ කියමින් ඔබ තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 12.50]

**ගරු අනුරාධ විමලරත්න**
**Hon. Anuradha Vimalarathne**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිත්සිරි කහටපිටිය ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීතුමා, මම ගොඩක් ගරු කරන මගේ සහෝදර මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවට වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව දීම ගැන මම ඔබතුමාටත් අපේ විපක්ෂ නායකතුමාටත් හයේ ගැහි ගැහි හරි ඒ අවස්ථාව ලබා දීපු අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් මගේ ස්තූතිය එකතු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම දන්නවා, එතුමා සත්භාවයෙන් ගෙනාවේ. නමුත් එතුමා මේ යෝජනාව දාලා ටිකක් කාලයක් ගිහිල්ලා ඇති කියලා මට හිතෙනවා. මොකද, මේකේ න්‍යාය පත්‍රයේ එන්න කල් යන නිසා අර එදා තිබුණු ඒ අදහසම එතුමාගේ හිතේ තිබෙනවාද කියන එක ගැන මට ගැටලුවක් තිබෙනවා. මොකද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය තිබුණු රජය ඉවත් කරලා මේ රටට ආණ්ඩුවක් ගෙනෙන්න, යූ.ඇන්.පී ආණ්ඩුවක් හදන්න මේ රටේ හතර කොනේම දේශපාලන වේදිකාවල කථා කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මම කෙළින් කථා කරනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට සතුටු වෙන්න බැහැ. ඇත්ත වශයෙන්ම මගේ කටින්ම මම වේදිකාවල කියලා තිබෙනවා, පසුගිය රජය මේ ජාත්‍යන්තර කුමන්ත්‍රණ කියලා බිල්ලෙක් මවලා තිබෙන්නේ කියලා. විදුලි පුටුව කියලා බිල්ලෙක් මැව්වේ කියලා. ඒක මම අදත් පිළිගන්නවා.

ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපට ජාත්‍යන්තරයෙන් වැඩි පිළිගැනීමක් තිබෙනවා කියලා මම දන්නවා. නමුත් මේක පොඩි වැරැදි ටිකක් හදාගෙන කරගත්ත හොඳක් විතරයි. ඒ වාගේම මේ ආණ්ඩුව හරහා යම්කිසි නිදහසක්, වැරැදියට පාවිච්චි කරන්න හරි ජනතාවට නිදහසක් ලැබිලා තිබෙනවා කියන එකත් මම පිළිගන්නවා. බඩු මිල සමහර දේවල් අඩු වෙලා. හැබැයි ගොඩක් දේවල් වැඩි වෙලා. ඒකත් මම පිළිගන්නවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හදපු ආණ්ඩුව පිළිබඳව අපි පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ඕනෑ. අපි ඇත්ත කථා කරනවා. මේ පාට කණ්ණාඩි ගලවලා බලනවා නම් අපට සතුටු වෙන්න පුළුවන්ද? අද ජනතාවගේ ජනමතය පාර්ලිමේන්තුව ඇතුළේ නියෝජනය වෙනවාද කියන එක අපේ හදවත්වලට තට්ටු කරලා අහන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේත් ජනමතය විකෘති වෙලා තිබුණා. ඒක මම පිළිගන්නවා. හැබැයි, ඒක කිය කියා අපට මේ වැඩේ කරන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මොකද, අද මේ රටේ ජන මතය විකෘති වෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා එක්ක ඉඳලා එතුමා වැරැදි වැඩ කරන කොට වැරැදියි කියලා කොන්දක් කෙළින් තියාගෙන කියන්න බැරි පුද්ගලයන් ඡන්දය පැරැදුණාට පස්සෙත් ජාතික ලැයිස්තුවලින් ඇතුළට ගෙනැල්ලා ආණ්ඩු පිහිටුවන්න ඇමැතිකම් දීලා අද බලයට පත් කරලා තිබෙනවා. ඒගොල්ලෝ කරන වැඩ මහින්ද මහත්මයාට ගෙදර යන්න පාර කැපුවා වාගේම, මේ ආණ්ඩුවටත් ගෙදර යන්න පාර කපන වැඩ මේ අය කරනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ගෙනල්ලා දා ගත්ත කට්ටියට විතරක් නොවෙයි කියන්නේ. UNP එකෙත් අපි ඔය වැරැද්ද කරලා තිබෙනවා. එදා අපි මේ රටේ කිව්වා, රාජපක්ෂ, එහෙම නැත්නම් රජ පවුල් සංගමයක් තිබුණා කියලා. හැබැයි, UNP කාරයෙක් හැටියට අද මම පපුවට තට්ටු කරලා ඇහුවොත් අදත් ඒ වාගේ එකක් තිබෙනවා. අද රාජකීය මිතුරු සංගමයක් මේ රටේ ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනමතය කියන එක ඇත්තටම විකෘති වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ තමන්ට ජන මතය හදා ගන්න අර මහින්ද රාජපක්ෂ මහත්මයා වරප්‍රසාද දීලා අනික් පක්ෂවලින් ගත්තා වාගේ මේකෙත් කරගෙන යනවා.

අපි දන්නවා. දැන් වාහනවලට කියලා කොපමණ වියදම් කරනවාද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද කියලා කීයක් දෙනවාද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවට වැඩිය මේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය අඩු අටකින් විතරයි. 109 ක් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවේ සිටියා. මේකේ 101 ක් ඇමැතිවරු ඉන්නවා. ඒක ජනතාවට බරක් නොවෙයිද? ඊයේ පෙරෙයිදා තව කෝටි පනස් ගණනක් වාහන අරන් දෙන්න අයින් කරලා තිබුණා. කෝටි 54 ක්. මන්ත්‍රීවරු 10 දෙනෙක්ට වාහන අරන් දෙන්න කියලා. ඔවා අපේ හිතට තට්ටු කරලා ඇහුවොත්, ඕවා අපට අනුමත කරන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. ඔය වාහන ගැන කථා කරනවා නම් අද වාහන අවභාවිතාව

පිළිබඳව නඩු තිබෙන පුද්ගලයන් ඕනෑ තරම් ඉන්නවා. නමුත් ඒ වාහන කෝ? ඒ වාහන පාවිච්චි කරන්න පුළුවන් නේ? මහින්ද රාජපක්ෂ මහත්මයලා අවභාවිතා කරපු වාහන කෝ? නඩු තිබෙනවා. වාහන ටික නැද්ද? එහෙම නැත්නම් මේ ඇමතිවරුන්ට ජනතාවගේ කරපිටින්, ජනතාවගේ දුකින් ආපු මේ මන්ත්‍රීවරුන්ට, ඇමැතිවරුන්ට පරණ වාහනයක් පාවිච්චි කරන්න බැරිද? අපි මේවා ගැන අහන්න ඕනෑ. මම දන්නවා, රටේ ලොකු විපර්යාසයක් වෙලා තිබෙනවා. එදාට වැඩිය යම්තාක් දුරට හොඳයි කියන එක මම පිළිගන්නවා. නමුත් අපි තව කථා කරන්න ඕනෑ දේවල් තිබෙනවා.

මහින්ද රාජපක්ෂ මහත්මයා මොකක් හරි ක්‍රමයකින් කාලයක් පාලනය කරගෙන සිටියා, නමුත් මේ රටේ අද පාතාලය - ආපසු අද ඔළුව උස්සගෙන එනවා. සති දෙක තුනකට ඉස්සෙල්ලා වාගේම අපි අද පාතාල ක්‍රියාකාරකම් දකිනවා. අද එළිපිට කෙරෙනවා. සුදු වැන් සංස්කෘතිය නැවතුණ එක හොඳයි. හැබැයි, නරක දේවලුත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කල්පනා කරලා බලන්න. යහපාලන රජයක් තිබෙනවා කියලා ජනතාවට හොඳයි කියනවා. නමුත් කුඩු වසංගතය අපේ කොහෙවත් අඩු වෙලාද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ කවුරු ගෙනාවා හරි අපි දැක්කා කුඩු කිලෝ 100, 200 මාස දෙතුන් සැරයකට අල්ලනවා. දැන් ආණ්ඩුවෙන් අල්ලන්නේ මොනවාද? කොකේන්. කොකේන් අදාළ නැහැ. කොකේන් ගහන මනුස්සයා අම්මාගේ තාත්තාගේ කණ කර කඩාගෙන යන්නේ නැහැ. ජනතාවට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා බලන්න. ඔබතුමන්ලාගේ අපේ ගම්වල කුඩු අඩු වෙලාද? නැහැ. කුඩු වැඩියි. කුඩු වැඩියි කියන්නේ මහින්ද මහත්මයාගේ කාලය වැඩිය දැන් කුඩු ගණන් අඩුයිලු. ඇයි? Suplie එක වැඩි වෙලා. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අද අපි ඇත්තටම හිතට තට්ටු කරලා ඇහුවොත් ණය බර හින්දා වෙන්න පුළුවන්. මුදල් නැති නිසා වෙන්න පුළුවන්. නමුත් සංවර්ධනය කියන එක මේ රටේ අඩාල වෙලා තිබෙනවා කියන එක අපි කවුරුත් පිළිගන්න ඕනෑ. ඒ ගිය ගමන, රඳා ගත්ත රඳා ගැනීම අද අඩු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ විතරක් නොවෙයි. නීතියේ ස්වාධීනත්වය තිබෙනවයි කියලා කියනවා. ඒක ඇත්ත. නැහැ නොවෙයි. නීතිය ඇතුලේ, උසාවියේ ස්වාධීනත්වය තිබෙනවා. නමුත් මහ බැංකු බැඳුම්කරයේ ඒ හොරු කෝ? උසාවියට ඉදිරිපත් කළාද? ජනතාවට දරන්න පුළුවන් දෙයක්, ඒ කියන්නේ විශ්වාසයක් තියන්න පුළුවන් ක්‍රමවේදයක් අද ඒ වෙනුවෙන් වෙලා තිබෙනවාද? මම දන්නවා, 2011 සිට ඔය මහ බැංකු හොරකම වෙනවා. කබ්රාල් මහත්මයාගේ කාලයේ සිට. නමුත් එහෙම තිබුණාය කියලා අපි අපේ වැරැදි එහෙම කියලා වහගන්න බැහැ. එතැන ලොකු අඩුපාඩුවක් වෙලා තිබෙනවා. ජනතාවට සතුටු වෙන්න බැරි දෙයක් එතැනදී වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. මම කොළඹ නගර සීමාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මේකත් මම මගේ ජනතාව වෙනුවෙන් කියන්න ඕනෑ. එදා ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කරපු හැමදේම මට අනුමත කරන්න බැහැ. නමුත් කොළඹ ඇවිදලා බැලුවොත්, වාහනයක යනවා දැක්කොත් කොළඹ එදා තිබුණු එළිය, එදා තිබුණු පිරිසිදුකම අද නැහැ. ඒකට හේතු වෙලා තිබෙන්නේ මොකක්ද? හරි ශක්තිමත් පාලනයක් මේ රජය ඇතුලේ නැහැ. කවුද කරන්නේ? මොනවද කරන්නේ? කියන එක කවුරුවත් දන්නේ නැහැ. වැරැද්දක් වුණොත් UNP එකට බණිනවා. හොඳක් වුණොත් අනේ ජනාධිපතිතුමා නේ කියලා වඳිනවා. ඔක තමයි වෙලා තිබෙන්නේ. අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් නැති ආණ්ඩුවක් වෙලා. කවුරුත් මේකේ වගකීමක් භාර ගන්න බැරි ආණ්ඩුවක් වෙලා. ඉතින් කොහොමද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි සතුටු වෙන්නේ? රාජ්‍ය සේවකයන්ගේ ඒ රාජ්‍ය යාන්ත්‍රණය අද බිඳ වැටිලා. කාටවත් වැඩක් කරගන්න බැහැ. දුප්පත් මිනිහෙක්ට කොහොම වෙතත් මන්ත්‍රීවරයෙක්ට ගිහිල්ලා වැඩක් කරගන්න බැරි රජයක් වෙලා. ගියාම වගකීම ගන්න කවුරුත් නැහැ. කොහොමද අපි සතුටු වෙන්නේ?

ඒ විතරක් නොවෙයි. අපි කථා කරන්න ඕනෑ වැදගත්ම දේ, ජනතාවගේ මතය දැනගන්න ඕනෑ නම් ඡන්දයක් තියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඡන්ද කෝ? අද දුප්පත් මිනිහට තිබෙන ලොකුම අමාරුව තමයි ප්‍රාදේශීය සභාවට, නගර සභාවට ගිහිල්ලා වැඩක් කර ගන්න බැහැ, ජනතා නියෝජිතයෙක් නැති නිසා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඡන්ද තිබ්බ ක්‍රමය හරියි කියලා මම කියන්නේ නැහැ. එතුමාට වාතයක් පිට කරන්න ඕනෑ වුණත් ඡන්දයක් තිබ්බා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක නරකත් නැහැ. මොකද, ජනතාවට තමන්ගේ මතය ප්‍රකාශ කරන්න යන ආණ්ඩුවට මේ යනවා වාගේ වැරැදියි

[ගරු අනුරාධ විමලරත්න]

කියලා කියන්න අවස්ථාවක් තිබෙන්න ඕනෑ. ඒක තමයි ඡන්දය කියලා කියන්නේ. මේ ඡන්ද තියන්නේ නැතිව ජනතාව අද ගොඩාක් දුරට දුක් විඳිනවා. ඒ විතරක් නොවෙයි. ජනතා මතය ආණ්ඩුවට කියාගන්න බැරිව අද UNP කාරයෝ ලත වෙනවා. අනික් කට්ටිය කොහොම වුණත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගෙදර යන්න වෙයි වගේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

එහෙම යන්න වෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. ජනතාව එක්ක තිබෙන සම්බන්ධය අද මේ රජයට නැහැ. අද රජය කරන්නේ මොනවාද? යන්නේ කොයි පාරෙද කියලා ජනතා නියෝජිතයන් වන අපිත් දැන ගන්නේ අර ජනාධිපතිතුමා දැන ගන්නවා වාගේ. වෙලා ඉවර වෙලා ඊට පසු දින අපි පත්තරෙන් දකිනවා. ඕක තමයි ඇත්ත. අපට වෙලා තිබෙන්නෙත් ඕක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සතුටින් නොවෙයි ඉන්නේ. අපි අනුමත කරන්නේ නැහැ. ඒ වාගේම තව දෙයක් කියනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ විශාල වශයෙන් වංචාව, දූෂණය, අකාර්මිකතාවයන් තිබුණාලු. ඔව් තිබුණා. මම පිළිගන්නවා. හැබැයි, ඒ වංචාව, දූෂණය, අකාර්මිකතාවයන් මේ රජය ඇතුළෙත් තිබෙනවා. නැතිව නොවෙයි. එදා සිය දෙනෙක් හොරකම් කරපු රුපියල් 100 අද දෙන්නෙක් හොරකම් කරනවා. කියන්නේ කවුද කියලා ඔක්කොමලා දන්නවා. ඒ වැරැද්ද අපිම පිළිගන්න ඕනෑ. ඔය වාගේ තත්ත්වයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, UNP කාරයෝ ඡන්දය දුන්නේ, මෙහෙම ආණ්ඩුවක් කරන්න නොවෙයි. UNP කාරයෝ තමන්ගේ ආණ්ඩුවක් කියලා බලාපොරොත්තු වුණේ හරීන් ප්‍රනාන්දුලා, සුජීව සේනසිංහලා, ඉරාන් වික්‍රමරත්නලා, දොස්තර හර්ෂ ද සිල්වලා ඉදිරියේ ඉන්න ආණ්ඩුවක්. නමුත් අද ඉන්නේ කවුද? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විකෘති වෙලා තිබෙනවා වාගේම අපේ කට්ටියත් මේක විකෘති කරගෙන තිබෙනවා. UNP කාරයෝ 99% ක් මේ කරන දේවල් අනුමත කරන්නේ නැහැ. හෘද සාක්ෂියට එකඟව අනුමත කරන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඉතින් අපේ කිත්සිරි කහටපිටිය මැතිතුමාගේ යෝජනාව, එතුමා සත්භාවයෙන් ඒක ඉදිරිපත් කළත් එක්සත් ජාතික පක්ෂය හැටියට, ඒ විතරක් නොවෙයි ජනතා නියෝජිතයෙක් හැටියට මට සතුටු වෙන්න බැහැ. හැබැයි මගේ ආදරණීය ගරු මන්ත්‍රීවරුනි, මට හිතෙනවා දේශපාලඥයින් හැටියට අද පොඩ්ඩක් අපිත් වරද්දාගෙන තිබෙනවා. අපි UNP කාරයෝ හැටියට 2020 රනිල් වික්‍රමසිංහ මහත්මයාව ජනාධිපති කරලා අපේ ආණ්ඩුවක් පිහිටුවන ගමනක ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය මෛත්‍රීපාල මහත්මයාගේ ජනාධිපති ධූරය යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුව හදන ගමනක ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ඒකාබද්ධ විපක්ෂය මහින්ද රාජපක්ෂ මහත්මයාව ජනාධිපති කරන ගමනක ඉන්නවා. මේ ඔක්කොම වැරැදියි. මම කියන්නේ අපි ඉන්න ඕනෑ අපේ ජනතාවගේ පැත්තේ. හරි දේ වෙනවා නම් හරි කියන්නත්, අපේ නායකයෝ හරි වැරැද්දක් කරනවා නම් වැරැදියි කියලා කියන්නත් අපි ජනතාව එක්ක හිටගන්න ඕනෑ, අපි මන්ත්‍රීවරු හැටියට. අපේ පළමුවැනි වගකීම තිබෙන්නේ එතැනයි. ඉතින් මම ඔබතුමන්ලා සියලු දෙනාටම ආරාධනා කරනවා. යහපාලනය ගෙන යන්න ඕනෑ මේ කාවවත් ජනාධිපති කරන්න නොවෙයි. එන්න. ඇවිල්ලා අපි ඔක්කෝම එකතු වෙලා මේ රජයේ තිබෙන වැරැදි හදාගෙන, මේ රජයේ ගෙදර යවන්න කට්ටිය ඉන්නවා නම් ඒගොල්ලන්වත් ඇරලා ජනතාව වෙනුවෙන් හිටගන්න ගමනට එක් වෙන්න. ඒ විතරක් නොවෙයි. මම කනගාටුවෙන් හරි කියන්න ඕනෑ. අද UNP කාරයෙක් හැටියට කියන්න ලැජ්ජයි. ජනතාව වෙනුවෙන් කෙලින් කථා කරන්නේ, අපේ JVP සහෝදරයෝ විතරයි කියලා මට හිතෙන තත්ත්වයක් ඇවිල්ලා තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සහෝදර රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මට චෝදනාත්මක කථා කළා මම මොන පැත්තෙන්ද කථා කරන්නේ කියලා. මම හිතනවා එතුමාට උත්තරයක් ලැබෙන්න ඇතියි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.00]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතියි. මම හිතන්නේ එතුමාගේ අගමැතිතුමා හැමදාම TV එකේ අඳෝනාවක් කරනවා, ණය, ණය කියලා. ඊයේ පෙරේදා කියනවා මේ ණය මෙතෙක් කල් හිතාගෙන හිටියේ සිරීපාදේ දක්වා ඇති කියලාලු. දැන් මේ ණය තියෙනවාලු හිමාලයටත් වඩා උඩින්. ඔන්න ණය අහගන්න. මේ ආණ්ඩුව එනකොට රජය ණය තිබුණේ, රුපියල් බිලියන 7391 යි. ඊළඟට දළ දේශීය නිෂ්පාදිතය, ඒ ණය ප්‍රමාණය 70.7% යි. ඊළඟට 2005 දී ආණ්ඩුව ගන්න කොට ණය ඩොලර් බිලියන 2220 යි. ඒක දළ දේශීය නිෂ්පාදනයෙන් 25% යි. එතකොට හත්දහස් ගණන ලොකු ණයක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව 2015, 2016 වනකොට, මේ ආණ්ඩුවෙන්ම කියනවා. ණය ගෙවන්න තිබෙන්නේ, රුපියල් බිලියන 548 යි කියලා. හැබැයි මේ ආණ්ඩුව මේ අවුරුදු දෙකට ණය අරගෙන තිබෙනවා රුපියල් බිලියන 2011 ක්. ගෙවන්න තිබෙන්නේ 548 නම් 2011 ක් අරගෙන මොනවා කළාද? පාරක් හැදුවෙත් නැහැ. තාර දැම්මෙත් නැහැ. කොන්ක්‍රීට් දැම්මෙත් නැහැ. අපට කන්න දුන්නෙත් නැහැ. සංවර්ධනයක් නොකර ණය අරගෙන අපට තේරෙන්නේ අර අර්ජුන් මහේන්ද්‍රන් හොරකම් කරලා තිබෙන ණය ප්‍රමාණය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට 2014 වනකොට මේ රටේ ආයෝජන තිබුණා ඩොලර් බිලියන 1.6 ක්. 2014 දී. 2015 දී ඒකෙන් භාගයයි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ 2016 වෙද්දී ඩොලර් බිලියන නොවෙයි. ඩොලර් මිලියන 450 යි. ආණ්ඩුව යහපාලනයලු. නීතිය තියෙනවාලු. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වෙලාලු. ඊළඟට අගමැතිතුමා, ජනාධිපතිතුමා පක්ෂ දෙකකින් ඇවිල්ලාලු. ඊළඟට විපක්ෂ නායක උතුරෙන් ඇවිල්ලාලු. ඊළඟට විපක්ෂයේ සංවිධායක තවත් පක්ෂයකින් ඇවිල්ලාලු. බොහොම සාධාරණ පාලනයක් තියෙනවාලු. නමුත් මේ රටට ආයෝජකයෝ එන්නේ නැහැ. හේතුව මොකක්ද? අපි දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අගමැතිතුමාලා කොපමණ උත්සාහ කළත්, මේ ආණ්ඩුව අස්ථාවරයි කියන්න ජාත්‍යන්තරය දන්නවා. මේ රජය අස්ථාවරයි කියලා. ඇයි ඒ? අගමැතිතුමා කට ඇරියොත් ණය, ණය කියනවා. මම යනවා කොහේ හරි පොලියට සල්ලි ගන්න. මම කියනවා මවං අතනට ණයයි. මෙතැනට ණයයි. මේ බැංකුවට ණයයි. කර කියා ගන්න දෙයක් නැහැ. කන්නත් නැහැ. නන්නත්තාරයි කියලා. මට පොලියට දෙයිද? මාව දකිනකොට දුවනවා. දැනුත් එහෙම තමයි. මාව දකිනකොට දුවනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තමයි ඇත්ත තත්ත්වය. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යහපාලන ආණ්ඩුව ඒමෙන් මෙන්න මෙහෙම තමයි අද මේ රටට ගිය කල. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2014 මැයි 16 වැනිදා ලංකාවට ආව රොබටෝ බ්ලේක් කියන තානාපතිවරයා මහින්ද රාජපක්ෂ මැතිතුමාට කියනවා, ඔය යුද්ධය නවත්වන්න. අපට මුලතිව්වලට කොටු වෙලා ඉන්න, නන්දිකඩාල්වලට කොටු වෙලා ඉන්න, ඒ පළමුවැනි පෙළේ නායකයෝ ටික පිටරටට අරගෙන යන්න කියලා. මොකද, වෙනත් රටවල් හිටියා. ප්‍රභාකරන් හැදුවේ ප්‍රධාන නායකයෝ භාර වෙන්න. 300 ක් විතර පිටරට අරගෙන යන්න. දෙවැනි පෙළ නායකයෝ ටික UN එකට භාර වෙන්න. තුන්වැනි පෙළ නාකයෝ ටික හමුදාවට භාර වෙන්න. මෙන්න මේ යෝජනාව ඇමරිකාව ප්‍රමුඛ රටවල් ටික දැම්මා. දැම්මාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාවත්, හිටපු ආරක්ෂක ලේකම්තුමාවත්, අපේ ජෙනාරාල් ෆොන්සේකා මැතිතුමාවත් මේ කිසිම කෙනෙක් ඒ යෝජනාව පිළිගත්තේ නැහැ. එතුමන්ලා ගහලා, ගහලා මැයි 19 වැනිදා නන්දිකඩාල් කලපුවේ ප්‍රභාකරන්වත් මරලා අවසන් කළා. එදා ඉඳලා අද දක්වා එක බට්ටෙක් පත්තු වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉරාකේ යුද්ධය අවසන් වෙලා අවුරුදු 10 ක් වෙනවා. තවම කාර් බෝම්බ යනවා. බින්ලාඩන් මරලා අවුරුදු 08 ක් වෙනවා. තවම කාර් බෝම්බ යනවා. ප්‍රභාකරන් මරලා දැන් අවුරුදු 08 යි. බට්ටෙක්වත් පත්තු වෙන්නේ නැහැ. ඇයි ඒ? මේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රබල සහ පල්ලෙහාටම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කළා. මේ ඝාතනය කළේ ත්‍රස්තවාදීන්ව. ඒක නිසා අද මේකේ දහලන්න අය නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අන්න ඒ කියපු දේ ඇහුවේ නැති නිසා ඇමරිකාව ප්‍රමුඛ, මෙතුමා කිව්වා වාගේ මොන්ටිනිග්‍රෝ, මැසිඩෝනියාව,

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

එංගලන්තය, ඇමරිකාව කියන රටවල් හතර, මේ අය කියපු යෝජනාවට යටත් වුණේ නැහැයි කියලා මානව හිමිකම් යෝජනාවක් ගෙනාවා. යුද්ධය කාලයේ මානව හිමිකම් කඩ වුණා කියලා. එතකොට ඉරාකයට ගහන කොට මැරුණේ නැද්ද? බින්ලාඩන් මරන්න ඇෆ්ගනිස්ථානයේ ගියේ නැද්ද? ලිබියාවේ මැරුණේ නැද්ද? ඒවාට එක මානව හිමිකමක්වත් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ලොකු ලොකු ත්‍රස්තවාදීන් මේ යුද්ධය අවසන් කරලා, ප්ලේන් තිබුණු, නැව් තිබුණු, ලෝකයේ ප්ලේන් තිබුණු එකම ත්‍රස්තවාදී සංවිධානය එල්.ටී.ටී.ඊ. එක. ඒක නිම කරපු අපේ රටට, අපේ හමුදාවට මානව හිමිකම් ගෙන ආවා. මොකටද? මහින්ද රාජපක්ෂව කොටු කරන්න. ගෝඨාභය රාජපක්ෂව කොටු කරන්න. ඊළඟට අපේ ජෙනරාල් ෆොන්සේකා ඇතුළු ත්‍රිවිධ හමුදාවේ නායකයන් කොටු කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු අසෝක සපුමල් රන්වල**
**Hon. Asoka Sapumal Ranwala**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමාගේ නොදැනුවත් භාවයෙන් හරි ප්‍රකාශ කෙරුණා සමූළ ඝාතනයක් සම්බන්ධව. ඒක අපේ හැන්සාඩ් වාර්තාවට බරපතළ විධියට බලපාන්න ඉඩ තිබෙනවා. මම විශ්වාස කරන්නේ ඒක නොදැනුවත් භාවයෙන් ප්‍රකාශ කළා කියලා. ඒක නිසා එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපේ රට ගැන හිතලා, ජාතිය ගැන හිතලා රටක් විධියට මම හිතන්නේ එතුමාගේ අතින් වැරැදිලාද දන්නේ නැහැ ප්‍රකාශ වුණේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
**Hon. Ananda Harischandra de Silva**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමත් එක් පිළිගන්නවා. බොහොම ස්තුතියි. ඒක අයින් කරන්න. සමූල ඝාතනය නොවෙයි. ඒ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් පිරිස ඝාතනය කළා. යුද්ධයේදී විනාශ කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ප්‍රබල නායකයන්ව විනාශ කළා. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතැනදී එදා අපට හයිබ්‍රිඩ් අධිකරණයක් යෝජනා කළා. විදේශ විනිසුරුවන් යෝජනා කළා. එදා එංගලන්තයේ හිටියේ ඩේවිඩ් කැමරන්ලා. ඇමරිකාවේ බැරක් ඔබාමා හිටියේ. බැරක් ඔබාමාගේ නීතිය තමයි - එතුමා සුළු ජාතිකයෙක්. සුළු ජාතිකයන්ව ලං කරගෙන යන ගමනක්. අද එහෙම නොවෙයි. අද ඉන්නේ ට්‍රම්ප්ලා. ඊළඟට එංගලන්තයේ ඩේවිඩ් කැමරන්ලා නැහැ. එහෙම නම් අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ (බාධා කිරීමක්) මම නම් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ මේක අවස්ථාවක් කර ගන්න ඕනෑ. දැන් මේක අවුරුදු දෙකකට කල් තැබුවා. ඇයි මේ? දැන් ජාත්‍යන්තරයට පේනවා, තේරෙනවා මේ යෝජනාව ගෙනාවේ මහින්ද රාජපක්ෂට, එදා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂයට සහ ත්‍රිවිධ හමුදාවට දඬුවම් කරන්න. එතකොට මේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාටත්, රනිල් වික්‍රමසිංහ මහත්තයාත් නොවෙයි මේක ගෙනාවේ. එහෙම නම් මේ යෝජනාව දැන් මුල්ලකට කරලා අනාගතයේ මහින්ද රාජපක්ෂ මහත්තයා හෝ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා හෝ ආවොත් එහෙම - අවුරුදු 02 ක් කියන්නේ 2020 ට කිට්ටු වෙනවා නේ? ආයෙත් මේ යෝජනාව ගන්නවා. තමන්ගේ ඔළුව උඩ කඩුව කැරකෙනවා වාගේ බයෙන් ඉන්න වෙයිද? මේක එදාට ගේන්න තමයි පා තැබුවේ. නමුත් අද කරන්න ඕනෑ ඒක නොවෙයි. මේ පාලනය වෙනස් වෙලා තිබෙන මොහොතේ කරන්න ඕනෑ එක්කෝ මේ යෝජනාව අයින් කර ගන්න එක. එහෙම නැත්නම් මේ හයිබ්‍රිඩ් අධිකරණය, විදේශ විනිසුරුවන් මේකට ගෙනෙන එක අයින් කර ගන්න එකයි. නමුත් එහෙම උවමනාවක් මේ රජයට තිබුණත්, ජනාධිපතිතුමාට තිබුණත්, අගමැතිතුමාට තිබුණත් විදේශ ඇමැතිතුමාට උවමනාවක් නැහැ. අද අගමැතිතුමාවත්, ජනාධිපතිතුමාත් කියන දේ විදේශ ඇමැතිතුමා අහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක මම හිතන්නේ අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා බොහොම සර්ව සාධාරණ විවේචනයක් කළා. කාටවත් බැන්නේ නැහැ. එතුමාගේ හදවතේ කකියන දේ - මම නම් පක්ෂග්‍රාහී කියන්න එපැයි. හදවතේ කකියන දේ එතුමා කිව්වා. බොහොම සාධාරණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඔය මොන යහපාලනය කිව්වත් රටේ යහපාලනයක් නැහැ. අපේ සමසමාජ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා තමන්ගේ බලතල අඩු කරගත්තු ලෝකයේ එකම නායකයා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කියලා. කොහේද අඩු කර ගත්තේ? තුන් පාරක් ජනාධිපතිකම බැහැ කියලා දැම්මා, මහින්ද රාජපක්ෂ එයි කියන බයට. ඩුවෙල් සිටිසන් නැති කළා ගෝඨාභය එයි කියලා බයට. 35 න් පල්ලෙහාට ඡන්දය

ඉල්ලන්න බැහැ කිව්වා නාමල් එයි කියලා බයට. ඊළඟට මිනිස්සුන්ට තමන්ගේ ආණ්ඩුව නරක නම් ජනාධිපතිතුමාට බලයක් තිබුණා වසරකින් ඒක විසුරුවලා ඒ ආණ්ඩුව හොඳ නැත්නම් ජනතාවට බලය දෙන්න. ආයෙත් තමන්ට ආණ්ඩුවක් පත් කරන්න. අවුරුදු 4 ½ ක් යනකල් ආණ්ඩුව හොඳ හෝ නරක ඒකේ ඉන්නවා. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නැති කළා. ඒවා තමයි අඩු කළේ. වෙන මොනවාද? කොමිසමක් පත් කළා. ඔය දැන් තිබෙන කොමිසන් කාටද බැරි? පොලිස් කොමිස ආවා පාතාලය පිරිලා. මැතිවරණ කොමිසම ආවා පේනතෙක් මානයක ඡන්ද නැහැ. ඔය ජාතියේ කොමිසන් දාන්න පුළුවන් සියයක් විතර. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ ආණ්ඩුව ගැන කථා කරනවා නම් තව දවසක් කථා කරන්න පුළුවන්. එහෙම නේ? මම ඊයේ පෙරෙයිදා මළ ගෙදරක ගියා. ඒ මළ ගෙදරදී වයසක කෙනෙක් කියනවා මහත්තයෝ අර මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලේ සීනි කිලෝ එකේ ගණනට මුගේ ආණ්ඩුවේ ලූණු කිලෝ එක ගිහිල්ලා කියලා. බලන්න ගියාම ඇත්ත නේන්නම්. සීනි ගණනට ලූණු ඇවිල්ලා. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාධාරණයක් වෙලා නැහැ. මේ ආණ්ඩුව ඉක්මණනට ගෙදර යන්න හෝ නොයන්න තව එක දෙයක් ඉල්ලනවා. ඉතිහාසයේ වැඩිම ඩෙංගු දැන්. ඇයි? පළාත් පාලන ආයතන අද ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන ලේකම්ලාට වැඩ කරන්න බැහැ. FCID යයි කියලා බයේ බැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාවට තීන්දු ගන්න මේ ඡන්දය තියන්න. පළාත් පාලන මන්ත්‍රීවරු අද ඡන්දයක් එයි. හෙට එයි කියලා කියනවා. ඔය යහපාලනය තියෙනවා නම්, ඡන්දය තියන්න. ඡන්දය තියන්නේ නැත්තේ බයට. අර පීනන්න බැරි එකා වතුරට පනින්නේ නැහැ නේ? ඒක නිසා ජීවිතේට ඡන්ද තියන්නේ නැහැ. තල්ලු කරන්න වෙන්නේ. ඒ තල්ලු කරගෙන යන්න නම් උද්ඝෝෂණ කරන්න ඕනෑ. උද්ඝෝෂණ කරන්නත් එපා කියලා මේ ආණ්ඩුව කියනවා. එහෙම නේද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ, නැහැ. උද්ඝෝෂණ කරන්න -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එහෙම නම් දැන් කියන්නේ කොහේ හරි මුල්ලකට ගිහිල්ලා කරන්න කියලා. අපි කරන උද්ඝෝෂණ රජයට දැනෙන්නේ නැත්නම් දැනෙන විධියට කරන්න ඕනෑ. ඒ දැනෙන විධියට කරන කොට මේ ආණ්ඩුව කියනවා මුල්ලකට ගිහිල්ලා කරන්න කියලා. ඔබතුමා කිව්වා උද්ඝෝෂණ කරන්න අයිතිය තිබෙනවා කියලා. හැබැයි හැම උද්ඝෝෂණයකටම ගැහුවා. වතුර ගැහුවා. කඳුළු ගෑස් ගැහුවා. බැටන් ප්‍රහාර ගැහුවා. අයිතිය කොහේද? ඕවා ගිහිල්ලා අනුරාධපුරේ කළාට කාටද තේරෙන්නේ? කාටවත් තේරෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දුන්නාට ස්තූතියි. ඔබතුමාට මේ යෝජනාව ගෙනැල්ලා යහපාලන ආණ්ඩුවටත්, අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් මේවා දැනෙනවා නම් ඔබතුමාට පිංසිද්ධ වෙනවා.

[අ.භා. 01.12]

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තූතියි. ඇත්තටම මම මේ යෝජනාව ගැන අපේ මන්ත්‍රීතුමන්ලා දැක් වූ අදහස්වලට සවන් දීගෙන ඉන්න කොට මට හිතුනා, අපේ එක්සත් ජාතික පක්ෂයේ සහෝදර අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා නවත්වපු තැනින් කථාව පටන් ගත්තා නම් හොඳයි කියලා. මේ යෝජනාව පිළිබඳව අපේ මන්ත්‍රීවරු බොහොමයක් අදහස් දක්වද්දී මේ මන්ත්‍රීවරු අදහස් දැක් වූයේ, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය වුණේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාව හෝදන්න. ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු බොහොමයකට උවමනාව තිබුණේ මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමාව හෝදන්න. ඒක හරහා මේ මන්ත්‍රීවරු බලාපොරොත්තු වෙනවා ඇති තමන්ගේ නායකයා තමුන්ට වැඩිපුර වරදාන, වරප්‍රසාද දෙයි. තමුන්ව හොඳින් බලාගනියි කියලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එයින් එහාට ගිහිල්ලා පාට කණ්ණාඩි ගලවලා අපි මේ කරන දේවල් දිහා නැවත වාරයක් හැරිලා බලලා අපේ රට ගමන් කරන්නේ කොහාටද කියන එක පිළිබඳව නැවත වාරයක් ස්වයං විවේචනයක යෙදෙන්න අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත්ම උචිතයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම මේ යෝජනාවේ එතුමා සඳහන් කරලා තිබෙනවා, 'ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගනිමින්' කියලා. මේ යෝජනාව ගැන අදහස් දැක් වූ මන්ත්‍රීවරු කිව්වා. පසුගිය රජය කාලයේ ස්වාසිලන්තයේ නායකයා මෙහි ආපු එක වැරැදියි. ඒවා නොවෙයි

[ගරු සුසාර දිනාල්]

ජාත්‍යන්තර සම්බන්ධතා කියන්නේ කියලා. ඔව්. ස්වාසිලන්තය වාගේ ජාත්‍යන්තර සිතියමේ, ලෝක දේශපාලන සිතියමේ බලයක් නැති රටක නායකයෙක් අපේ රටට ඇවිල්ලා, එයත් එක්කලා සම්බන්ධතා ඇති කර ගැනීම තුළ රටේ ජාත්‍යන්තර ප්‍රතිපත්තිය එළියට එන්නේ නැහැ. ඒ වාගේම තමයි බ්‍රිතාන්‍ය මහ රැජිණ මේස් එක ගැලෙව්වා කියලා ඒකෙන් ජාත්‍යන්තර ප්‍රතිපත්ති එහෙම නැත්නම් අපේ රටේ ජාත්‍යන්තර සම්බන්ධතා එළියට එන්නෙත් නැහැ. එතුමිය තමන්ව හම්බ වෙන්න එන කෙනෙක්ට ගරු කරපු පමණින්, එතුමිය තමන්ව හමු වෙන්න එන කෙනෙක්ට ආචාර කළ පමණින් ඒක නොවෙයි, රටක ජාත්‍යන්තර ප්‍රතිපත්තියේ පිළිඹිබුව වෙන්නේ. අද අපේ රටේ ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් තිබෙනවාද? විදේශ ඇමැතිතුමා එකක් කියනවා. අගමැතිතුමා තව එකක් කියනවා. ජනාධිපතිතුමා තව එකක් කියනවා. ජනාධිපතිතුමා එක රටකට යනකොට ඊට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දේශපාලන මතයක් දරන රටකට අගමැතිතුමා යනවා. හැබැයි, මේ කිසිම රටකින් අද අපේ රටට, අද අපේ රටේ අනාගතය වෙනුවෙන් කිසියම් සුභවාදී යෝජනාවක්, කිසියම් සුභවාදී ප්‍රතිපත්තියක්, කිසියම් සුභවාදී ව්‍යාපෘතියක් සිද්ධ වෙනවාද කියලා අපි නැවත වාරයක් හිතලා බලන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ ඉන්න කාලයේ අපේ රටේ ජනතාව අතර මතයක් තිබුණා බටහිර ලෝකය, ඇමරිකාව, එංගලන්තය, යුරෝපය එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ නායකත්වය යටතේ අපේ රටට උදව් කරයි කියලා. හැබැයි අද ඒක සිද්ධ වෙනවාද? අද කිසි ලෙසකින්වත් බ්‍රිතාන්‍යයවත්, යුරෝපයවත්, ඇමරිකාවවත් අපේ රටේ ආර්ථික සංවර්ධනයට, අපේ රටේ ජනතාවගේ සුභ සාධනයට කිසියම්ම හෝ වැදගත් වන ප්‍රතිපත්තියක්, යෝජනාවක්, ව්‍යාපෘතියක් ගෙනැල්ලා තිබෙනවාද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමරිකාවේ දේශපාලනය සම්පූර්ණයෙන්ම උඩ් යටිකුරු වුණා. අපේ අය බලාගෙන හිටියා, ක්ලින්ටන් නෝනා ඇවිල්ලා අපේ අය ගලවාගෙන යයි කියලා. හැබැයි සිද්ධ වුණේ, එතැන දේශපාලනය සම්පූර්ණයෙන්ම උඩියටිකුරු වීමයි. යුරෝපා සංගමයෙන් ඉවත් වෙන්න එංගලන්ත ජනතාව තීරණය කළා. පෙරේදා නෙදර්ලන්තයේ ඡන්දය තිබුණා. පරාණ භයේ හිටියේ, ජර්මනියේ චාන්සල්වරිය, ඇන්ජලා මෝගල්. යම් හෙයකින් නෙදර්ලන්තයේ අන්ත දක්ෂිණාංශික ජාතිවාදී පක්ෂය ජය ගනියි කියලා. තව සති දෙක තුනකින් ප්‍රංශයේයි, ජර්මනියෙයි ඡන්දය තියෙනවා. මේ යුරෝපයම බය වෙලා ඉන්නවා නැවත වාරයක් ප්‍රංශයේයි, ජර්මනියේයි බල පෙරළියක් වෙයි කියලා. තුර්කියෙන් ජර්මනියට ඇඟිල්ල දික් කරලා කියනවා අද ජර්මනියේ නැවත වාරයක් නාසිවාදය හිස ඔසවනවා කියලා. තුර්කියේ නායකයා මේක කියන්නේ. ජනාධිපතිවරයා මේක කියන්නේ. මෙන්න මේ වාගේ ජාත්‍යන්තර වේදිකාවක් ඇතුළේ අපේ අය බලාගෙන ඉන්නවා ඇමරිකාවෙන් ඇවිල්ලා, යුරෝපයෙන් ඇවිල්ලා අපි වැටිලා තිබෙන මේ ආර්ථික ආසාධයෙන් අපව ගොඩ ගනියි කියලා. මම මේ මන්ත්‍රීවරුන්ට මතක් කරලා දෙනවා මෑත ඉතිහාසයේ කවදාද, මොන ව්‍යාපෘතියද අපට බටහිර රටවල් දුන්නේ? දුන්නා නම් ව්‍යාපෘතියක් දුන්නේ එක්කෝ රුසියාව. නැත්නම් චීනය. නැත්නම් ඉන්දියාව. එහෙම නැතුව අපේ රට ආර්ථික අවපාතයකින් ගලවා ගන්න බරපතළ විධියේ ව්‍යාපෘතියක් අපට දීපු බටහිර රටක් නැහැ. බටහිර රටවල්වලට උවමනා වෙන්නේ, ඒ අයගේ දේශපාලන මතවාදය ආසියාකරයට පතුරුවන්න හොඳ මධ්‍යස්ථානයක් විධියට ලංකාව තියාගන්න විතරයි. ඒක නිසා අපේ ජනතාව හැමදාම වරද්ද ගත්තු තැන තමයි, අපේ දේශපාලන නායකයෝ හැමදාම වරද්ද ගත්තු තැන තමයි බටහිරින් ඇවිල්ලා අපව ගලවා ගන්නකල් බලාගෙන හිටපු එක.

මේ මන්ත්‍රීතුමාගේ යෝජනාවේ එතුමා සඳහන් කරලා තිබෙනවා ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගනිමින් කියලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පේන්නේ තිබුණු ජාත්‍යන්තර සම්බන්ධතා ටිකත් අද වෙද්දී නැතුව ගිහිල්ලා තිබෙනවා. අද අපට ආයෝජකයෝ එන්නේ නැහැ. ඒක තමයි යථාර්ථය. අද අපේ රටේ කිසිම අලුත් ආයෝජනයක් නැහැ. හේතුව මොකක්ද? එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂය පසුගිය මැතිවරණයට කලින් බොහොම පැහැදිලිව කිව්වා, මේ පෝට් සිටි නවත්වලා දානවා කියලා. මේක රටට ගැළපෙන්නේ නැහැයි කියලා. ආවට පස්සේ ඒක නවත්වලා දැම්මා. ඒ ආයෝජනය ඒ වෙලාවේ නැවැත්තුවා. ඊට පසුව මාස හයකට, අවුරුද්දකට පස්සේ නැවත වාරයක් ඒක ආරම්භ කරනවා. එදා ඩොලර් බිලියන ගණනක ආයෝජකයෝ මේ සඳහා එකඟ වෙලා තිබුණා. නමුත් ඒ ආයෝජකයෝ දැන් බයයි. නැවත වාරයක් මේ වාගේ දේශපාලන පක්ෂයක් ඇවිල්ලා

මේක නැවැත්තුවොත් එහෙම මොකද වෙන්නේ? මත්තල ගුවන් තොටුපළේ වී ගබඩා කළා. අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා, ජනතා විමුක්ති පෙරමුණේ හිටපු මන්ත්‍රීතුමාව උපුටා දක්වමින්, අගමැතිතුමා සමග පැයක් කථා කළාම ඇති කියලා, ගොඩක් දේවල් ඉගෙන ගන්න තිබෙනවා කියලා. ඉගෙන ගන්න දේවල් තිබෙනවා. කවුද එයාර් පෝට් එකක වී ගබඩා කරන්නේ? එක මීයෙක් ඕක ඇතුළේ හැදුනා නම් ඊට පස්සේ ගුවන් යානා ගොඩ බාන්නේ නැහැ. ඒකේ වී ගොඩ බෑවා. ඒක වී ගබඩා කෙරුවා. ගබඩා කරපු වී ටික ඊට පස්සේ බියර් කම්පැණිවලට විකුණලා දැම්මා. දැන් මෙට්‍රික් ටොන් 50,000, 100,000 ය පිටරටින් ගේනවා. මේ වාගේ දේවල් ඉගෙන ගන්න පුළුවන්. බැංකුවකින් හොරකම් කරලා අහුවෙන්නේ නැතුව ඉන්න විධිය ඉගෙන ගන්න පුළුවන්. එහෙම නැත්නම් මිනිස්සුන්ගේ අක්කර දහස් ගණන් විකුණන හැටි ඉගෙන ගන්න පුළුවන්.

ඒක නොවෙයි රටක් ඉදිරියට යන්න විය යුත්තේ. අද මේ රටේ එක ආයෝජකයෙක්වත් එන්නේ නැහැ. පරණ ආයෝජන ටික, කරපු ආයෝජන ටික පත්වාගෙන යෑම පිළිබඳව ඒ මිනිස්සුන්ට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ බරපතළ ප්‍රශ්නයට හේතුව රටේ රජය ස්ථාවරව කටයුතු නොකිරීම. අද අගමැතිතුමා නාන හැම වෙලාවකම ජනාධිපතිතුමාට ඒක ගොඩ දාන්න සිද්ධ වෙලා තිබෙනවා. Budget එක නාපු හැම තැනකම ජනාධිපතිතුමාට ඒක ගොඩ දාන්න සිද්ධ වෙලා තිබෙනවා. වෙලා තිබෙන්නේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අගමැතිතුමා නාන තැන් හෝදන්න වෙලා තිබෙන්නේ. පිහදාන්න වෙලා තිබෙන්නේ. මේ විධියට මේ රටට ඉස්සරහාට යන්න බැහැ. එක්සත් ජාතික පක්ෂයේ ජාත්‍යන්තර ප්‍රතිපත්තියයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාත්‍යන්තර ප්‍රතිපත්තියයි ඉතිහාසයේ ඉඳලාම වෙනස්. මේ දෙක අතරේ නොයෙකුත් බරපතළ ගැටීම් තිබුණා. ඒ ගැටීම් හරහා මේ පක්ෂ දෙක එකතු වෙලා එක ප්‍රතිපත්තියක් අද වනකල් මේ රටට ගෙනැල්ලා නැහැ. අපි කියනවා අගමැතිතුමා හොඳයි. ජනාධිපතිතුමා හොඳයි. හෙට හවසට ජනාධිපතිතුමා හම්බ වෙන්න තිබෙනවා නම්, අද හොඳ කියලා. හෙට ගිහිල්ලා කියනවා, ඔබතුමා ගැන මම හොඳ කිව්වා කියලා. ඒක නොවෙයි සිද්ධ වෙන්න ඕනෑ. පක්ෂ කණ්ඩායම් රැස්වීම ඇතුළේ විතරක් මේවා තියාගෙන හිටපු කාලය දැන් ඉවරයි. දැන් ජනතාවට මේවායේ ඇත්ත තත්ත්වය වැටහෙමින් පවතින යුගයක අපි ජීවත් වෙන්නේ. සංචාරකයෝ එන එක නැවතීගෙන යනවා. අද ඩොලර් එක ඉහළ නැඟීම නිසා සංචාරක කර්මාන්තයටම බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ අය මීට අවුරුද්දකට කලින් තමන්ගේ හෝටල්වල මිල ගණන් ජාත්‍යන්තරයට යවලා ඉවරයි. ඩොලර් 100 යි කියපු කාමරයකින් ඒ අය බලාපොරොත්තු වුණා රුපියල් 15,000 ක්. නමුත් දැන් ඒක තවත්, තවත් වෙනස් වෙලා තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් මේ මිල ගණන් එහා මෙහා වීම නිසා. යූරෝ එක අද 154 ට වැටිලා. ඩොලර් එක අනෙක් පැත්තෙන් නැගලා. මේවා හරහා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හදන්න ඕනෑ. ඩොලර් එක නගිනවා නම්, යෙන් එක නගිනවා නම්, යූරෝ එක වැටෙනවා නම්, පවුම වැටෙනවා නම් අන්න එතැන ඉඳලා අපේ ආයෝජන ප්ලෑන් කරන්න ඕනෑ. සැලසුම් කරන්න ඕනෑ. එහෙමයි රටක විදේශ ප්‍රතිපත්තිය සූදානම් කරන්නේ. උතුරු කොරියාවේ ඉඳලා ඇමරිකාවට ගහන්න පුළුවන් මිසයිලයක් බැලැස්ටික් මිසයිල, අත්හදා බලනවා කියලා ඇමරිකාව හොඳටම කලබල වෙලා චීනයට බලපෑම් කරන්න උත්සාහ කරනවා, මේක පාලනය කරන්න කියලා. ඒ අය කැස කවන්නේ ලංකාව වාගේ තැනක හමුදා කඳවුරක් ආරම්භ කරන්න.

අපට පසුගිය දවස්වල පිලිපීනයේ අධ්‍යාපන චාරිකාවක් තිබුණා. එහේ තිබුණු කඳවුරු දැන් අයින් කරලා තිබෙන්නේ. ඒක නිසා ලංකාව වාගේ රටවල්වල කඳවුරු ඇති කරන්න මේ අය බලාපොරොත්තු වෙලා තිබෙනවා. එතකොට මේවාට අපි කොහොමද ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් හදාගෙන මුහුණ දෙන්නේ? ඒක තමයි අපි සලකා බලන්න ඕනෑ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාවෙන් කියන ජාත්‍යන්තර සම්බන්ධතා කියන කාරණාව අද අපේ රට ඉතාම පහත් තත්ත්වයකින් සලකාගෙන යන්නේ. අද අපේ ජාත්‍යන්තර සම්බන්ධතා ඉතාම අවම මට්ටමකයි තිබෙන්නේ. නායකයෙක් වෙනත් රටකට ගිය පමණින් ජාත්‍යන්තර සම්බන්ධතා ඇති වෙන්නේ නැහැ. මේ රටේ ජනතාව දැන ගන්න කැමැතියි පෙරේදා චීන ආරක්ෂක ඇමැති මේ රටට ආවේ මොකටද කියලා. කාට හරි මේ ඇමැතිතුමෙක්ට, නැත්නම් විපක්ෂ නායකතුමාට කියන්න පුළුවන්ද පෙරේදා චීන ආරක්ෂක ඇමැතිවරයා මේ රටට ඇවිල්ලා, මේ රටේ

[ගරු සුසාර දිනාල්]

ජනාධිපතිවරයා හම්බ වෙනවා නම්, අගමැතිවරයා හම්බ වෙනවා නම් ඒකේ පදනම මොකක්ද කියලා. ඇයි ආරක්ෂක ඇමැති කෙනෙක් ඉන්නේ? අන්න ජාත්‍යන්තර සම්බන්ධතාවල පිටුපස සැඟවිලා තිබෙන කාරණා. මේවා සම්බන්ධයෙන් අපි මොන විධියේ ප්‍රතිපත්තියක්ද අනුගමනය කරන්නේ කියලා. මේ රටේ මිනිස්සු ඒවා දැන ගන්න කැමැතියි. එහෙම නැතුව තමන්ගේ පක්ෂය, තමන්ගේ නායකයා හොඳ හොඳා හිටපු කාලය දැන් ඉවරයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මෙතැනින් එහාට මේ රටේ ජනතාවට ඉදිරියට යන්න පුළුවන් විධියක් අපි හදාගන්න ඕනෑ. අද ආයෝජකයෝ අහනවා, රුපියල බාල්දු වීම හරහා අපට උඹලාගේ රුපියල ගැන දෙන්න පුළුවන් සහතිකය මොකක්ද? යුද්ධය ඉවර වෙනකොට 120 ට 125 ට තිබුණු ඩොලර් එක අද 155 ට ගිහිල්ලා තිබෙනවා. මොකක්ද අපි ආයෝජකයෙක්ට දෙන සහතිකය? අපේ විදේශ ප්‍රතිපත්තිය තුළ රුපියල පාලනය කර ගන්න තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද? මේවා තමයි අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම පැහැදිලිව මේ අවස්ථාවේ කියනවා. අපේ රටේ අද වනකොට මේ තිබෙන හවුල් ආණ්ඩුවේ කිසිම තැනක යහපාලනයක් නැහැ. අද වෙලා තිබෙන්නේ, හවුල් ආණ්ඩුව කියන එකට සමාන පදයක් විධියට යහපාලනය ගාවන්න හදනවා. යහපාලනයේ කිසිම මූලධර්මයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නිකන් හරි ආයෝජකයෙක් ආවොත් ඒ ආයෝජකයාට කුට්ටි පිටින් අද කොමිස් දෙන්න වෙලා තිබෙනවා. ඒක නිසා එන ආයෝජකයොත් ආපහු හැරිලා යනවා. එහෙම නැත්නම් අගමැතිතුමාව අන්දලා වොක්ස්වැගන් වාගේ ඒවා පටන් ගන්නවා. ටයර් කොම්පැණි පටන් ගන්නවා. අන්දලා කරන්නේ. එතුමාත් දන්නේ නැතුව ගිහිල්ලා ඒක විවෘත කරනවා. විවෘත කළාට පස්සේ තමයි දන්නේ, මමත් ඇඳලා කියලා. මේවා නොවෙයි රටක වෙන්න ඕනෑ. අගමැති දන්නේ නැහැ තමුන් ගිහිල්ලා විවෘත කරන්නේ මොකක්ද කියලා. ඇමැතිතුමා කියන්නේ නැහැ මොකක්ද මේ විවෘත කළේ කියලා. වොක්ස්වැගන් සමාගම කියනවා මේවා අපේ නොවෙයි කියලා. මේ වාගේ තත්ත්වයක අපි ජීවත් වෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව හරහා ඇත්තටම අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා අර අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ නැවත වාරයක් මේ රටේ සිද්ධ වන දේ පිළිබඳව ස්වයං විවේචනයක් කරන්න. එහෙම කරලා අපි මේ රට නැවත වාරයක් යහපත් තැනකට ගෙනියන්න හදමු. හැබැයි අගමැතිතුමා එක පැත්තක් බලාගෙන, ජනාධිපතිතුමා තව පැත්තක් බලාගෙන, විදේශ ඇමැතිතුමා තවත් පැත්තක් බලාගෙන, රවී කරුණානායක මහත්තයා ඒ හැමෝටම වැට් ගහමින් හිටියොත් එහෙම මේ රට නම් ගොඩ දාන්න හම්බ වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. මීළඟට සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 01.25]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කනගාටු වෙනවා. ඔබතුමා තමයි අද මූලාසනයේ බොහෝ වේලාවක් සිටියේ. ඔබතුමා කථා සමබර කරද්දී, කථික ලැයිස්තුව ඔබතුමා අතට ගිහින් තිබෙනවා. ඒ ඒ පක්ෂවලට කථා දීමේදී - දැන් බලන්න. අද අපි කථා දෙකක් දාලා තිබෙනවා. මමත් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත්. දැන් ඔබතුමා කථා දෙක එක ළඟට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා අපට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ වෙලාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සංවිධායකතුමන්ලා දෙන කථික ලැයිස්තුව තමයි අපි මෙහෙන් ඉදිරිපත් කරන්නේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කථික ලැයිස්තුව ඔබතුමාට සමබර කිරීමේ අවස්ථාවක් තිබෙනවා. අපිත් පක්ෂයක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මෙතැන විධිමත් සංවාදයක් ඇති වන්නේ ඒ ඒ පක්ෂවල මතයන් මේ සභාවට ආවොත් තමයි. කථික ලැයිස්තුවේ පිළිවෙළම නොවෙයි. නමුත් විධිමත් සංවාදයක් ඇති වන්නේ ඒ විධියට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යහපාලනය සහ පසුගිය පාලන සමය සංසන්දනය කරමින් විවිධ කථා ගොඩක් ඇහුණා. දැන් ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි මේ ප්‍රශ්නය දිහා බලන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාලන ක්‍රම දෙකේම මුහුණු වෙනස් වුණාට අනිකුත් ප්‍රතිපත්තීන් සහ ක්‍රියා මාර්ග දෙකම එකයි කියලා, දැන් රටේ ජනතාවට හරි පැහැදිලිවම පෙනෙන්න පටන් අරගෙන තිබෙනවා. පසුගිය කාලයේ මේක ටිකක් අපැහැදිලිව තිබුණා. නමුත් දැන් පැහැදිලිව පේනවා. මේ පක්ෂ දෙකම වෙන වෙනම ආණ්ඩු කළත්, එකට ආණ්ඩු කළත් කරන්න වෙන්නේ එකම දේ කියලා මේ කථිකයන්ගේ කථා දිහා බැලුවාම පේනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව වෙනස් කරගන්න එක හේතුවක් තමයි අවුරුදු දෙකකට කලින් මැතිවරණයක් පැවැත්වීම. ඒ නිසා මේ කාටවත් දොස් කියලා වැඩක් නැහැ. මේ තිබුණු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව බිඳ වැටුණේ වෙන වෙන කාරණා නිසාය කියලා. අවුරුදු දෙකකට කලින් මැතිවරණයක් ගෙනාපු එකත් එක කාරණයක්. නමුත් පරාජය වෙයි කියලා හිතුවේ නැහැ. ඒ වාගේම තමයි මේ වර්තමාන රජය අවුරුදු දෙකක් මැතිවරණ කල් දැමීමත්, ඒ අයටත් ගෙදර යන්න වෙන එක් හේතුවක් හැටියට පත් වෙමින් දැන් ඒ තත්ත්වයට ආණ්ඩුවට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය මැතිවරණය වෙලාවේදී මේ ආණඩුව හදන්න රටේ ජනතාවට දීපු පොරොන්දු පත්‍රයක් තිබෙනවා. ඒ අනුව තමයි මේ රට පාලනය කරනවා කියලා ජනාධිපතිතුමාගේ පිංතූරයකුත් සහිතව මෙන්න මේක අපේ ගෙවල්වලට ඒ දේශපාලන පක්ෂ විසින් බෙදා හැරිය පත්‍රිකාවක් වන්නේ. දැන් ඒකේ තිබෙනවා, වෙනසකට එක් වෙමු. මෛත්‍රී පාලනයක්. දින 100 කින් අලුත් රටක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයගොල්ලොත් සිටියා නේ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හීන් බබා සීයේ මම අප්පච්චිගේ කාලය ගැන කියන්න යන්නේ නැහැ. මම කියන්න යන්නේ මේ වර්තමාන පාලනය ගැන. ඒ නිසා හීන් බබා සීයලාගෙන් ඉල්ලා සිටිනවා, බාධා නොකර ඉන්න කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමන්ලා නේ බෙදුවේ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පාඩුවේ ඉන්න කෝ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කොහොමද මම මේක බෙදුවා කියලා කියන්නේ. ඔබතුමා කියන්න මම මේවා බෙදුවාද කියලා. මේවා බෙදන්න අපි ගියේ නැහැ. අපි කවුරුත් මේවා බෙදුවේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. මඟුල් කරන්න ගියේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න. බාධා කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේවා එකක්වත් බෙදුවේ නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි බෙදුවේ නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා නිකන් මඩ ගහන්න එපා. ඔබතුමා නිකන් මට පුද්ගලිකවත් මඩ ගැහුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තමන්ගේ සීට් එකට යන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා කොහොමද බෙදුවා කියන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි බෙදුව දෙයක් නැහැ. තමුන්නාන්සේලා. අපි කොහෙද මේවා බෙදුවේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මහින්ද හොඳ නැහැයි කියලා කෑ ගහලා නැවැත්තුවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හොඳ නැහැ කිව්වා තමයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මහින්ද හොඳ නැහැයි කියද්දී ආණ්ඩුවත් එක්ක දීග කාගෙන හිටිය හාදයෝ මේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සීට් එකට යන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමන්ලා තමයි -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඕක තමයි අපි කිව්වේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒවා අපෙන් අහගන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කාන්ති කොඩිකාරත් එක්ක හවුලේ කාපුවා අපෙන් අහගන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒකනේ අපි ආණ්ඩු කරන්න බැහැයි කිව්වේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙදුවේ නැහැ. දායක වුණා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් සතුටුයිද?

[සභාවේ ඝෝෂා]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මහ ලොකුවට -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් ඔබට සතුටුයිද?

[සභාවේ ඝෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වෙලාව දෙන්න. මේ බාධා කිරීම් නිසා මගේ වෙලාව යනවා. අපරාදේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් ඔබට සතුටුයිද?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දෙගොල්ලටම දෙයියන්ගේ හාල් කැවිලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් අපට නම් හොඳටම සතුටුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ ක්ෂණික සහන වැඩ සටහන කියන එක මේ සභාවේ නැවතත් මතක් කරන්න මම කැමැතියි. මොකද මේක හැන්සාඩ් ගත විය යුතු නිසා මේ ටික නැවත මතක් කිරීමක් අවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මේකේ පළමුවැනි එක තමයි රාජ්‍ය සේවකයෙකුට රුපියල් 10,000 කින් වැටුප් වැඩි වීමක් කරනවා කියන එක. දෙවැනි කාරණය තමයි මෝටර් සයිකල් ලබා දීමේදී අසාධාරණයට ලක් වූ රාජ්‍ය සේවකයන් ගැන සොයා බලා ඒ අයටද එම සහන ලබා දීම. දැන් ලැබුණාද? තුන් වැනි කාරණය තමයි දේශපාලන වහල් වැඩට යොදාගෙන ඇති උපාධිධාරීන් රාජ්‍ය සේවයට විධිමත් පරිදි ඇතුළත් කොට ඔවුන්ගේ සුදුසුකම්වලට සරිලන උසස්වීම් ක්‍රමයක් ඇති කිරීම.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

69,000 ක් එළියේ රස්සාවල් නැතිව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් සතුටුයිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හතරවැනි එක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කරන තෙක් ඔවුන්ට රුපියල් 3500/- ක අන්තර් දීමනාවක් ලබා දීම. රාජ්‍ය බැංකුවල තිබෙන -

[සභාවේ ඝෝෂා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පස්වැනි කාරණය තමයි රාජ්‍ය බැංකුවල තිබෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවල පළමු ලක්ෂ 10 සඳහා ගෙවනු ලබන පොළිය 15% දක්වා වැඩි කිරීම. හයවැනි එක,

[සභාවේ ඝෝෂා]

සමෘද්ධි සහනාධාරය උපරිම 200% දක්වා වැඩි කිරීම.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒකේ 1% යි අඩු.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හත්වැනි එක තමයි, දරුවෙකු ප්‍රසූත කරන සෑම මවකටම පෝෂදායි ආහාර ලබා ගැනීම සඳහා රුපියල් 20,000/- ක

[ගරු සරත් පතිරණ]

දීමනාවක් ගෙවනු ලැබේ. අටවැනි එක තමයි, අතවශ්‍ය ආහාර ද්‍රව්‍ය 10 ක් සඳහා අය කරන අධික බදු ඉවත් කොට මිල පහත හෙළීම.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කොත්තමල්ලි.

[සභාවේ ඝෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මීට සමගාමීව අත්‍යවශ්‍ය ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලා එකතු වෙලා නේ ඕක හැදුවේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නව වැනි එක. ඉන්ධන වලින් රජය අය කරන කෝටි 4000 ක අධික තීරු බදු ඉවත් කර ඉන්ධන මිල අඩු කරමින් එහි වාසිය මහජනතාවට ලබා දීම. දහවැනි එක ප්‍රවාහන -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

බොරුවට කියලා වැඩක් නැහැ. ඕක එකතු වෙලා හැදුවේ. හැමෝම දන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හීන් බබා සීයේ. මම මහ රජ්ජුරුවෝ ගැන කියන්න ගියේ නැහැ. පොඩ්ඩක් ඉන්න කෝ. දහ වැනි කාරණය. ප්‍රවාහන කර්මාන්තයට අවශ්‍ය දිරි දීමනා ලබා දෙමින් රජයේ මෙන්ම පුද්ගලික අංශයට පොදු ප්‍රවාහන සේවාවල ඵලදායිතාවය ඉහළ නැංවීමට ක්‍රියා කිරීම. දහතුන. වී කිලෝවක් මිලදී ගන්නා සහතික මිල රුපියල් 50/- දක්වා ඉහළ දැමීම. අර්තාපල් කිලෝවක් මිලදී ගන්නා සහතික මිල -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දින 100 විධායක කමිටුවේ සිටියා කියලා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයත් එක්කෙනෙක්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා බාධා කරන්න එපා. කථා කරන්න. ඉවර කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොහෙද සිටියේ කියලා නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට උත්තර දෙන්න මට වෙලාව නැහැ. ඒක නිසා පස්සේ වෙලාවක ගරු මන්ත්‍රීතුමාට උත්තර දෙන්නම්. මට මේ ටික කියා ගන්න දෙන්න. අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 80 ක් 90 ක් අතර පාලන මිලක් පවත්වාගෙන යාම.

රබර් සඳහා රුපියල් 350/- ක පාලන මිලක් පවත්වාගෙන යාම.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

රබර් කිලෝවක මිල රුපියල් 190/- යි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අංක දාසය. කිරි ගොවීන්ට කිරි ලීටරයකට රුපියල් 60/- ක සහතික මිල රුපියල් 10/- කින් වැඩි කිරීම.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

රුපියල් 30/- යි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

සියලු ගොවි ණය 50% කින් කපා හැර, ගෙවීමට ඇති ඉතිරි මුදල නැවත අයෝජනය කර ගෙවීමට සහන කාලයක් ලබා දීම.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ කාලය ඔක්කොම ඉවරයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට (බාධා කිරීම්) බෝග වගාවටද, මනුෂ්‍යයාටද -

[සභාවේ ඝෝෂා]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගෑස් අඩු කළා. පෙට්‍රල් අඩු කළා. ඩීසල් අඩු කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඡන්ද ප්‍රතිඵලද ඔය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාව මදී. මේ බාධා කරනවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තව විනාඩි දෙකක් දෙන්න. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට ලබා දෙන බාල පොහොර වෙනුවට ප්‍රමිතියෙන් යුතු පොහොර කුඩා තේ වතු හිමියන්ට ලබා දීමට කටයුතු කිරීම.

අංක 20. මහ මුහුදේදී ජීවිත අහිමි වන ධීවරයෙකු වෙනුවෙන් රුපියල් දස ලක්ෂයක රක්ෂණාවරණයක් රජයේ දායකත්වයෙන් ලබා දීම.

අංක 21. ගොවීන්ට වගා හානි රක්ෂාවරණයක් රජයෙන් දායකත්වයෙන් යුතුව ලබා දීම.

අංක 22. ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරනවා කිව්වා. ගොවියන්ට. ධීවරයන්ට.

අංක 23. ත්‍රීරෝද රථ රියැදුරු, මේසන් හෝ වඩුවැඩ -

[සභාවේ ඝෝෂා]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වෙලාව ඉවරයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඇතුළු අවිධිමත් රැකියා -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

විශ්‍රාම වැටුපක් ලබා දීම. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදේශ රැකියාවන්වල නියුතු සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් දායක ක්‍රමයක් ආරම්භ කිරීම. අනේවාසික ගිණුම් සඳහා සියයට 2.5% ක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කෑ ගහන්න එපා. ඒක විපක්ෂ කණ්ඩායමේ වැඩක්. ඔබතුමා වාඩි වෙන්න. බොහොම ස්තුතියි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට බාධා කරනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ෆොටෝ එක පෙන්න පෙන්න ජනාධිපතිතුමා නියෝජනය කරනවා. එහෙම කරන කොට අමාරුයි. වෙලාව ඉවරයි.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ණයට කහින්නේ නැතිව වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තව කාරණා 25 යි කිව්වේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වෙලාව ඉවරයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

උපරිම ලක්ෂ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත්ම කාරණයක් මේ. උපරිම රුපියල් ලක්ෂ දෙකක වටිනාකමට උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු -

[සභාවේ ඝෝෂා]

මෙන්න කියපුවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වෙලාව ඉවරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මොනවාද මෙතුමා කියන්නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් ඔබතුමාට -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**

Hon. Rodney Rudolph Fraser

අපේ කාලය ගන්නේ. එතුමාට එය සභාගත කරන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට කාලය ඕනෑ නම් අපේ ගරු මන්ත්‍රීතුමාගෙන් කාලය ගන්න වෙයි.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

එතුමාට ඒක කියවන්න අයිතියක් නැද්ද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කථා කරන කථාව ඇහුම්කන් දෙන්න අවස්ථාව ලබා දෙන්නේ නැහැයි කියන වරප්‍රසාදය - ඒක මේ සභාව දැනගනන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පැහැදිලියි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මැතිවරණ වලදී බොරු පොරොන්දු දීලා ඒ පොරොන්දු ඉෂ්ට කරගන්න බැරි වෙලා -

[සභාවේ සෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. අපේ කාලය නාස්ති කරන්න එපා, ඔබතුමන්ලා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා කොහොමද නාස්ති කරනවා කියන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක කොහොමද ඔබතුමා තීරණය කරන්නේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේ මන්ත්‍රීවරුන්ගේ කාලය.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කාලය නාස්ති කලා කියලා මෙතුමා තීරණය කරන්නේ කොහොමද?

[සභාවේ සෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේ රටේ ජනතාවට දීපු පොරොන්දු මේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේකට තමයි -

[සභාවේ සෝෂා]

හැබැයි, තමුන්නාන්සේ මේ වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. අපි දන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු සරත් පතිරණ**

Hon. Sarath Pathirana

මෙන්න පෙනී සිටිය අය. ඒ අය කමක් නැහැ. තමුන්නාන්සේ පෙනී සිටියේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 01.38]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. විනාඩි 07 යි. සභාව කරුණාකර නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට නම් අද තමයි සතුටුම දවස. මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය, ප්‍රණාමය පුද කරනවා. තමන්ගේ ආණ්ඩුව කොහොමද කියලා අද දැන ගන්න ලැබෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අයට. ඉතින් ඒ නිසා මම මතක් කරන්න කැමැතියි. මොකද මේ යෝජනාව ගෙන ඒමත් එක්ක මේ යෝජනාවේ තිබෙනවා මම දැක්කා,

*"අතිගරු ජනාධිපතිතුමාත් ගරු අග්‍රාමාත්‍යතුමාත් එක්ව යහපාලන රජයක් බිහි කරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරන මෙහෙවරට බස්නාහිර පළාත් සභාවේ සිය ස්තුතිය පළ කරනවා"*

කියලා. එහෙම තමයි මේ යෝජනාවේ තිබෙන්නේ. හැබැයි, මම කනගාටු වෙන්නේ කිත්සිරි කහපිටිය ගරු මන්ත්‍රීතුමා බොහොම දුෂ්කර, අපේ කළුතර දිස්ත්‍රික්කයේ බොහොම දුප්පත් ජනතාව ඉන්න ප්‍රදේශයක තමයි ජීවත් වෙන්නේ. ඒ එක්කම මේකට කථා කරපු අපේ සමසමාජ පක්ෂයේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාත් අගලවත්තේ බොහොම දුප්පත් මිනිස්සු ඉන්න පළාතක තමයි ජීවත් වෙන්නේ. හැබැයි, මේ දෙන්නම ගමට යන්නේ නැද්ද කොහේද කියලා තමයි මට පෙනෙන්නේ. ඇයි? මොකද, ගමට යනවා නම් කවදාවක්වත් මේ යෝජනාව දාන්න විධියක් නැහැ. හැබැයි, එහෙම නැති වුණා නම් අපේ අනුරාධ ගරු මන්ත්‍රීතුමා -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගණපූරණය නැහැයි කියලා එතුමා යනවා. එතුමා ඉන්න එපැයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න. ගණපූරණය සෑහීමකට පත් වෙනවා. ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම නැත්නම් මට තේරුණු දේ තමයි අනුරාධ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා දැන් දීර්ඝ කාලයකට ඉස්සෙල්ලා දාපු යෝජනාවක් වෙන්න ඕනෑය කියලා. ඔය දෙකෙන් එකක් වෙන්න ඕනෑ, මේ යෝජනාව අද එන්න හේතුව. ඉතින් පැහැදිලිවම අපි දැකපු දෙයක් තිබුණා. පැහැදිලිවම අද මේ පාලනය පිළිබඳව, අපි හොඳටම දන්නවා මේ පාලනය අරන් දෙන්න මහන්සි වුණේ, එක්සත් ජාතික පක්ෂයත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණත්. ඒ වාගේම අපේ ජාතික හෙළ උරුමය පක්ෂය තමයි ප්‍රධාන වශයෙන්ම මේ යහපාලන ආණ්ඩුව, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ජයග්‍රහණය කරවන්න, ආණ්ඩුව ගෙනෙන්න කටයුතු කළේ. හැබැයි, අද පැහැදිලි වෙනවා. මෙතැන අපේ හෙළ උරුමයේ ගරු මන්ත්‍රීතුමාත්, ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාත්, එක්සත් ජාතික පක්ෂයේ

සමහර මන්ත්‍රීවරුත් කියන දේවලුත් එක්ක අද මේ ආණ්ඩුව කොහේද යන්නේ කියන එක පැහැදිලියි. අද පැහැදිලිවම අපි කියන්න ඕනැ. අද අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා දින 100 වැඩ පිළිවෙළ කියෙව්වා. එක්සත් ජාතික පක්ෂයේ අපේ මන්ත්‍රීතුමන්ලාගෙන් අද අපි අහන්න කැමැතියි. විශේෂයෙන්ම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගෙන්. ඒ වැඩ පිළිවෙළ මේ රටේ ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියලා. ඒකත් එක්කම ගමට ගියාම ගමේ ජනතාව විඳින දුක දන්නවාද කියලා. පැහැදිලිවම අද තමුන්නාන්සේලා දන්නවා. අද අලුත් අවුරුද්දක් එනවා. අලුත් අවුරුද්දේ මිනිස්සු ජීවත් වෙන්න ඕනැ. මේකෙන් ජනතාවට සහන වුණා නම්, ආර්ථිකය නැගිට්ටුවා නම් අද පොල් ගෙඩිය රුපියල් 70 ට 80 ට යන්නේ නැහැ. අද හාල් කිලෝ එක රුපියල් 100 ට, 110 ට යන්නේ නැහැ. අද සීනි කිලෝ එක මේ ගණනට යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එළවළු මිල අඩු වෙලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද එළවළු මිල වැඩි වෙනවා. නැති වෙනවා. අපි කනගාටු වෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගණපූරණය නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු මන්ත්‍රීතුමා, මොනවද මේ කරන වැඩේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගණපූරණය තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගණපූරණය බලන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතැන ගණපූරණයේ ගැටලුවක් නැහැ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගැටලුවක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න.

ගණ පූරණය සම්පූර්ණ නොවන බැවින්, විනාඩි පහකට සභාව කල් තබනවා.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුවනාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 01.57 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***
*Committee counted, and as it was apparent that there was no quorum in the Council the division bells were ordered to be rung.*
*Later, as quorum was not formed the Hon. Deputy Chairman, suspended the sitting temporarily and it resumed at 01.57 p.m. presided over by Hon. Chairman.*

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් ගණපූරණය නැතිව කල් දැම්මාම ඊළඟ දවසට ගන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මගෙන් ඉල්ලීමක් කරන්න. ගණපූරණය නොමැති නිසා මේ යෝජනාව ඊළඟට සභාවට ගන්නය කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව අපි ගෙනාවේ මේ බස්නාහිර පළාත් සභාව ඇතුළත ඉන්න මන්ත්‍රීවරුන් 104 දෙනා නියෝජනය කරන ජනතාවට ඇති වෙලා තිබෙන තත්ත්වයෙන් මුදාගන්න. ඉතින්

මේ ගරු මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා, ජනතාවගෙන් මුදල් හදල් අරගෙන වියහියදම් කරනවා නම්, ජනතාව වෙනුවෙන් සභාවේ ඉන්න. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දැන් ගණපූරණය නැතිව සභාව පවත්වාගෙන යාමට බැරි නම් ඊළඟ සභා වාරයට මෙම යෝජනාව ගෙනෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට ඒක ලිඛිතව ඉල්ලීමක් දෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැවත වාරයක් ඊළඟ සභාවට ගෙනෙන්න කියලා මම ලිඛිතව දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට ලියලා දෙන්න.

# රීති අංක 12 (1) යටතේ සභාව කල් තැබීම

ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 12(1)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව අද දින සභාවේ ගණපූරණය නොමැති නිසා මෙම සභාව කල් තබනවා.

*ඊට අනුකූලව පළාත් සභාව අ.භා. **02.00** ට, 2017 අප්‍රේල් මස **04** වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*Sitting, accordingly adjourned at 02.00 p.m till 9.30 a.m. on 04.04.2017*